# ප්‍රගති වාර්තාව

## අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**2022 - ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**


**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ**

**අමාත්‍යාංශය**

**නො.19, ශ්‍රී සංඝරාජ මාවත**

**කොළඹ 10.**

**www.moj.gov.lk**

# <u>ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය</u>



අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ ප්‍රගති වාර්තාව එළි දැක්වීම වෙනුවෙන් සුභ පැතුම් පණිවිඩයක් එක් කරනුයේ ඉමහත් සතුටිනි. රටක ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිතවීම සඳහා නීතියේ ආධිපත්‍යය තහවුරු වී අධිකරණයේ ස්වාධීනත්වය ස්ථාවරව පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර පසුගිය කාලය තුළ රට තුල උද්ගතවූ ආර්ථික ආර්බුදය හමුවේ විවිධ ආකාරයෙන් පසුබෑමට ලක් වූ මෙරට සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයම ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ යථා තත්වයට පත්වෙමින් පැවතීම සතුටට කරුණකි. මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයද යළිත් ජාත්‍යන්තර ප්‍රජාවගේ මෙන්ම මෙරට ජනතාවගේ විශ්වාසය දිනාගත් විශිෂ්ට ආයතනයක් බවට පත්වෙමින් තිබේ. යල් පැන ගිය නීති යාවත් කාලීන කිරීම සිදු කරමින් වසර 150 කටත් වඩා පැරණි නීති වර්තමාන ලෝකයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට පියවර ගෙන ඇති අතර රට තුළ සිදුවන දූෂණ අක්‍රමිකතා වළක්වමින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමක් කිරීම අරමුණු කර ගනිමින් ඉදිරිපත් කළ 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සම්මත කර ගැනීමට හැකිවීම ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සියලු දෙනා ලැබු ජයග්‍රහණයකි.

රාජ්‍ය යාන්ත්‍රණය තුළ දූෂණ අක්‍රමිකතා සිදු වීම වැළැක්වීම අරමුණු කර ගනිමින් නව දූෂණ විරෝධී පනතක් ගෙන ඒමට කටයුතු කරමින් සිටින අතර මෙරටට ගැළපෙන පරිදි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම සඳහා කටයුතු කරන ලෙස අධිකරණ අමාත්‍යවරයා වශයෙන් පාර්ලිමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. තිස් වසරක් පුරා පැවති යුධමය වාතාවරණය හේතුවෙන් පීඩා විඳි උතුරේ ජනතාවගේ ගැටළු විසඳීම සඳහා මේ වන විටත් ප්‍රමුඛ අවධානයක් යොමුව ඇති අතර ඒ සඳහා උතුරු පළාතම ආවරණය කරමින් ජංගම සේවා පවත්වමින් උතුරේ ජනතාවට පවතින පුරවැසි භාවය ලබා ගැනීම සම්බන්ධ ගැටලු, උප්පැන්න, විවාහ සහ මරණ ලියා පදිංචි කිරීම සම්බන්ධ ගැටළු, ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම හා සංශෝධනය කිරීම, ඉඩම් පිළිබඳව සහ නැවත පදිංචි කිරීම්වලට අදාළ ගැටළු සඳහා විසඳුම් ලබාදීමට පියවර ගෙන ඇත.

යුද්ධයෙන් පසුව උතුරේ මෙන්ම දකුණේ ජනතාවගේ බිඳුනු සිත් එක් කරමින් නැවත එවැනි කුරිරු බිහිසුනු තත්වයන් ඇති නොවීම සඳහා කටයුතු කිරීම සියලු දෙනාගේ වගකීමක් හා යුතුකමක් වේ. ඒ සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහාවන කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය හා හානි පූර්ණය සඳහාවන කාර්යාලය මගින් මේ වන විටත් කටයුතු කරමින් සිටින අතර ජාතීන් අතර සමගිය සාමය සංහිඳියාව වැඩි දියුණු කිරීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාමීය මට්ටමින් වැඩ පිළිවෙළක් හඳුන්වාදීමට කටයුතු කරමින් තිබේ. යුද්ධය හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් වෙනුවෙන් සාධාරණය හා යුක්තිය ඉටු කිරීමට පියවර ගෙන ඇති අතර ඒ යටතේ ලැබී ඇති පැමිණිලි සම්බන්ධ විමර්ශන කඩිනම් කිරීම, ඔවුන් වෙනුවෙන් වන්දි ලබාදීමට හා අතුරුදහන් වූ බවට සහතික ලබාදීමට කටයුතු කර ඇති අතර හානි පූර්ණය සඳහා වන කාර්යාලය මගින් යුදමය ගැටුම් හේතුවෙන් හානි සිදු වූ තැනැත්තන් හා දේපළ වෙනුවෙන් අදාල වන්දි ලබා දීමට කටයුතුකර තිබේ.

මත් ද්‍රව්‍ය භාවිතය මේ වන විට අප රට මුහුණ දී ඇති බරපතල ගැටලුවක් බවට පත්ව ඇති බැවින් එය පාලනය කිරීම සඳහා මත් ද්‍රව්‍ය ගෙන්වීම, බෙදා හැරීම, අලෙවිය හා භාවිතය මර්දනය කිරීම සඳහා නව කාර්ය සාධක බලකායක් පත් කිරීමට කටයුතු කරන අතරම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට නව පනතක් ගෙන ඒම සම්බන්ධයෙන්ද අවධානය යොමුවී ඇත. මත් ද්‍රව්‍ය භාවිතා කරනු ලබන පුද්ගලයින්ගේ සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් බන්ධනාගාරගත වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර ඒ හේතුවෙන්ම බන්ධනාගාර තුළ දැඩි තදබදයක් ඇති වී තිබෙන බැවින් මත් ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම වැඩි කිරීමේ වැඩ පිළිවෙලක් වෙනුවෙන් අවධානය යොමුව ඇත.

අධිකරණ පද්ධතියට යොමුවන ආරවුල් හා ගැටලු අවම කරමින් අධිකරණ ක්‍රියාමාර්ගවලින් තොරව මහ ජනතාවට නීතියේ සහන ලබාදීම සඳහා ස්ථාපිත කර ඇති සමථ මණ්ඩල ක්‍රමය තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇති අතරම රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ ධාරිතාවය වැඩි කරමින් අමාත්‍යාංශයට අයත් අනෙකුත් සියලු ආයතනයන්හි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට පවතින ආර්ථික අර්බුදයන් හමුවේ වුව ද කටයුතු කරමින් සිටින බව සඳහන් කළ යුතුව තිබේ.

ඉතිහාසයේ ශ්‍රී ලංකාව මුහුණ දුන් බරපතලම ආර්ථික අර්බුදය හමුවේ පවතින බාධා මධ්‍යයේ වුව ද අමාත්‍යාංශයේ ඉලක්ක සපුරා ගනිමින් කාර්යක්ෂම ජනතා සේවාවක් සිදු කිරීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු ආයතන ප්‍රධානීන් විසින් ඉටු කරනු ලැබූ සහ ඉටු කරනු ලබන සේවය කෘතවේදීව සිහිපත් කරන අතරම යුක්තිය පසිදලීමේ කාර්යය භාරය වඩාත් විශ්වසනීයව හා ඵලදායීව සිදු කිරීමට සියලු දෙනා ලබා දෙන සහයෝගය අගය කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

ජනාධිපති නීතිඥ, ආචාර්ය විජයදාස රාජපක්ෂ
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය

# ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



රටක අධිකරණ හා බන්ධනාගාර පද්ධතිය යනු එම රටේ සමාජයීය තත්ත්වය මැනිය හැකි මිනුම් දණ්ඩයි. නෙල්සන් මැන්ඩෙලා පවසන පරිදි ‘‘ජාතියක් විනිශ්චය කල යුත්තේ එහි ඉහලම පුරවැසියන්ට සලකන ආකාරයෙන් නොව පහලම පුරවැසියන්ට සලකන ආකාරයෙනි’’. එපරිදි ගුණගරුක, විනයගරුක, නීතිගරුක හා සාධාරණ සමාජයක් ගොඩනැගීම සඳහා අධිකරණය හා බන්ධනාගාර පද්ධතිය ක්‍රියාත්මක විය යුතුය.

ඒ අනුව නීතිය හා ස්වෛරීත්වය ආරක්ෂා වන පරිදි යල්පැන ගිය අධිකරණ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කරමින් අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රමාදයන් වළක්වාලීම සඳහා නවීන තාක්ෂණය ද යොදාගනිමින් අධිකරණ පද්ධතීන් හා ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කර ඇත.

එසේම පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් විධිමත් ආකාරයෙන් සිදු කිරීමටත්, ඒ තුළින් රැඳවියන්ගේ දඬුවම් කාලය අවසන් වී නැවත සමාජයට පිවිසෙන විට වඩාත් යහපත් ගුණධර්මවලින් පිරිපුන්, සමාජයට වැඩදායී මිනිසෙකු ලෙස හැඩගැන්වීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රධානතම කාර්යයකි. මේ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

මේ වනවිට රජයේ භාණ්ඩාගාරයට දැරිමට සිදුවන වැය බර අවම කිරීම සඳහා බන්ධනාගාර වැඩ අංශ වැඩි දියුණු කිරීමට සැලසුම් කරමින් ඇත. මේ මගින් රැඳවියන්ට වෘත්තීය දැනුම ක්‍රමවත්ව ලබා දී, බන්ධනාගාරයෙන් පිටව යන රැඳවියන් වෘත්තීය දැනුම ඇති පුද්ගලයන් බවට පත් කර ඔවුන්ගේ පවුල් සුරක්ෂිත කිරීමේ මූලික සමාජීය මෙහෙවරට අමතරව විශේෂයෙන්ම කෘෂිකර්මාන්තය දියුණු කිරීම තුළ බන්ධනාගාර රැඳවියන්ගේ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනිමටත්, කර්මාන්ත අංශ දියුණු කිරීම මගින් ලැබෙන ආදායම් වලින් වෙනත් අවශ්‍ය වියදම් පියවා ගැනීමටත්, බන්ධනාගාර නිෂ්පාදන විදේශ වෙළඳපොළට විකිණීමේ ඇති හැකියාව සොයා බැලීමටත් කටයුතු කරමින් පවතී.

විශේෂයෙන්ම වෙනත් රටවල දී සිදු කරනු ලබන නිවාස අඩස්සියේ රඳවා තැබීම (House arrest), පොකුරු බන්ධනාගාර (Cluster Prisons) වැනි ක්‍රමවේදයන් හඳුන්වා දීම තුළින් බන්ධනාගාර තදබදයට පිළියම් මෙන්ම වියදම් පාලනයට හැකියාව ඇති බැවින් මේ වනවිට එවැනි ක්‍රමවේද ක්‍රියාවට නැංවීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමුකරමින් පවතී.

තවද දිගු කල් ඇදෙමින් පවතින නඩු විභාග ඉක්මනින් අවසන් කිරීම, බන්ධනාගාර තුළ සිට මෙහෙයවන අපරාධ අවම කිරීම හා බන්ධනාගාරවල ආරක්ෂාව සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම බන්ධනාගාර පරිපාලනයට පහසු කරවන බැවින්, යල්පැන ගිය තාක්ෂණික මෙවලම් හා ක්‍රමවේද යාවත්කාලීන කිරීම ද සිදු කරමින් පවතී. එසේම සිරකරු තදබදය අවම කිරීමේ අරමුණින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇති අතර පොදු සමාව දීමේ සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් ද සකස් කර ඇත.

මීට සමගාමීව ඇරඹූ පුනරුත්ථාපන ක්‍රියාවලිය බන්ධනාගාරගත අයෙකු නැවත බන්ධනාගාරගතවීම වැළැක්වීමේ අරමුණත්, තරුණ පරපුර මත්ද්‍රව්‍ය ඇතුලු නොයෙක් අපරාධ සඳහා බන්ධනාගාර ගතවීම

අවම කිරීමේ අරමුණක් ඇතිව සකස්කල සුවිශේෂී වැඩපිළිවෙලකි. අධිකරණය මඟින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙත යොමුකරන පුනරුත්ථාපනලාභීන්ට මානසික හා කායික වශයෙන් විධිමත් පුනරුත්ථාපනයක් ලබාදීමෙන් පසුව කාලානුරූපී නිසි වෘත්තීය පුහුණුවක් ලබාදීම තුළින් ආර්ථික වශයෙන් ස්ථාවරභාවයක් ඇති කර ගත හැකි, සමාජයට වැඩදායී පුද්ගලයන් බවට පත් කිරීමට කටයුතු කරයි.

එසේම සුළු වරදකරුවන් පුනරුත්ථාපනය කරලීම සඳහා විශාල මෙහෙවරක් සිදුකරන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් සුළු වැරදිකරුවෙකු විශෝධන ක්‍රියාවලියට යොමු කිරීමෙන් ඔහුත්,  ඔහුගේ පවුල සහ ඔහු ජීවත්වන සමාජ පරිසරයත් සුරක්ෂිත කරලීම සඳහා මහඟු පිටුවහලක් සිදුවන  බැවින් මෙම ක්‍රමවේදය තවදුරටත් ජනතාව අතර ප්‍රචලිත කරලීම සඳහා කටයුතු කරමින් සිටී.

ඒ අනුව මෙම භාරදූර කාර්යයන්හි විශාල ප්‍රගතියක් අත් කර ගැනීම උදෙසා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන වෙත මහ පෙන්වන අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාට මාගේ හෘදයාංගම කෘතඥතාවය පල කරන අතර වර්තමානයේ රට තුළ පවත්නා ආර්ථික අර්බුදයට මුහුණ දෙමින් දෙපාර්තමේන්තු සතු මූල්‍ය හා මානව සම්පත් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කරමින් මනා අධීක්ෂණය හා සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරමින් මා වෙත සහයෝගය දක්වන මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය ද, ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලය ද කෘතවේදීව සිහිපත් කරමි.

**නීතිඥ අනුරාධ ජයරත්න**
**අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍ය**

# අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවිඩය



ගෝලීය උන්නතීන්ට හා සමාජ අවශ්‍යතාවන්ට සරිලන පරිදි ජනතා අපේක්ෂාව සහ පුරවැසි අයිතිවාසිකම් වඩාත් හොඳින් ආරක්ෂා වන ලෙස නීති ප්‍රතිසංස්කරණය හා යුක්තිය පසිඳලීම කාර්යක්ෂම කිරීම උදෙසා අධිකරණ ක්ෂේත්‍රයට පහසුකම් සැපයීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීමයි.දිගු කාලයක් මුළුල්ලේ අධිකරණ නඩුවලින් පිරී පවතින අතර නඩුවක් අවසන් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවේ. මෙය රටේ ආර්ථික සංවර්ධනයට සෘණාත්මක බලපෑමක් ඇති කරයි. උක්ත තත්ත්වය මඟහරවා ගනිමින් අධිකරණ ක්ෂේත්‍රය කාර්යක්ෂම කිරීම උදෙසා සංවර්ධනය කර ඇති සැලැස්මට අනුව ඉටුකළ යුතු පහත උපායමාර්ගයන් හඳුනාගෙන ඇත.

- කාලීන අවශ්‍යතාවයන්ට සරිලන සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි නීති ප්‍රතිසංස්කරණය.
- විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම.
- පවතින නඩු ප්‍රමාණයට සහ රටේ ජනගහනයට සරිලන පරිදි ගුණාත්මක භාවයෙන් පිරිපුන් යටිතල පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීම.
- අධිකරණ ක්ෂේත්‍රයට තාක්ෂණය උපරිම අයුරින් යොදා ගැනීම
- යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සහාය දක්වන මෙම අමාත්‍යාංශයේ අනුබද්ධිත ආයතන කාර්යක්ෂම කර ශක්තිමත් කිරීම.

කෙසේ  වුවද රටතුළ උද්ගත වූ වසංගත රෝග තත්ත්වය සහ අයහපත් ආර්ථික තත්ත්වය අනුව ඉහත උපාය මාර්ගයන් සැලසුම් කළ පරිදි අනුගමනය කිරීම සීමා කිරීමට සිදු විය. දේශීය මුදල් උපයෝගී කරගන්නා ව්‍යාපෘති සම්බන්ධයෙන් වියදම් පාලනය කරන ලදි. අධිකරණ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා හැකිතාක් විදේශීය ආධාර සපයන ආයතනවල සහයෝගය ලබා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දරමින් සිටිමි. එසේම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් ක්‍රියාත්මක කරවීම උදෙසා අවශ්‍ය සෑම ආකාරයකම මඟපෙන්වීම් සහ අධීක්ෂණ කටයුතු සිදු කරමින් සිටිමි.

නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මෙම වසර තුල ඓතිහාසික ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය. මෙම වසර තුල ඉතා වැදගත් නීති ප්‍රතිසංස්කරණ 12ක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට හැකිවිය. තවත් නීති ප්‍රතිසංස්කරණ 10ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒවා සම්මත වීමට අසන්නව පවති. ඒ අතර කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නීති යාවත්කාලීන කිරීම, යුක්තිය පසිඳලීම කාර්යක්ෂම කිරීම උදෙසා අධිකරණ ධූරාවලියක් ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරන පූර්ව නඩු විභාග අධිකරණ, කුඩා හිමිකම් අධිකරණ හඳුන්වාදීම, වංචා දූෂණ වැළැක්වීමට අදාළ නීති ප්‍රතිසංස්කරණ ඇතුළත් වේ.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හා ස්වාධීන කොමිෂන් සභා ශක්තිමත් කිරීමට අදාළ ප්‍රතිපාදන ඇතුළත් 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සුවිශේෂී වේ. එසේම අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගත් තවත් වැදගත් නීති ප්‍රතිසංස්කරණ 20ක කටයුතු අවසන් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය සඳහා නීති ප්‍රතිසංස්කරණ 07ක් ඉදිරිපත් කිරීමට නියමිතය

විකල්ප ආරවුල් විසඳීම ශක්තිමත් කිරීම තුළින් අධිකරණ ක්‍රියාවලියට පැමිණීමට පෙර බොහෝ ආරවුල් විසඳාගත හැකි අතර ඒ මගින් අධිකරණ පද්ධතිය තුළ තවදුරටත් නඩු ගොඩගැසීම වළක්වා ගතහැක. සමථ මණ්ඩල තුළ ආරවුල් නිරවුල් කිරීමේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතීම සතුටට කරුණකි. මෙය තවදුරටත් ව්‍යාප්ත කරමින් ඉඩම් ආරවුල් නිරවුල් කිරීමට අවශ්‍ය විශේෂ සමථ මණ්ඩල ස්ථාපිත කිරීමේ නියෝග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලදී. එසේම මූල්‍ය ආරවුල් සම්බන්ධයෙන් විශේෂ සමථ මණ්ඩල පිහිටු වීමටද කටයුතු කරමින් පවතී. නිශ්චල දේපල සම්බන්ධයෙන් ණය ගනුදෙනු වලින් පීඩාවට පත් මහජනතාවට සහන සැලසීම සඳහා ණය සහනදායි මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ශාඛා පිහිටුවීම මගින් කටයුතු විමධ්‍යගත කිරීමට කටයුතු කරන ලදී.

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ඊට අනුෂාංගික ආයතන වල ධාරිතාවය ඉතා තීරණාත්මක වේ. වසරේ මෙම කාලය තුළ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ භාෂා ත්‍රිත්වයෙන්ම කෙටුම්පත් කොට ලබා දී ඇති නීති සංශෝධන ප්‍රමාණය 196කි. අධිකරණවල නඩු ඉක්මණින් විසඳීම සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විශ්ලේෂණ වාර්තා කඩිනමින් ඉදිරිපත් කළයුතු වේ. මෙම වසරේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ලැබුණු ඉල්ලීම් ගණන 30,260ක් වූ අතර 27,569ක් වාර්තා නිකුත් කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් වසරේ මේ දක්වා නඩු ගොනු 7,012ක් අවසන් කර ඇත.

මේ වන විට බන්ධනාගාරවල 24,000 කට වැඩි රැඳවියන් සංඛ්‍යාවක් සිටින අතර බන්ධනාගාර එහි ධාරිතාවයට වඩා පිරී පැවතීම කළමනාකරණය කිරීම උදෙසා ගත හැකි සියළු ක්‍රියාමාර්ග ගෙන ඇත. ප්‍රජා විශෝධක ආඥා ලබා ගැනීම මෙයට එක් විසඳුමක් වන අතර මෙම වසරේ ලබා ගත් ආඥා සංඛ්‍යාව 5,321 කි.

සෑම කෙනෙකුටම නීතියේ ප්‍රවේශය සඳහා පහසුකම් සැලැසීම නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව විශාල කාර්යභාරයක් ඉටු කරන අතර වසරේ මේ දක්වා පුරවැසියන් 136,224 දෙනෙකුට දිවයින පුරා පිහිටි නීති ආධාර මධ්‍යස්ථානවල සේවය ලබා දී ඇත.

පවතින අභියෝගාත්මක අවස්ථාවේ වුව ද අධිකරණ අමාත්‍යාංශයේ සහ ඊට අනුබද්ධිත ආයතන විසින් මෙවන් ප්‍රගතියක් අත්කරගෙන සිටීම සතුටට කරුණකි. මෙම අසීරු අවස්ථාවේ වුවද අධිකරණ ක්ෂේත්‍රය බාධාවකින් තොරව පවත්වා ගෙන යෑම උදෙසා ගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ අමාත්‍ය මණ්ඩලය ලබාදෙන සහයට කෘතඥතාවය පළකරමි. එසේම අමාත්‍යාංශයේ කටයුතු වෙනුවෙන් ගරු කැබිනට් අමාත්‍ය ජනාධිපති නීතිඥ විජේදාස රාජපක්ෂ මැතිතුමන් ලබාදෙන නායකත්වය හා මඟපෙන්වීම කෘතවේදීව සිහිපත් කරමි. එසේම අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව, ගරු රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමාගෙන් ලැබෙන සහයෝගය අගය කොට සලකමි. එසේම අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සහ අමාත්‍යාංශයට සහසම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතනවල ප්‍රධානීන් ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය දක්වන සහයෝගය සම්බන්ධයෙන් මාගේ කෘතඥතාවය පිරිනමමි.

වසන්තා පෙරේරා
ලේකම්.
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### දැක්ම

යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රමයක් ස්ථාපිත කිරීම සහ ගෝලීය උන්නතීන්ට හා ජනතා අපේක්ෂාවන්ට සරිලන පරිදි සමාජීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් නීති ප්‍රතිසංස්කරණය කිරීම;

### මෙහෙවර

- කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිඳලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
- පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කිරීම;

# පටුන

පිටු අංකය


1. හැඳින්වීම 01
2. අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ කාර්යයන් සංක්ෂිප්තව 03
3. අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ ප්‍රගතිය
   - 3.1 නීති අංශය 06
   - 3.2 ආයතන අංශය 20
   - 3.3 සැලසුම් අංශය 23
   - 3.4 සංවර්ධන අංශය 31
   - 3.5 ඉංජිනේරු ඒකකය 39
   - 3.6 ප්‍රතිසංස්කරණ අංශය 49
   - 3.7 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය 61
   - 3.8 ජාතික ඒකාබද්ධතා අංශය 65
   - 3.9 මූල්‍ය අංශය 71
   - 3.10 අභ්‍යන්තර විගණන අංශය 75

4. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන
   - 4.1 නීතිපති දෙපාර්තමේන්තුව 76
   - 4.2 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව 79
   - 4.3 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව 83
   - 4.4 රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව 85
   - 4.5 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව 87
   - 4.6 බන්ධනාගාර දෙපාර්තමේන්තුව 91
   - 4.7 ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව 97
   - 4.8 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය 100
   - 4.9 සමථ මණ්ඩල කොමිෂන් සභාව 105
   - 4.10 කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය 109
   - 4.11 අධිකරණ නොවන නිලධාරීන් සඳහා පුහුණු ආයතනය 111

**5.** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය ආයතන
   - 5.1 නීති ආධාර කොමිෂන් සභාව 114
   - 5.2 උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය 118
   - 5.3 ශ්‍රී ලංකා විනිශ්වයකාරවරුන්ගේ ආයතනය 121
   - 5.4 අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 124
   - 5.5 ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය 128
   - 5.6 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 134
   - 5.7 හානිපූර්ණ කාර්යාලය 136

6. අධිකරණ
   - 6.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය 140
   - 6.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය **142**

7. අනුබද්ධිත ආයතන
   - 7.1 නීති විද්‍යාලය 145

## 01. හැඳින්වීම

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් කලින් කලට අමාත්‍යාංශ වෙත විෂය පැවරීම සංශෝධනයත් සමඟ වෙනස් වන අතර පොදුවේ පහත කාර්යයන් මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

- යුක්තිය පසිඳලීම, පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාළවන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැය ගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් වෙනත් කිසිඳු ආයතනයක් වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු.
- සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදුකිරීම.
- උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුළුව සමස්ථ පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව කාර්යක්ෂමව ඉටුකිරීම.
- රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු.
- රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම.
- නීති කෙටුම්පත් කිරීම.
- යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, එම දඬුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- සමස්ථ ක්වාසි පද්ධතියේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- කම්කරු විනිශ්චය සභා පරිපාලනයට සහ ඊට අදාළ අනෙකුත් කටයුතු.
- නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම.
- නීති ශබ්ද මාලා පිළියෙල කිරීම.
- ශ්‍රී ලංකා නීති වාර්තා පලකිරීම.
- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට අදාළ සියළුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- 2000 අංක 44 ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතට අදාල කටයුතු
- රට තුළ ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානයත් කල්පවත්නා සාමයත් ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
- බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය

- ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන අධීක්ෂණය සහ එම ආයතනවලට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ සහ ඊට සහසම්බන්ධව පහත ආයතන ක්‍රියාත්මක වේ.

1. නීතිපති දෙපාර්තමේන්තුව
2. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
3. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
4. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
5. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය
6. ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
7. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
8. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
9. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය
10. සමථ මණ්ඩල කොමිෂන් සභාව
11. කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය
12. කාති උසාවි හා අභියාචන මණ්ඩල
13. අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය
14. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
15. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
16. ශ්‍රී ලංකා  විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
17. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
18. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය
19. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
20. හානිපූර්ණ කාර්යාලය
21. නීති අධ්‍යාපන සභාව

## 02. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ කාර්යයන් සංක්ෂිප්තව

අමාත්‍යාංශයේ කාර්යයන් පහත අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,

i. නීති අංශය
ii. ආයතන අංශය
iii. සැලසුම් අංශය
iv. සංවර්ධන අංශය
v. ඉංජිනේරු අංශය
vi. ප්‍රතිසංස්කරණ අංශය
vii. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය
viii. ජාතික ඒකාබද්ධතා අංශය
ix. මූල්‍ය අංශය
x. අභ්‍යන්තර විගණන අංශය

**i. නීති අංශය**

යුක්තිය පසිඳලීමට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව දැනට පවත්නා නීති සංශෝධනය හා නව නීති සම්පාදනය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීමට කටයුතු කිරීම, නීති වාර්තා පල කිරීම සහ පරිවර්තනය කිරීම.

**ii. ආයතන අංශය**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් හැර අධිකරණ වල අනිකුත් සියලුම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පරිපාලන කටයුතු කිරීම.

**iii. සැලසුම් අංශය**

සැලසුම් ඒකකය මගින් අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රගති පාලනය සහ සුපරීක්ෂණය සිදුකරයි

**iv. සංවර්ධන අංශය**

සංවර්ධන ඒකකය මගින් අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි සංවර්ධන කාර්යයන් ඉටු කිරිම හා සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.

**v. ඉංජිනේරු ඒකකය**

ඉංජිනේරු අංශය මගින් අධිකරණ සංකීර්ණ, ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම සිදු කරනු ලැබේ.

**vi. ප්‍රතිසංස්කරණ අංශය**

අධිකරණ අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සහ ආයතනවල ක්‍රියාවලීන් හා පද්ධතීන් තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් කාර්යක්ෂම හා ඵලදායි ලෙද ප්‍රතිසංස්කරණය කිරීම

**vii** **බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය**

බන්ධනාගාර කටයුතු අංශය මගින් බන්ධනාගාර පරිපාලනය පුළුල් ප්‍රතිසංස්කරණයකට ලක්කොට බන්ධනාගාර නිලධාරීන්ගේ වෘත්තීය ගැටළු විසඳමින් සිරගත වූ අය නිදහස් වන විට යහපත් පුරවැසියන් ලෙස සමාජයට අනුගත කිරීමේ අරමුණින් පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් විධිමත් ආකාරයට සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම සිදුකරයි

**viii.** **ජාතික ඒකාබද්ධතා අංශය**

ජාතීන් අතර සහයෝගිතාවය සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම සහ ජාතීන් අතර සංස්කෘතික, සමාජීය හා ආගමික පසුබිම අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ශ්‍රී ලාංකේය සමාජයේ ජීවත්වන සියලු ජනවර්ග සහ ජන කණ්ඩායම්වල උරුමයන්, අනන්‍යතාවයන් සහ සංස්කෘතීන් ආරක්ෂා කරමින් වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලබයි.

**ix.** **මූල්‍ය අංශය**

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල මූල්‍ය සැලසුම් කළමනාකරණය සහ පාලනය.

**xi.** **අභ්‍යන්තර විගණන අංශය**

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල ගිණුම් විගණනය

## 03. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි ප්‍රගතිය

## 3.1 නීති අංශය

### 3.1.1 නීති ප්‍රතිසංස්කරණ

**අ) පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද අණපනත්**

| පනතේ නම | අරමුණ | කතානායකවරයා සහතික කළ දිනය |
|---|---|---|
| 2022 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | මහාධිකරණ වල පැවැත්වීමට නියමිත පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ හඳුන්වාදීම සහ ඊට ආනුශංගික වන කරුණු | 2022.02.17 |
| 2022 අංක 03 දරන පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීමේ පනත | පුද්ගල නාශක බිම්බෝම්බ භාවිතය, ගබඩා කිරීම, නිෂ්පාදනය සහ හුවමාරු කිරීම තහනම් කිරීම පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලසීම; සහ ඊට සම්බන්ධ හෝ ආනුශංගික වන කාරණා සඳහා විධිවිධාන සැලසීම. | 2022.02.17 |
| 2022 අංක 04 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත | මහාධිකරණවල පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ සඳහා වාර්තාධිකාරී විනිසුරුවරයෙකු පත් කිරීම පිණිස විධිවිධාන සැලසීම සඳහා පනතේ 5 ඇ වගන්තිය සංශෝධනය කිරීම. | 2022.02.17 |
| 2022 අංක 05 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | පැහැර හැරීම සම්බන්ධයෙන් වාර්තාගත කරන ලද නඩු තීන්දුව අවලංගු කරනු ලබන හෝ අවලංගු කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන ආඥාව සමඟ එම ආඥාව කරනු ලබන්නේ යම් සිද්ධි විනිශ්චය කරමින් ද එම සිද්ධි සහ එම ආඥාව කරනු ලැබීමට පදනම් වූ හේතු ද නිශ්චිතව දක්වනු ලැබිය යුතු බව නියම කිරීම සඳහා 88(2) වගන්තිය සංශෝධනය කරන ලදී. | 2022.02.17 |
| 2022 අංක 17 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | අන්තිම කැමති පත්‍රයක් හැර, බැලූ බැල්මට නිසි පරිදි ලියා අත්සන් කරනු ලැබ ඇති බවට පෙනී යන සහ සහතික කිරීම සඳහා නීතිය මඟින් නියම කරනු ලැබ ඇති යම් ඔප්පුවක් හෝ ලේඛනයක් සාමාන්‍ය කාර්ය පටිපාටිය යටතේ ගොනු කරන ලද නඩුවක උත්තරවාදවල හෝ වැඩිදුර උත්තරවාදවල එම ඔප්පුවේ හෝ ලේඛනයේ ලියා අත්සන් කිරීම හෝ නිර්වාජ්‍යභාවය අභියෝගයට ලක්කරනු ලැබ ඇත්නම් සහ විසඳිය යුතු ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස; හෝ අධිකරණයට එවැනි ඔප්පු කිරීමක් අවශ්‍ය වුවහොත් මිස එවැනි යම් ඔප්පුවක් හෝ ලේඛනයක් ලියා අත්සන් කිරීම හෝ නිර්වාජ්‍යභාවය පිළිබඳ විධිමත් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතුය. | 2022.06.23 |

| | | |
|---|---|---|
| 2022 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | අදාළ නඩුවේ පැමිණිලිකරු සහ සෑම චූදිත තැනැත්තකුම වෙත එම නඩු තීන්දුවේ හෝ නඩු වාර්තාවේ අවසාන ආඥාවේ එක් සහතික කළ පිටපතක් බැගින් ගාස්තු අයකිරීමකින් තොරව ලබාදෙනු ලැබිය යුතු අතර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන ගාස්තුවක් ඒ සඳහා ගෙවීමෙන් පසුව මෙම පිටපත ලබාදෙනු ලැබිය යුතුය. | 2022.06.23 |
| අන්තිම කැමති පත්‍ර ආඥාපනත සඳහා සංශෝධන | දේපළ යන්නට සහාධිපත්‍ය දේපළ සහ ඕනෑම ඉඩම් කොටසක් ඇතුළත් කිරීම් මඟින් අර්ථය ව්‍යාප්ත කිරීම | 2022.10.19 |
| ඇටෝර්නි බලය ආඥාපනත සඳහා සංශෝධන | ඇටෝර්නි බලය ලියාපදිංචි කිරීම අනිවාර්ය කර ඇත. ඇටෝර්නි බලය අවලංගුවන කාල පරිච්ඡේදය නිශ්චිතව දක්වා ඇති අතර එය අවලංගු කිරීම සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා ක්‍රියාපටිපාටිය හඳුන්වා දීම. | 2022.10.19 |
| වංචා වැළැක්වීමේ ආඥාපනත සඳහා සංශෝධන | මෙය නොතාරිස් ආඥාපනත සහ අන්තිම කැමති පත්‍ර ආඥාපනත සඳහා වන ආනුෂංගික සංශෝධනයකි. නොතාරිස්වරයෙකු නොමැතිව සාක්ෂිකරුවන් 5 දෙනෙකු විසින් අන්තිම කැමති පත්‍රයක් ලියා අත්සන් කිරීම මඟින් එය අහෝසි වේ. | 2022.10.19 |
| නොතාරිස් ආඥාපනත සඳහා සංශෝධන | ලියවිල්ලට අත්සන් තබන සියලුම පාර්ශව විසින් ඔවුන්ගේ ඇඟිලි සලකුණු ඊට ඇතුළත් කළ යුතු අතර පනත යටතේ පනවා ඇති දඩ මුදල ඉහළ නැංවිය යුතුය | 2022.10.19 |
| ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සඳහා සංශෝධන | ඉඩමට බලපාන සාධන පත්‍රයක් ඉදිරිපත් කරන අවස්ථාවක, කේවියට් තහනමක් ගොනුකළ හැකි තැනැත්තන් සීමාකිරීම සහ සැලසුම් කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නම සහ ලිපිනයන් ලබාදී ඇති පාර්ශවයන් ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය. | 2022.10.19 |
| 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය | අනෙකුත් කරුණු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත හඳුන්වාදීම, ස්වාධීන කොමිෂන් සභාවල ස්වාධීන බව තහවුරු කිරීම සහ ඒවා ශක්තිමත් කිරීම, විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව නැවත හඳුන්වාදීම සඳහා සංශෝධන කිහිපයක් හඳුන්වාදීම. | 2022.10.31 |

ආ) **<u>පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති සහ සම්මත කිරීමට නියමිත පනත්</u>**

| පනත | අරමුණ | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත (බාලවයස්කරුවන් සම්බන්ධයෙන් මරණ දණ්ඩනය) | යම් තැනැත්තකු වරද සිදු කරන අවස්ථාවේ දී වයස අවුරුදු 18 ට අඩු බව අධිකරණයේ මතය වන්නේ නම් එකී තැනැත්තාට එරෙහිව මරණ දණ්ඩනය නියම කිරීම හෝ වාර්තා කිරීම නොකළ යුතු බවට ප්‍රකාශිත විධිවිධාන හඳුන්වාදීම මඟින් අර්ථව්‍යාකූලත්වය ඉවත් කර පනතේ 281 වගන්තිය සංශෝධනය කිරීම. | 2022.07.06 දින පැවති පාර්ලිමේන්තු අමාත්‍ය මණ්ඩල උපදේශන කමිටු රැස්වීම. |

| | | |
|---|---|---|
| ළමුන් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත සඳහා සංශෝධන | වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු ළමයෙකු වශයෙන් අර්ථ නිරූපණය කිරීම හඳුන්වාදීම (ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය) සහ පිළිවෙලින් වයස අවුරුදු 15ට එළඹ නොමැති සහ වයස අවුරුදු 15 ට එළැඹී එහෙත් වයස අවුරුදු 18 සම්පූර්ණ කර නොමැති ළමුන් සඳහා අනුමත හෝ සහතික ලත් පාසැල්වල ප්‍රාථමික අංශයක් සහ ද්විතියික අංශයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීම | 2022.09.22 දින පැවති පාර්ලිමේන්තු අමාත්‍ය මණ්ඩල උපදේශක කමිටු රැස්වීම. |
| අන්තරාදායක සත්ව ආඥාපනත සඳහා සංශෝධන | අන්තරාදායක සත්ව ආඥාපනතේ ඇතැම් විධිවිධාන සංශෝධනය කිරීම , අන්තරායකර සතුන් විනාශ කිරීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීම සහ බැඳුම්කර වශයෙන් සඳහන් කර ඇති මුදල ඉහල නැංවීම | -එම- |
| කුඩා හිමිකම් අධිකරණ පනත් කෙටුම්පත | රුපියල් මිලියන 1.5 ට වඩා අඩු වටිනාකමක් සහිත ආරවුල් පිළිබඳව සළකා බැලීම, සීමිත කාලරාමුවක් සහිත ක්‍රියා පටිපාටි හඳුන්වා දීම සහ ගැටලු නිරාකරණය කිරීම සඳහා පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම පිණිස විශේෂ ක්‍රියාපටිපාටි සහිතව විශේෂ අධිකරණ හඳුන්වාදීම | -එම- |
| අධිකරණ සංවිධාන පනත සඳහා සංශෝධන | විශේෂිත කුඩා හිමිකම් අධිකරණ පිහිටුවීම සහ ඊට ආනුෂංගික වන අනෙකුත් සංශෝධන සඳහා විධිවිධාන සැලසීම | -එම- |
| සිවිල් නඩුවිධාන සංග්‍රහය සඳහා සංශෝධන (101 වන අධිකාරය)( LXVI පරිච්ජේදය අවලංගු කිරීම) | වෙනම විශේෂිත නීතියක් වශයෙන් කුඩා හිමිකම් අධිකරණ සම්බන්ධ විධිවිධාන ඇතුළත් සිවිල් නඩු විධාන සංග්‍රහයේ LXVI පරිච්ජේදය අවලංගු කිරීම ,කුඩා හිමිකම් අධිකරණ සඳහා අදාළ ක්‍රියාපටිපාටිය බලාත්මක කිරීමට නියමිතය.. | -එම- |
| 1990 අංක 10 දරන මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සඳහා සංශෝධන | යම් පළාතක් ඇතුළත කුඩා හිමිකම් අධිකරණ මඟින් ප්‍රකාශයට පත්කරන නඩුතීන්දු , තීන්දු ප්‍රකාශ සහ නියෝග සම්බන්ධයෙන් එකී පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154පී ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කරන ලද මහාධිකරණවල අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය හඳුනාගැනීම සහ එවැනි යම් කුඩා හිමිකම් අධිකරණ මඟින් සිදුකරනු ලැබිය හැකි සිද්ධිමය හෝ නීතිමය වශයෙන් සිදුවන සියලුම වැරදි නිවැරදි කිරීම සඳහා අභියාචනා අධිකරණ බලය හඳුනාගැනීම | -එම- |
| විෂ වර්ග අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සඳහා සංශෝධන | ඇප පිළිබඳ විධිවිධාන, එකී පනතේ III වන උපලේඛනයේ II කාණ්ඩයේ I වන කොටසට හා II වන කොටසට ඇතුළත් මූලද්‍රව්‍ය විනාශ කිරීම, රඳවා ගැනීමේ කාලය පිළිබඳ නව විධිවිධාන හඳුන්වා දීම, ඇබ්බැහිවීම් වැළැක්වීම සහ පුනරුත්ථාපනය සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම පිණිස ස්වේච්චාවෙන් ඇතුළත් කරගැනීම , වයස අවු. 18 ට අඩු තරුණ වරදකරුවන් පරිවාසයට යටත් කිරීම , රජයේ රස | ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පනත් කෙටුම්පත අභියෝගයට ලක්කොට ඇත. |

| | | |
|---|---|---|
| | පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂිමය වටිනාකම ලබාදීම, දළ බර ග්‍රෑම් 2 හෝ ඊට වඩා අඩු මූලද්‍රව්‍යවල ප්‍රමාණාත්මක බර සඳහා සිද්ධිමය වටිනාකම | |
| පුනරුත්ථාපන කාර්යාංශය පිහිටුවීම සඳහා පනත් කෙටුම්පත | හිටපු සටන්කාමීන්,දරුණු ප්‍රචණ්ඩකාරී කණ්ඩායම්වල සාමාජිකයන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් කළමනාකරණය සහ පුනරුත්ථාපනය හා ප්‍රතිකාර කිරීම සඳහා පුනරුත්ථාපන කාර්යාංශය පිහිටුවීම සහ පුනරුත්ථාපන ජෙනරාල් කාර්යාලය පිහිටුවීම නියාමනය කිරීම | ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පනත් කෙටුම්පත අභියෝගයට ලක්කොට ඇත |
| උඩරට විවාහ සහ දික්කසාද පනත | විවාහය සඳහා අවම වයස අවුරුදු 18 ක් විය යුතු බව සහ බාල වයස්කරුවකුගේ විවාහය සඳහා දෙමව්පිය කැමැත්ත අවශ්‍ය වන උඩරට විවාහ සහ දික්කසාද පනතේ II වන කොටස අවලංගු කිරීම | දැනටමත් සකස් කර ඇත. |

**ඇ) <u>අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලැබී ඇති, දැනට අවසන් වශයෙන් සකස් කොට ඇති පනත්.</u>**

| පනත | අරමුණ | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| ළමා ආරක්ෂාව සහ යුක්තිය පිළිබඳ පනත් කෙටුම්පත | අධිකරණ ක්‍රියාවලියේදී දරුවාගේ වැඩිම යහපත තහවුරු කිරීම සහ නීතිය සමඟ සම්බන්ධ වීමේදී දරුවන් සම්බන්ධයෙන් අදාළ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලවීම | පරිවාස නිලධාරීන් වෙතින් වාර්තාවක් කැඳවා ඇත. |
| අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නව නීතියක් හඳුන්වාදීම | අධිකරණයට අපහාස කිරීමේ වරද පැහැදිලිව නිශ්චය කිරීම සහ වරද සිදුකළ විට අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සහ අධිකරණය ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවකට යටත් වන බව සහතික කිරීම | මෙම අමාත්‍යාංශයේ නිරීක්ෂණ ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙතින් සංශෝධිත පනත් කෙටුම්පත ලැබෙන තෙක් අපේක්ෂාවෙන් සිටියි. |
| අපරාධ නඩුවිධාන සංග්‍රහය පනත (323 (5) වගන්තිය සංශෝධනය කිරීම | අභියාචනා සම්බන්ධයෙන්, සිරගතව සිටින කාලය දණ්ඩනයේ කොටසක් වශයෙන් සලකා බැලීම | නීති කෙටුම්පත් සම්පාදක වෙතින් මූලික කෙටුම්පත් අපේක්ෂාවෙන් සිටියි. |
| දූෂණ විරෝධී පනත් කෙටුම්පත | අල්ලස හා දූෂණය අවම කිරීම සඳහා ශක්තිමත් නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම පිණිස නව නීතියක් හඳුන්වාදීම | නීතිය සකස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස කමිටුවක් පත් කෙරේ. |
| අපරාධ වලින් ලත් මුදල් පනත් කෙටුම්පත | අපරාධ ක්‍රියාකාරකම්වලින් ප්‍රතිලාභ ලබාගැනීම තහනම් කිරීම, ඒවා වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම , අපරාධවලින් ලත් මුදල් අයකර ගැනීම සඳහා අපරාධ ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගැනීම වැළැක්වීම | නීති කෙටුම්පත් සම්පාදක වෙතින් අවසන් කෙටුම්පත අපේක්ෂාවෙන් සිටියි. |

| | | |
|---|---|---|
| වෛවාහක හේතු පනත (පවුල් නීති පනත) | විවාහය අවලංගු කිරීම, විවාහය විසුරුවා හැරීම සහ විවාහයේ පාර්ශවකරුවන් නෛතික වශයෙන් වෙන්කිරීම සම්බන්ධ නීතිය හා ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම | නීති කෙටුම්පත් සම්පාදක වෙතින් සංශෝධිත කෙටුම්පත අපේක්ෂාවෙන් සිටියි. |
| විදේශීය දික්කසාද පිළිගැනීම | විදේශීය දික්කසාද පිළිගැනීම, විවාහ අවලංගු කිරීම හෝ විවාහයේ පාර්ශවකරුවන් නෛතික වශයෙන් වෙන්කිරීම සඳහා විධිවිධාන සැලසීම | ගරු නීතිපතිවරයා වෙතින් ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය අපේක්ෂාවෙන් සිටියි. |
| සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා සංශෝධන (101 අධිකාරය) (පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණ) | ප්‍රධාන ප්‍රඥප්තියේ XA පරිච්ඡේද අවලංගු කර නව පරිච්ඡේද ප්‍රතිස්ථාපනය කිරීම (සිවිල් නීති කෘත්‍යයන්හී පූර්ව නඩු විභාග අවස්ථාව) සහ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ හඳුන්වාදීම | ගරු නීතිපතිවරයා වෙතින් ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය අපේක්ෂාවෙන් සිටියි. |
| සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා සංශෝධන (101 වන අධිකාරය) (VIII වන පරිච්ඡේදය - සිතාසි නිකුත් කිරීම සහ භාරකිරීම) | අණපත්‍රය පාර්ශවකරුවන්ගේ සහ ලේඛනගත නීතිඥවරයාගේ ලියාපදිංචි ලිපිනයට / ජංගම දුරකථන අංකයට සහ ඊමේල් ලිපිනයට යැවීම, ඇමතුම් විස්තර වෙනස් කිරීම පිළිබඳව දැනුම්දීම, කුරියර් සේවාවක් හෝ ඊමේල් මඟින් සිතාසි බාරකිරීම පිළිගැනීම, තැනැත්තන් හඳුනාගැනීමේ සාක්ෂියක් ලෙස ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය ඇතුළත් කිරීම, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත පදිංචි තැනැත්තන් විසින් පෙරකලාසිය අත්සන් තැබීමේ යාන්ත්‍රණය , ඇස්කීසි ක්‍රියාකරවන්නාගේ කාර්යභාරය , ඊමේල් මඟින් සිතාසි යැවීම තහවුරු කිරීම, බන්ධනාගාර කාර්යභාර නිලධාරිවරයාගේ වගකීමට යටත් නොවූ විෂයන් සම්බන්ධයෙන් යෝජිත සංශෝධන | නීති කෙටුම්පත් සම්පාදක වෙතින් අවසන් කෙටුම්පත අපේක්ෂාවෙන් සිටියි |
| ණය සහනදායක මණ්ඩලීය ආඥාපනත සඳහා සංශෝධන | ණය සහනදායක මණ්ඩලවල අනුකූලතාවන් සංශෝධනය කිරීම සහ ණය සහනදායක මණ්ඩලය වෙත ඉල්ලීම් ලැබීමෙන් අනතුරුව කළයුතු ක්‍රියාමාර්ගය | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත සලකා බලමින් පවතී. |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන්ට (ප්‍රතිකාර කිරීම සහ පුනරුත්ථාපනය කිරීමේ) පනත සඳහා සංශෝධන | දැනට පවතින ක්‍රියාපටිපාටිය වැඩි දියුණු කිරීම සඳහා නීතිය සංශෝධනය කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ප්‍රතිචාර ලැබෙන තෙක් අපේක්ෂාවෙන් සිටියි. |
| නව බේරුම්කිරීමේ පනත | දැනට පවතින බේරුම්කිරීමේ පනත අවලංගු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් අවසන් කෙටුම්පත් එවීමට නියමිතයි. |

| | | |
|---|---|---|
| ආයෝජන ආරවුල් මහාධිකරණ පනත | රුපියල් මිලියන 100 ක හෝ ඊට වැඩි මූලික ආයෝජනයකින් පැන නැගුණු හෝ රුපියල් මිලියන 50 ක ආරම්භක වටිනාකමක් සහිත ආරවුල් අසා නිශ්චය කිරීම සඳහා අධිකරණ බලය ප්‍රදානය කෙරෙන ආයෝජන ආරවුල් මහාධිකරණ පිහිටුවීම | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් මූලික කෙටුම්පත් එවීමට නියමිතයි. |
| 2003 අංක 21 දරන සමථකරණ (විශේෂ වර්ගවල ආරවුල්) පනත සඳහා සංශෝධන | දැනට පවතින ක්‍රියා පටිපාටිය වැඩි දියුණු කිරීම සඳහා නීතිය සංශෝධනය කිරීම | සමථ මණ්ඩල පනත සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. |
| දණ්ඩ නීති සංග්‍රහය සඳහා සංශෝධන | "දූෂණය" යන වරද ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පොදු බව | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් සංශෝධිත පනත් කෙටුම්පත එවීමට නියමිතයි. |
| අපරාධ නඩු විධාන සංග්‍රහය සහ අධිකරණ සංවිධාන පනත (ව්‍යවස්ථාපිත දූෂණය) සඳහා සංශෝධන | ස්ත්‍රී පුරුෂ මධ්‍යස්ථභාවය හඳුන්වාදීම සහ අවම අනිවාර්ය දඬුවම් ඉවත් කිරීම | නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙතින් සංශෝධිත පනත් කෙටුම්පත ලැබීමට නියමිතයි |
| සිවිල් නඩුවිධාන සංග්‍රහය සඳහා සංශෝධන (167 වන වගන්තිය - ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය හරහා දේශීය සහ විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීම | සාක්ෂිකරුවකුගේ සාක්ෂි විවෘත අධිකරණයේදී වාචිකව ලබාගත යුතු බව සම්බන්ධයෙන් 167A සිට 167M වගන්තිය දක්වා අංකනය කොට නව විධිවිධාන ඇතුළත් කිරීම | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් සංශෝධිත පනත් කෙටුම්පත ලැබීමට නියමිතයි |
| ප්‍රජාපාදක විශෝධන පනත සඳහා සංශෝධන | මෙම සංශෝධන මඟින් වසර 2 කට වඩා අඩු සිර දඬුවම් ලැබූ සිරකරුවන් සහ නීති ගරුක පුරවැසියන් කිරීමේ අභිප්‍රායන් ප්‍රජා විශෝධන නියෝග සඳහා සුලු දඩමුදල් නොගෙවීම මත සිරගත වී සිටින තැනැත්තන් සඳහා සංශෝධන හඳුන්වා දීම | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් සංශෝධිත පනත් කෙටුම්පත ලැබීමට නියමිතයි<br>. |
| බෙදුම් නීතිය සඳහා සංශෝධන | බෙදුම් නීතිය සම්බන්ධයෙන් අදාළ වන සමහර විධිවිධාන සහ ක්‍රියා පටිපාටි යල්පැන ගොස් ඇති අතර අනවශ්‍ය සංකූලතා ඇති කරයි. එමඟින් බෙදුම් නඩු බැහැර කිරීම ප්‍රමාද වේ. | නීතිපති තුමා විසින් ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ සහතිකය නිකුත් කිරීමට නියමිතය. |
| බදු පදනම මත ලබා දී ඇති පරිශ්‍රයන්ගේ සන්තකය නැවත ලබාගැනීමේ (විශේෂ විධිවිධාන) පනත | නිත්‍ය ක්‍රියාපටිපාටිය යටතේ සාමාන්‍ය කුලී සහ නෙරපීම් ක්‍රියාමාර්ග වලදී නීති ප්‍රමාදය වැළැක්වීම සහ ඉතා කෙටි කාලයක් තුළ බදු දීමනාකරු වෙත සහන ප්‍රදානය කිරීම | නීතිපති තුමා විසින් ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ සහතිකය නිකුත් කිරීමට නියමිතය |

| | | |
|---|---|---|
| අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ සහාය සැලසීමේ පනත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව නීති පද්ධතිය | අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් සකස් කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සුදුසු අන්තර්ජාතික සම්මතයන්, හොඳම පරිචයන් සහ ප්‍රමිතීන් ආදිය බලාත්මක කිරීම සඳහා විධිවිධාන සැලසීම | නීතිපතිවරයාගේ නිරීක්ෂණ කාරක සභාවට ඉදිරිපත් කළ යුතු අතර යෝජිත සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත යවනු ඇත. |

ඇ) <u>අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්ති අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සඳහා</u>

| මාතෘකාව | අරමුණ | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| බන්ධනාගාර පරිපාලන පනත | 1877 බන්ධනාගාර ආඥාපනත පනවන ලද අතර, වසර ගණනාවක් මුලුල්ලේ බන්ධනාගාර පරිපාලනය තුළ බොහෝ අඩුපාඩු ගණනාවක් එම ආඥාපනතේ හමුවී ඇත. එකී ගැටලු නිරාකරණය කරගැනීමට සහ ජාත්‍යාන්තර ප්‍රමිතීන් සහ හොඳම භාවිතාවන් සපුරාලීම පිණිස නව බන්ධනාගාර පනතක් ගෙන ඒමට යෝජනා විය. | නීති කෙටුම්පත් සම්පාදකවරයා මඟින් කෙටුම්පත සංස්ථාපනය කරගැනීම පිණිස ඒ සඳහා බන්ධනාගාගර කොමසාරිස් ජනරාල්වරයාගේ නිරීක්ෂණ සහ නිර්දේශ අපේක්ෂාවෙන් සිටියි. |
| පොදු ප්‍රවාහනයේ සිදුවන ලිංගික හිරිහැර | කාන්තාවන්ට සහ ළමයින්ට සහ වෙනයම් පුද්ගලයින්ට පොදු ප්‍රවාහනයේදී ලිංගික හිරිහැර කරන වැරදිකරුවන්ට දඬුවම් කිරීම | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යවරයාගේ අත්සන සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය සූදානම් කර ඇත. |
| 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම. | සමථ කොමිෂන් සභාව පත්කිරීම සහ අනෙක් තවත් සංශෝධන සිදුකිරීම හා සම්බන්ධ ප්‍රතිපාදන සංශෝධනය කිරීමට ප්‍රතිපත්ති අනුමැතිය ලබාගැනීම | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි. |
| දුම්කොළ පනත (සංශෝධිත) | දුම්කොළ බදු ඉහළ දැමීම | අනුමැතිය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යැවීම පිණිස ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කිරීම |
| විවාහ ලියාපදිංචි ආඥාපනත සංශෝධනය කිරීම | විවාහ ලියාපදිංචි ආඥාපනතේ දික්කසාද ලියාපදිංචි කිරීම සහ විවාහ ශූන්‍යතාව පිළිබඳ ප්‍රතිපාදන සැපයීම, විදේශීය දික්කසාද පිළිබඳ යෝජිත හඳුනාගැනීම සඳහා ආනුශාංගික සංශෝධන | අමාත්‍ය මණ්ඩල තීරණ අපේක්ෂාවෙන් සිටියි. |

| | | |
|---|---|---|
| සිවිල් නඩුවිධාන සංග්‍රහය සංශෝධනය කිරීම (පුද්ගලයා වෙත සිදු කරන තුවාල සඳහා හානි) | වෛද්‍ය වෘත්තිකයින් තිදෙනෙකු නොඉක්මවන ලෙස වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කිරීමට පුද්ගලයාට ඉඩ දීමෙන් පුද්ගලයාට සිදුවන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණ කඩිනම් කිරීම සහ වෛද්‍ය වෘත්තිකයන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා නඩු විභාගයේ දී එහි දක්වා ඇති කරුණු සඳහා සාක්ෂි ලෙස භාවිතා කිරීම. මෙම සංශෝධනය නව ශීර්ෂය "D වෛද්‍ය පරීක්ෂණ සඳහා කොමිෂන් සභා" සමඟින් නව 429 ඒ වගන්තියක් ඇතුළත් කරයි | අමාත්‍ය මණ්ඩල තීරණය අපේක්ෂාවෙන් සිටියි. |
| අපරාධ නඩුවිධාන සංග්‍රහයේම සංශෝධනය කිරීම) (මරණ පරීක්ෂණ XXX පරිච්ඡේදය) | 30 XXX වන පරිච්ඡේදය වන මරණ පරීක්ෂණය සහ නව විධිවිධාන හඳුන්වාදීම | අමාත්‍ය මණ්ඩලය වෙත යැවීමට නියමිතයි. අමාත්‍ය මණ්ඩල සංදේශයේ දෙමළ පරිවර්තනය අපේක්ෂාවෙන් සිටියි. |

## 3.1.2 <u>රීති, නියෝග සහ රෙගුලාසි</u>

**අ) <u>ගැසට් පත්‍රය/ පාර්ලිමේන්තුවේ අනුමැතිය</u>**

| මාතෘකාව | අරමුණ | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 2003 අංක 21 දරන (විශේෂ ආරවුල් වර්ගීකරණ) සමථ පනත යටතේ වගන්ති 2.3 සහ 8 යන වගන්ති යටතේ ඇති නියෝගය | ඉඩම් ආරවුල් නිරාකරණය සඳහා විශේෂ සමථ මණ්ඩල ස්ථාපිත කිරීම | 2022.01.06 වන දින අංක 2261/68 දිනැති ගැසට් පත්‍රය |
| බන්ධනාගාර ආඥාපනත යටතේ නීති | දෙමාපියන් සමඟ ඇතුළත් කර ඇති දරුවන් , තදබල අසනීප තත්ත්වයෙන් පසුවන සිරකරුවන්, සිරකරුවන් වෙන්කිරීම, සහ වර්ගීකරණය සහ සිරකරුවන්ගේ විශේෂ අවදානම් තක්සේරු කිරීම පිළිබඳ ගැටලු හඳුනාගනිමින් පවතින බන්ධනාගාර නීති සඳහා සංශෝධන ගෙන ඒම සශෝධිත නීති මඟින් උක්ත කී කරුණු නිරාකරණය කිරීමට සහ මේ සම්බන්ධයෙන් බෙහෝ ප්‍රායෝගික විසඳුම් ගෙනඒමට උත්සාහ දරනු ලැබේ. | 2022.07.12 වන දින අංක. 2288/15 දරන ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. |

| | | |
|---|---|---|
| 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ වගන්ති අංක 04 යටතේ නියෝගය | නුවරඑළිය, ගාල්ල, මුලතිව් සහ රත්නපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ටාසවල සමථ මණ්ඩල ස්ථාපිත කිරීම සඳහා. | 2022.08.18 දිනැති අංක.2293/46 දරන ගැසට් පත්‍රය |

ආ) **<u>සකස් කිරීමේ ක්‍රියාවලිය</u>**

| **මාතෘකාව** | **අරමුණ** | **වත්මන් තත්ත්වය** |
|---|---|---|
| 2003 අංක 21 දරන සමථ (විශේෂ ආරවුල් වර්ගීකරණ පනතේ වගන්ති 4(2) සමඟ කියවිය යුතු 27 වන වගන්තිය යටතේ රෙගුලාසි | 2021.12.21 දිනැති අංක.2259/11 දරණ අති විශේෂ ගැසට් පත්‍රය තුල දක්වන නියෝගය ඇති විශේෂ සමථකරණ මණ්ඩල සම්බන්ධ සමථ කරුවන්ගේ මණ්ඩලය සඳහා සුදුසුකම් ගැසට් පත්‍රය මඟින් පළකිරීම | නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් සංශෝධිත කෙටුම්පත සකස් කරමින් සිටියි. |
| උතුරු නැගෙනහිර පළාත්වල මුදල් (ප්‍රඥප්ති) පිළිබඳව 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ වගන්ති 61 සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ රෙගුලාසි | එක් එක් පළාත් සභා විසින් පනවන ලද මුදල් ප්‍රඥාප්ති සම්බන්ධ කරුණු තීරණය කිරීමට දිස්ත්‍රික් සහ මහේස්ත්‍රාත් උසාවි සඳහා බලය පැවරීම පිණිස අමාත්‍යවරයා හා අගවිනිසුරුවරයා එකඟතාව මඟින් අදාළ නියෝගය ගැසට් මඟින් පළකිරීම | නැගෙනහිර පළාත හා සම්බන්ධ අගවිනිසුරුවරයාගේ එකඟතාව ලබාගැනීමට |

### 3.1.3 <u>කමිටු සම්බන්ධීකරණය</u>

| **නම** | **පැවරුම් බලය** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|
| දූෂණ විරෝධී පනත | වඩා ශක්තිමත් ව්‍යවස්ථාකරණයක් මඟින් පවතින නීති සඳහා ආදේශ කිරීම | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මඟින් ව්‍යවස්ථා සහතිකය නිකුත් කිරීම සඳහා නවතම කෙටුම්පත ගරු නීතිපතිතුමා වෙත යැවීය |
| වරදෙහි විෂයයන් වන දේපළ බැහැර කිරීම පිළිබඳ විශේෂ නීති<br><br>- වැරදි පිළිබඳ විෂයයන් | නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කිරීම | කමිටුව මේ වන විට විෂය පිළිබඳ සාකච්ඡා කරමින් සිටින අතර, මේ දක්වා සාකච්ඡා 06 ක් පවත්වා තිබේ. |

| | | |
|---|---|---|
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමට නුසුදුස්සෙකු වීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන්ගෙන ඡන්දය ප්‍රකාශ කිරීමට රජය විසින් හෝ ඒ වෙනුවෙන් කරන ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා පොලී නියම කිරීම සඳහා නව නීතියක් හඳුන්වා දීම. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1) (ඉ) ව්‍යවස්ථාවේ මන්ත්‍රීවරයෙකුට රාජ්‍ය හෝ රාජ්‍ය ආයතනයක් විසින් හෝ ඒ වෙනුවෙන් කරන ලද කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් යම් උනන්දුවක් තිබේ නම්, එම මන්ත්‍රීවරයා නුසුදුස්සකු වීම විස්තර කෙරෙන නීතියක් සකස් කර බලාත්මක කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සපයා ඇතත්, පසුගිය වසර 44 තුළ එවැනි නීති සම්පාදනය කිරීමට පාර්ලිමේන්තුව අපෙහොසත් වී ඇත. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවේ අසනු ගැනීමට නුසුදුස්සකු වන ආකාරයේ අවශ්‍යතා නියම කිරීමට කමිටුවක් මඟින් පනත් කෙටුම්පතක් සකස් කිරීමට කමිටුවක් පත් කරනවා. | කමිටුව කැඳවීමට නියමිතය. |

### 3.1.4 ශ්‍රී ලංකා නීති වාර්තා ප්‍රකාශනය

ශ්‍රී ලංකා නීති වාර්තා යනු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සහ අභියාචනාධිකරණය මඟින් සිදුකර ඇති නඩු තීන්දු මඟින් වැදගත් අධිකරණ අදහස් අන්තර්ගත කරමින් පළ කෙරෙන ප්‍රකාශන මාලාවකි. නඩුවල නිල වාර්තා ලෙස මෙම වාර්තා සලකන අතර, යම් සුවිශේෂී නිමිත්තක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී නීතිඥවරුන් විසින් ප්‍රධාන වශයෙන්ම උපකාර කරගනු ලැබේ. මෙය සංස්කාරක මණ්ඩලයක් යටතේ සකස් කෙරෙන අඛණ්ඩ ක්‍රියාවලියකි.

වර්තමාන කතෘ මණ්ඩලය 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා අදාළ ශ්‍රී ලංකා නීති වාර්තා අවසානාත්මක කර ඇති අතර ඒවා රජයේ මුද්‍රණාලය වෙත එවා ඇත. සංස්කාරක මණ්ඩලය මේ වන විට 2020 සහ 2021 වර්ෂවල මුද්‍රණ පිටපත්වල සෝදුපත් බලමින් සිටින අතර, 2022 අදාළ වාර්තා සකස් කිරීමේ කටයුතු සිදුකරමින් සිටී.

### 3.1.5 ජාත්‍යන්තර බැඳීම් ක්‍රියාත්මක කිරීම

- 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගැනීම් පිළිබඳ පනතේ සිවිල් පැතිකඩ
- 1995 අංක 05 දරන වැරදිකරුවන් භාරදීමේ පනත
- 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත
  මෙරටට එන, මෙරටින් යන
- 2000 අංක 39 දරන සිවිල් සහ වානිජ කාරණා වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත
  මෙරටට එන, මෙරටින් යන

- 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමයින් පැහැරගෙන යාම පිළිබඳ පනතේ සිවිල් පැතිකඩ ලංකාවෙන් වෙනත් රටකට රැගෙන දරුවන් සම්බන්ධ ලැබී ඇති ඉල්ලීම් පිළිබඳ ප්‍රගතිය

| ළමුන් ගෙන ගොස් ඇති රට | ලැබී ඇති ඉල්ලීම් |
|---|---|
| ඩුබායි | 01 |

- **1995 අංක 05 දරන වැරදිකරුවන් භාරදීමේ පනත**

යම් නිශ්චිත රටක පුරවැසියකු ශ්‍රී ලංකාවේදී යම් වරදක් කරන විටකදී, ඒ තැනැත්තා එකී නිශ්චිත රටට භාරදීම පිණිස සහ යම් ශ්‍රී ලංකික පුරවැසියකුට යම් නිශ්චිත රටකදී යම් වරදකට වරදකරු කරන විටකදී , ඒ ශ්‍රී ලංකික පුරවැසියා මෙරටට භාරදීම පිණිස 1995 අංක 05 දරන වරදකරුවන් භාරදීමේ පනත මඟින් විධිවිධාන සලසයි.

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත රටක පුරවැසියකු ලංකාව තුළ යම් වරදකට වරදකරු කර ඒ තැනැත්තා එකී නිශ්චිත රටට භාරදීම පිළිබඳ ප්‍රගතිය

| භුවමාරු කළ රට | වරදකරුවන් සංඛ්‍යාව |
|---|---|
| තායිලන්තය | 02 |
| ඉන්දියාව | 02 |

- **2002 අංක 25 දරන සාපරාධී කරුණුවලදී අන්‍යෝන්‍ය නෛතික සහාය ලබාදීමේ පනත**

සාපරාධි කරුණුවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය දැක්වීමේ විධිවිධාන බලාත්මක කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාව විවිධ රටවල් සමඟ ගිවිසුම් අපරානුමත කරමින් අත්සන් කර තිබේ. එක් එක් රාජ්‍ය පාර්ශවය විසින් විමර්ශණ පැවැත්වීම , නඩු පැවරීම, නඩු විභාග කර නෛතික නීති තීරණ ක්‍රියාත්මක කිරීම මඟින් අපරාධ කාරණාවලදී සහාය දැක්වීමේ විෂය පථය සම්බන්ධයෙන් මෙම ගිවිසුම්වලින් විධිවිධාන සළසයි.

මෙරටින් වෙනත් රටකට සහ වෙනත් රටවල්වලින් මෙරටට ලැබුණු අන්‍යෝන්‍ය නීති සහයෝගය ලබාදීම්වල ප්‍රගතිය- 2022 සිට මේ දක්වා

| අංකය | රට | ලැබෙන ඉල්ලීම් | පිටතට යන ඉල්ලීම් |
|---|---|---|---|
| 1 | ඕස්ට්‍රේලියාව | - | 01 |
| 2 | ඉන්දියාව | 01 | - |
| 3 | ප්‍රංශය | 03 | - |
| 4 | මාල දිවයින | 01 | 01 |
| 5 | බෙල්ජියම | - | 01 |
| 6 | බෙලරුස් | 01 | - |
| 7 | දොහා කටාර් | 01 | - |
| 8 | එක්සත් රාජධානිය | 01 | 01 |
| 9 | යුක්රේනය | 01 | - |
| 10 | තුර්කිය | - | 01 |

| | | | |
|---|---|---|---|
| 11 | එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 01 | - |
| 12 | හොං කොං | - | 01 |
| 13 | කොරියාව | 01 | - |
| 14 | පෘතුගාලය | 01 | - |
| 15 | ඕමානය | 01 | - |
| 16 | පෝලන්තය | 01 | |
| **එකතුව** | | **14** | **6** |

- **2000 අංක 39 දරන සිවිල් හා වාණිජ කටයුතු පිළිබඳ අනන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනත**

2000 අංක 39 දරන සිවිල් හා වාණිජ කටයුතු පිළිබඳ අනන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව 2022 ජනවාරි 01 වන දින සිට සැප්තැම්බර් 30 වැනි දින දක්වා රට පුරා ඇති උසාවි මඟින් නිකුත් කරන ලද සිතාසි අධිකරණ ක්‍රියාවලිය තුළ දක්වා ඇති ලිපිනයන් වලට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා බාරදෙන ලදී.

2022 ජනවාරි 01 දින සිට 2022 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය තුළ දිවයින පුරා උසාවි මඟින් විදේශ රටවලට නිකුත් කරන ලද සිතාසි සම්බන්ධ ප්‍රගතිය

| රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව | රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව |
|---|---|---|---|
| ඕසට්‍රේලියාව | 20 | මැලේසියාව | 04 |
| කැනඩාව | 08 | මාල දිවයින | 02 |
| චීනය | 10 | නවසීලන්තය | 04 |
| සයිප්‍රස් | 03 | ඕමානය | 01 |
| දොහා කටාර් | 03 | පිලිපීනය | 01 |
| ප්‍රංශය | 05 | රුසියාව | 07 |
| ජර්මනිය | 20 | සිංගප්පූරුව | 02 |
| ඉන්දියාව | 24 | තායිලන්තය | 01 |
| ඊශ්‍රාලය | 03 | ස්පාඤ්ඤය | 03 |
| ඉතාලිය | 21 | ස්විට්සර්ලන්තය | 05 |
| ජපානය | 06 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 07 |
| කොරියාව | 04 | එක්සත් රාජධානිය | 17 |
| සවුදි අරාබිය | 08 | ඇමරිකාව | 10 |
| කුවේටය | 15 | | |
| **එකතුව** | | | **214** |

විදේශ උසාවි මගින් ශ්‍රී ලංකාවේ ජීවත්වන චූදිතයන්ට සහ සාක්ෂිකරුවන්ට 2000 අංක 39 දරන සිවිල් සහ වානිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගය දැක්වීම පිළිබඳ පනත යටතේ නිකුත් කරන ලද සිතාසි/ඉල්ලීම් 63 ක් පමණ විදේශ රටවල්වලින් ලැබී ඇත.

2022 ජනවාරි 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා කාලය තුළ ලංකාවේ වාසය කරන ලද චූදිතයන්ට සහ සාක්ෂිකරුවන්ට විදේශ උසාවි මඟින් නිකුත් කර ඇති සිතාසි සම්බන්ධ ප්‍රගතිය.

| රට | ලැබී ඇති ඉල්ලීම් | රට | ලැබී ඇති ඉල්ලීම් |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 01 | මැලේසියාව | 03 |
| කැනඩාව | 04 | කොරියාව | 01 |
| චීනය | 09 | නොර්වේ | 04 |
| ප්‍රංශය | 08 | ස්ලෝවේකියාව | 02 |
| ජර්මනිය | 03 | ස්කොට්ලන්තය | 01 |
| ඉන්දියාව | 13 | ස්විට්සර්ලන්තය | 08 |
| ඉතාලිය | 02 | ඇමරිකාව | 01 |
| ජපානය | 01 | යුක්රේනය | 01 |
| පෝලන්තය | 01 | | |
| **එකතුව** | | | **63** |

**3.1.6 ජාත්‍යන්තර බැඳීම් ක්‍රියාත්මක කිරීම**

- **2022 එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගේ වාර්තා**

| | වාර්තාවේ නම | ඉල්ලා සිටින ලද්දේ | තත්ත්වය |
|---|---|---|---|
| 01. | සමකාලීන වහල්භාවය එහි හේතු සහ ප්‍රතිවිපාක ඇතුළුව විශේෂ වාර්තාකරු (SR) Tomoya Obokota මහතාගේ මෙරට සංචාරය - 2021 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 03 දක්වා. | විදේශ අමාත්‍යාංශය 2022.05.05 | 2022.05.23 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පිළිතුරු යවන ලදී |
| 02. | අරුමහන්දිගේ ජනිත් මධුශංක සම්බන්ධයෙන් විශේෂ ක්‍රියා පටිපාටි තුන සම්බන්ධ ඒකාබද්ධ නිවේදනය | විදේශ අමාත්‍යාංශය 2021.02.29 | 2022.01.13 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පිළිතුරු යවන ලදී |
| 03. | අත්තනෝමතික ලෙස රඳවා තබාගැනීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමකින් ලිපියක් ලැබීම | විදේශ අමාත්‍යාංශය 2021.12.29 | 2022.01.13 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පිළිතුරු යවන ලදී |
| 04. | මතවාද දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් විශේෂ වාර්තාකරු | විදේශ අමාත්‍යාංශය 2021.12.29 | 2022.01.13 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පිළිතුරු යවන ලදී |
| 05. | පාලනය, නීතියේ ආධිපත්‍ය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ යු.ස- ශ්‍රී ලංකාව ක්‍රියාකාරී කණ්ඩායම් අතර 6 වැනි හමුව | විදේශ අමාත්‍යාංශය 2021.12.29 | 2022.01.13 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පිළිතුරු යවන ලදී |

### 3.1.7 නීති ක්ෂේත්‍රයට අදාළ කාර්යසාධක බලකායන් සහ එමඟින් ලැබී ඇති දායකත්වයන්

- **මිනිස් වෙළඳාමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය**

ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් යුතු මානව ජාවාරමට එරෙහි කාර්ය සාධක බලකායේ කටයුතු සඳහා මෙම අමාත්‍යාංශයෙන් ලබා දී ඇති දායකත්වය

ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවට යවන ලද මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ 2022 (TIP) වාර්තාව සකස් කිරීමේදී අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය දායකත්වය ලබා දී ඇති අතර, එමඟින් ශ්‍රී ලංකාව 2 වන පෙළ සුපරීක්ෂණ ලැයිස්තුවෙන් 2 වන පෙළ දක්වා උසස් කර ඇත.

- **මහජන පෙත්සම්**

2022 වසර සඳහා (සැප්තැම්බර් 30 වන විට) නීති අංශය මඟින් මහජන පෙත්සම් 9 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

- **අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධක ලබාගැනීම් - 02

## 3.2 ආයතන අංශය

### 3.2.1 හැදින්වීම

අමාත්‍යාංශයේ ආයතනික හා පරිපාලන කටයුතු, අමාත්‍යාංශයට අයත් සියළුම ආයතන වල එම කටයුතු සම්බන්ධීකරණය හා අධිකරණ වල උපලේඛණගත නොවන තනතුරු වලට අදාල ආයතනික කටයුතු හා අධිකරණ වල පරිපාලන හා ආයතනික කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය යන ප්‍රධාන විෂයන්ට අදාල කටයුතු ආයතන අංශයට පැවරී ඇත.

### 3.2.2 අමාත්‍යාංශයේ ආයතනික හා පරිපාලන කටයුතු

අමාත්‍යාංශයේ කාර්යභාරය වඩාත් පුළුල්ව හා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහාත්, අළුතින් ආරම්භ කරන ලද අධිකරණ පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හා නීති ප්‍රතිසංස්කරණයන් තිරසාර ලෙසින් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයත් සලකා විධායක ශ්‍රේණියේ සිට ප්‍රාථමික ශ්‍රේණිය දක්වා ශ්‍රේණි වලට අදාලව නව තනතුරු ඇති කිරීම හා පැවති තනතුරු ප්‍රමාණය ඉහළ නැංවීම සිදු කරන ලදී.

### 3.2.3 අධිකරණ හා අමාත්‍යාංශයට අයත් ආයතන වලට අදාල කටයුතු

1. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවන් වැඩි කිරීමට සමගාමීව කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් රියදුරු හා කාර්යාල කාර්ය සහයක තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන එම තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම.

2. අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති අධිකරණ වල හා ආයතන වල පවතින ප්‍රාථමික සේවා ගණයේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලදී.

   - අධිකරණ වල පවතින කාර්යාල කාර්ය සහයක තනතුරු 225 ක් සඳහා කඩිනමින් බහුකාර්ය සංවර්ධන සහයකයින් අනුයුක්ත කිරීමට. (මේ වනවිටත් එම අනුයුක්ත කිරීම් සිදු කරමින් පවතී.)
   - අධිකරණ සඳහා ප්‍රාථමික සේවා ගණයට අයත් පිස්කල් භාරකාර මාතා තනතුරු 16 ක් හා පිස්කල් පියන් තනතුරු 10 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.
   - අමාත්‍යාංශයට අයත් ආයතන වල පවතින කඩිනමින් සම්පූර්ණ කළ යුතු රියදුරු තනතුරු පුරප්පාඩු 08 ක් සඳහා රියදුරන් බඳවා ගැනීම.

3. මෙපමණ කාලයක් අධිකරණ වල සේවය කරන නිලධාරීන් සඳහා ස්ථාන මාරු ක්‍රමවේදයක් නොතිබුණ අතර කාර්යාල කාර්යසහයක තනතුරු වල අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන එම තනතුරට අදාලව වාර්ෂික ස්ථාන මාරු 90ක් සිදු කිරීම

4. මෙපමණ කාලයක් අධිකරණ වල සේවය කරන නිලධාරීන් සඳහා ස්ථාන මාරු ක්‍රමවේදයක් නොතිබුණ අතර අධිකරණ වල සේවයේ නියුතු සිතාසි බෙදන්නා, අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා තනතුරු වලට අදාලව ප්‍රථම වරට වාර්ශික ස්ථාන මාරු ප්‍රතිපත්තියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කර ගැනීම හා සිතාසි බෙදන්නා 118 ක්, අධිකරණ ආරක්ෂක 67 ක්, පිස්කල් පියන් 20 ක් හා පිස්කල් භාරකාර මාතා 19 ක් සඳහා වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීම

5. අධිකරණ වල මුර රාජකාරී සඳහා යොදවන මුරකරු හා අධිකරණ ආරක්ෂකවරුන් සඳහා අතිකාල දීමනා ගෙවීම සම්බන්ධයෙන් අධිකරණ වල විවිධ ගැටළු පවතින බැව් නිරීක්ෂණය වීම නිසා ඒ සම්බන්ධ තොරතුරු රැස් කර නව චක්‍රලේඛයක් නිකුත් කිරීම (අ.අ.ච.1/2008(i)

6. අමාත්‍යාංශ නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම හා අමාත්‍යාංශයට අයත් ආයතන හා දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් හට අතිකාල දීමනා ගෙවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ 02 ක් නිකුත් කිරීම. (අ.අ.ච. 08/2022 හා අ.අ.ච. 03/2022)

7. අමාත්‍යාංශයට අයත් ආයතන හා දෙපාර්තමේන්තුව වල සේවය කරන නිලධාරීන් සඳහා අතිකාල දීමනා අනුමත කිරීමසඳහා කමිටුවක් පත් කිරීම හා එම කමිටු තීර්ණය මත එම නිලධාරීන් සඳහා අතිකාල දීමනා අනුමත කිරීම .

8. අධිකරණ හා කම්කරු විනිශ්වය සභා මගින් නිකුත් කරනු ලබන සහතික පිටපත් සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධන කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා කමිටුවක් පත්කර කමිටු එම කමිටු නිර්දේශ ගාස්තු සංශෝධනයට අදාල අනුමැතිය ලබා ගැනීම සඳහා වැටුප් කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

9. නඩු විභාග වල නඩු වාර්තා සහ ශ්‍රව්‍ය / දෘශ්‍ය පටිගතකිරීම් වල ඩිජිටල් පිටපත් නිකුත් කිරීමට අදාළ ගාස්තු සම්බන්ධයෙන් සියලුම අධිකරණ දැනුවත් කිරීම සඳහා අ.අ.ච. 06/2022 නිකුත් කිරීම.

10. සමගිය හා සංහිඳියා කාර්යාංශයේ අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම.

11. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ භාෂා පරිවර්තක (MN 04) බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතියට යොමු කිරීම, විධායක අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම.

12. හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අනුමැතියට මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

13. කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලයේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් ලදු ලේඛක නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ලබා දීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් ලදු ලේඛක නිලධාරීන් 14 කු සඳහා පත්වීම් ලිපි ලබාදීම.

14. කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලයේ වාර්ෂික ස්ථාන මාරු 2023 අනුමත කිරීම, ලදු ලේඛක කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අනුමැතිය ලබා දීම.

15. අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය, අපරාධයක වින්දිතයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය සඳහා මු.රෙ. 71 තනතුරු (07ක්) අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

16. නීතිපති දෙපාර්තමේන්තුව සභා අධිනීතිඥවරුන් 50 ක් බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇති අතර ඉන් 25 දෙනෙකු 2022 වර්ෂයේදී ද ඉතිරි අධිනීතිඥවරුන් 25 දෙනා 2023 වර්ෂයේදී බඳවා ගැනීමටත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත. මෙම වර්ෂයට අදාලව 24 දෙනෙකු පත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් කටයුතු සිදු කරමින් පවතී.

17. හානිපූරණ කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, ජාතික සමගිය හා සංහිඳියාව සඳහා වන කාර්යාලය, සමථ මණ්ඩල කොමිෂන් සභාව, අපරාධයක වින්දිතයන් සහසාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය සහ නීති ආධාර කොමිෂන් සභාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකරණ මණ්ඩල සඳහා සභාපති / සාමාජිකයින් පත් කිරීම.

18. 2022 වර්ෂය සඳහා සංවර්ධන නිලධාරී නවක පත්වීම් 210 ක් අමාත්‍යාංශය වෙත ලද අතර එයින් 137 දෙනෙකු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අධිකරණ වලට අනුයුක්ත කර ඇත.

19. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් 30 ක් ලැබී ඇති අතර ඒ සඳහා පිළිතුරු ලබා දී ඇති අතර අභියාචනා 04 ක් සඳහා ද පිළිතුරු ලබා දී ඇත.

20. අමාත්‍යාංශය වෙත මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගන්නා ලද වාහන වලට අදාල මුල් ලියාපදිංචි ලේඛණයන්හි පරම අයිතිය ඉවත් කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් මෙම අමාත්‍යාංශය වෙත රැගෙන එන ලද වාහන මෙම අමාත්‍යාංශය නමින් පවරා ගැනීමේ කටයුතු සාර්ථකව අවසන් කර ඇත.

21. 2022 වර්ෂයේ වාහන වල සිදු වූ අනතුරු සම්බන්ධ මු.රෙ. 104 පරීක්ෂණ කටයුතු 75% ක් පමණ අවසන් කර ඇත. අධිකරණ පරිපාලන වැය විෂයට අදාල රථවාහන වල සිදු වූ අනතුරු වලට අදාල මු.රෙ. 104 පරීක්ෂණ කටයුතු 75% ක් පමණ අවසන් කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය සතුව අපහරණය කිරීම සඳහා වෙන් කලද වෙන්දේසි නොවූ වාහන තුනක් උසස් අධ්‍යාපන තාක්ෂණවේදය හදාරණ සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීමට අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු කිරීම.

22. 2022 වර්ෂයේ පළමුවන හා දෙවන කාර්තුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන පරිදි අලුත්වැඩියාවන් හා සේවාවන් ඉටු කිරීම. අධිකරණ පරිපාලන වැය විෂය සඳහා 2022 වර්ෂයේ පළමුවන හා දෙවන කාර්තුව සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන පරිදි අලුත්වැඩියාවන් හා සේවාවන් ඉටු කිරීම.

### 3.2.4 ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කර ඇති කාර්යයන්

1. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සඳහා පවතින වැටුප් තල සංශෝධනය හා එම දෙපාර්තමේන්තු ව්‍යුහය ප්‍රතිසංවිධානය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

2. අමාත්‍යාංශය මගින් අධිකරණ වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ ආයතනික කටයුතු වලට අදාල තොරතුරු කැඳවීමට හා සියළු අධිකරණ වෙත යොමු කළ යුතු ලිපි යොමු කිරීම අමාත්‍යාංශයේ වෙබ් අඩවිය හරහා information portal 1 ක් නිර්මාණය කරමින් පවතී.

3. අධිකරණ වල සේවය නියුතු නිලධාරීන්ගේ කාර්ය මණ්ඩල තොරතුරු මාර්ගගත ක්‍රමවේදයකට ලබා ගැනීම සඳහා පද්ධතියක් සකස් කිරීමට සැලසුම් කිරීම

## 3.3 සැලසුම් අංශය

### 3.3.1 සැලසුම් අංශයේ කාර්යයන්

සැලසුම් අංශය මගින් අමාත්‍යාංශය හා එයට අයත් ආයතනවලට අදාළව ව්‍යාපෘති හඳුනා ගැනීම ප්‍රගති සමාලෝචනය හා අධීක්ෂණය කරනු ලබයි. ඒ යටතේ පහත කාර්යයන් සැලසුම් අංශය විසින් ඉටු කරනු ලබයි.

- අධිකරණ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති හඳුනා ගැනීම.
- ව්‍යාපෘති ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමත කර ගැනීම.
- විදේශ ආධාර අපේක්ෂිත ව්‍යාපෘති යෝජනා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- නව ව්‍යාපෘති වල මූලික අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන සැලැස්මට ඇතුළත් කිරීම
- අමාත්‍යාංශ හා අධිකරණ පරිපාලන වැය ශීර්ෂවලට අදාළ මූලධන අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.
- අයවැය කථාව සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කිරීම.
- ප්‍රගති සමාලෝචනය සහ අදාළ ආයතන වෙත ප්‍රගතිය වාර්තා කිරීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කර අයවැය විවාදය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික වාර්තා සඳහා අවශ්‍ය විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අධිකරණ ක්ෂේත්‍රය සඳහා සංයුක්ත, උපක්‍රමික හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සංවර්ධන ව්‍යාපෘති පසු විපරම් කිරීම.
- අධිකරණවල නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛණ රැස්කර වාර්ෂික සංඛ්‍යා ලේඛණ වාර්තාව සකස් කිරීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා සඳහා පාර්ලිමේන්තුව සමග සම්බන්ධීකරණය


### 3.3.2 සැලසුම් අංශයේ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය

**අ) අධිකරණ ක්ෂේත්‍ර යේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ තුන් අවුරුදු සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.**


දිගු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ අධිකරණ නඩු වලින් පිරී පවතින අතර, නඩු විමසීම සඳහා දීර්ඝ කාලයක් ගතවේ. 2022.06.30 දිනට ශ්‍රී ලංකාවේ අධිකරණවල විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 1,094,912 වේ.

එම අතිවිශාල නඩු සංඛ්‍යාව විසඳීමට 2020 වර්ෂය වන විට සිටි විනිසුරුවරුන් සංඛ්‍යාව ජනගහනයෙන් මිලියනයකට 15ක් වූ අතර මේ වන විට මෑතකදී සිදු කළ විනිසුරුවරුන් බඳවා ගැනීම් සමග එම සංඛ්‍යාව 18 දක්වා ඉහළ ගොස් ඇත. එසේ වුවද මෙය ජාත්‍යන්තර තත්වය සමඟ සලකා බලන විට ඉතා අඩු අගයක් වන අතර, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් වල පහළට යෑමට මෙය විශේෂ හේතුවක් වී ඇත. නඩු විසඳීමට දීර්ඝ කාලයක් ගතවීමද විදේශිකයන් ශ්‍රී ලංකාව තුළ ආයෝජනය අධෛර්යමත් කරයි.


පසුගිය වසර හයක දෙසැම්බර් 31 වන විට සහ 2022.06.30 වන විට විසදීමට ඇති නඩු සංඛ්‍යාව පහත පරිදි වේ.




එසේම 2022.06.30 දින වන විට විසදීමට ඇති නඩු සංඛ්‍යාව එක් එක් අධිකරණය අනුව පහත පරිදි වේ.



ඒ අනුව පසුගිය කාලය තුළ පැවති විවිධ තත්ත්වයන් යටතේ ගොනු කරන නඩු සංඛ්‍යාවේ සහ අවසන් කරන නඩු සංඛ්‍යාවේ අඩු වීමක් වාර්තා වන අතර විසඳීමට ඇති නඩු සංඛ්‍යාව ඉහළ යන ප්‍රවනතාවක් පවතින බව පහත ප්‍රස්ථාරය තුළින් පැහැදිලි වේ.





2022 වර්ෂයේ දෙවන කාර්තුව දක්වා අධිකරණවලින් රැස් කළ තොරතුරුවල සාරාංශය පහත පරිදි වේ.

| අධිකරණ | සංඛ්‍යාව | අධිකරණ ශාලා | විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | විනිසුරුවරුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 01 | 04 | 5,236 | 17 |
| අභියාචනාධිකරණය | 01 | 10 | 3,506 | 20 |
| සිවිල් අභියාචන මහාධිකරණ | 22 | 22 | 7,030 | 90 |
| වාණිජ මහාධිකරණ | 01 | 04 | 8,018 | |
| විශේෂ මහාධිකරණ | 02 | 02 | 03 | |
| මහාධිකරණ (අපරාධ) | 34 | 43 | 30,030 | |
| දිසා අධිකරණ | 35 | 63 | 269,378 | 148 |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණ | 51 | 64 | - | |
| මහේස්ත්‍රාත් අධිකරණ | 54 | 79 | 764,536 | 104 |
| ළමා මහේස්ත්‍රාත් අධිකරණ | 02 | 02 | 1,632 | |
| සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ | 22 | 22 | * | - |
| කම්කරු විනිශ්චය සභා | 39 | 39 | 5,543 | 26 |
| **එකතුව** | **264** | **354** | **1,094,912** | **405** |

* සංචාරක මහේස්ත්‍රාත් අධිකරණවල නඩු සංඛ්‍යාව මහේස්ත්‍රාත් අධිකරණවල නඩු සංඛ්‍යාවට ඇතුළත් වේ.

අධිකරණ ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක් පවතින ප්‍රමාදය අවම කිරීම සඳහා දිගු කාලීන සැලැස්මක් 2020 වර්ෂයේදී සංවර්ධනය කරන ලදී. ඒ අනුව කාර්යක්ෂම හා ඵලදායී යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රනයක් තුළින් නීතියේ අධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම උදෙසා උපායමාර්ග කිහිපයක් හඳුනා ගන්නා ලදී.




කෙසේ වුවද රට තුළ උද්ගත වූ තත්ත්වය තුළ මෙම සැලැස්මේ ඉලක්කයන් ලගා කර ගැනීම විශාල අභියෝගයක් වී ඇත. නමුත් සැලසුම් කළ පරිදි නීති ප්‍රතිසංස්කරණ සාර්ථකව සිදු කර ගැනීමට හැකි විය.

- ඒ අනුව 2021 වසරේ නීති ප්‍රතිසංස්කරණ 12ක් සහ 2022 වසරේ මේ දක්වා 14ක් ලෙස නීති ප්‍රතිසංස්කරණ 26ක් සිදු කර ඇත. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කර යැවූ කෙටුම්පත් සංඛ්‍යාව 196 කි. ( වැඩිදුර තොරතුරු නීති අංශයේ හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය යටතේ තොරතුරු ඉදිරිපත් කර ඇත)

- වසර 40කට පසු උපරිමාධිකරණවල විනිසුරුවරුන් සංඛ්‍යාව 14 දෙනෙකුගෙන් වැඩි කර ගැනීමට හැකි වූ අතර එසේම දිසා මහේස්ත්‍රාත් අධිකරණ සඳහා අධිකරණ නිලධාරීන් 49 දෙනෙකු බඳවා ගන්නා ලදී. මහාධිකරණ විනිසුරුවරුන් ලෙස 26 දෙනෙකු උසස් කරන ලදී.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චය ආසන 2කින් වැඩි කළ අතර අභියාචනාධිකරණ විනිශ්චය ආසන 4කින් වැඩිකර ඇත. එසේම අතිරේක වාණිජ අධිකරණයක් නව පළාත්බද මහාධිකරණයක් නව දිසා අධිකරණ 2ක් ස්ථාපිත කිරීමට හැකි වී ඇත.අපරාධ හා සිවිල් නඩු එකට ඇසූ දිසා මහේස්ත්‍රාත් අධිකරණ 10කට තවත් විනිසුරුවරයෙකු පත් කොට සිවිල් නඩු හා අපරාධ නඩු වෙනම අසන අධිකරණ වශයෙන් වෙන් කර ඇත. එසේම සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 4ක් ස්ථිර අධිකරණ ලෙස උසස් කොට ඇත.

- යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් ඉංජිනේරු අංශයේ කාර්යය යටතේ තොරතුරු ඇතුළත් කර ඇත.
- විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිළිබඳව සමථ මණ්ඩල කොමිෂන් සභාව හා ණය සහනදායි මණ්ඩලීය දෙපාර්තමේන්තුව යටතේ තොරතුරු දක්වා ඇත.

රටේ ආර්ථික තත්ත්වය යහපත් වූ වහාම ප්‍රගතිය නැවත සමාලෝචනය කොට සංශෝධිත සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අරමුණයි.

**ආ) ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම**

- 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර 2022.02.22 වන දින අනුමැතිය ලබා ගෙන ඇත.
- මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ට වෙන් වී ඇති ප්‍රතිපාදන මාණ්ඩලික නිලධාරීන්ට පවරා ඒ සඳහා මාසික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී.

**ඇ) අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

2022 වර්ෂයට අදාළව අයවැය ඇස්තමේන්තුව සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට මහා පරිමාණ හා සුළු පරිමාණ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගිණුම් අංශයට ඉදිරිපත් කිරීම සඳහා ඉංජිනේරු අංශය සමඟ සම්බන්ධීකරණය සිදු කරන ලදී.

**ඈ) ප්‍රගති වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම**

- සෑම මසකම සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇතුළත් වාර්තා 9ක් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- සෑම කාර්තුවකම රුපියල් මිලියන 100ට වැඩි ව්‍යාපෘතිවල තොරතුරු ඇතුළත් වාර්තා 03ක් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි
- 2022 වර්ෂයේ අයවැයට අදාළ අමාත්‍යාංශ හා ඊට අනුබද්ධිත ආයතනවල ප්‍රාග්ධන වියදම්වලට අදාළව කාර්තුමය වශයෙන් වාර්තා 3ක් සකස් කිරීම.

**ඉ) ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම**

- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අත්කරගෙන ඇති ප්‍රගතිය කාර්තුමය වශයෙන් සාකච්ඡා කරනු ලැබූ අතර දෙවන කාර්තුව සඳහා වන ප්‍රගති සමාලෝචන රැස්වීම ගරු අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2022.09.05 දින සිදු කරන ලදී.
- මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය හා ප්‍රගතිය සම්බන්ධයෙන් අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.
- මෙම අමාත්‍යාංශයට අයත් වැය ශීර්ෂයන්ගේ වැය විෂයන්ගේ වගකීම මාණ්ඩලික නිලධාරීන්ට පවරා ප්‍රතිපාදන වැය කිරීමේ ප්‍රගතිය, මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 6කදී සාකච්ඡා කරන ලදී.

ඊ)      සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය

**සිදුකෙරෙමින් පවතින මහා පරිමාණ ව්‍යාපෘති (රු.මි 100 ට වැඩි)**

දැනට කරමින් පවතින මහා පරිමාණ ව්‍යාපෘති
(2022 සැප්තැම්බර් 30 දක්වා)



** උ) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත වාර්තා යොමු කිරීම**

ගම්පහ, කුරුණෑගල, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ඒකාබද්ධව වාර්ෂිකව ක්‍රියාත්මක කරන ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන්වලට ඇතුළත්වන සියළුම සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය වශයෙන් වාර්තා කිරීම.

**ඌ) උපදේශක කාරකසභා රැස්වීම් පැවැත්වීම**

සැලසුම් අංශය මඟින් සිදු කරන තවත් කාර්යභාරයක් වන්නේ අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශීය උපදේශක කාරක සභා රැස්වීම් කටයුතු සම්බන්ධීකරණය කිරීමයි. ඒ අනුව මෙම වර්ෂයේ තෙවන කාර්තුව වනවිට අමාත්‍යාංශීය උපදේශක කාරකසභා රැස්වීම් 05ක් පමණ පවත්වන ලදි.

ඒ අනුව එම රැස්වීම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සලකා බැලූ පනත් සංඛ්‍යාව | - | 17 |
| සලකා බැලූ වාර්ෂික වාර්තා සංඛ්‍යාව | - | 06 |
| මන්ත්‍රී යෝජනා සංඛ්‍යාව | - | 01 |

මෙම රැස්වීම් සාර්ථක කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව සහ අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණ කටයුතුද අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතුද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**එ) වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ප්‍රගති වාර්තා සකස් කිරීම**

- 2022 වර්ශයේ ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- 2021 වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

**ඒ) තොරතුරු දැනගැනීමේ පනත**

2016 අංක 16 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අනුව ඉදිරිපත් කර ඇති ඉල්ලීම් දෙකකට තොරතුරු ඉදිරිපත් කර ඇත.

**ඔ) උපරිමාධිකරණ සංකීර්ණයේ පූර්ණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**

ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 දෙසැම්බර් 15 දින චීන මහජන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ද්විපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන ආධාර ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය යුවාන් මිලියන 240 කි.

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය සහ මෙම අමාත්‍යාංශයේ සාමාජිකයන්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් පත්කර ඇති අතර එම කණ්ඩායම චීන සමූහාණ්ඩුවේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව සමග සම්බන්ධ වී සකස් කරන ලද මූලික සැලසුම් මේ වන විට අනුමත කර ඇත. එසේම ට්‍රාන්ස්ෆෝමර මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු මෙම අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවති. එසේම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු චීන සමූහාණ්ඩුව විසින් සිදු කරමින් පවතින අතර මෙම වසර අගදී ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතය.

ඕ) <u>කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම</u>.

**අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය**

| දෙපාර්තමේන්තුව | වර්ෂය | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දිනය | වෙනත් |
|---|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | 2021 | 2022.08.02 | |
| නීතිපති දෙපාර්තමේන්තුව | 2020 | 2021.12.07 | |
| | 2021 | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැත | වාර්තාව සකස් කරමින් පවති |
| නීති කෙටුම්පත් දෙපාර්තමේනතුව | 2021 | 2022.08.10 | |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 2021 | 2022.09.21 | |
| රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව | 2021 | 2022.10.28 | |
| ණයසහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | 2020 | 2021.11.16 දින පාර්ලිමේන්තුවට යොමු කිරීම සඳහා ආවරණ ලිපිය ලබා දී ඇත. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැත |
| | 2021 | පාර්ලිමේන්තුවට යොමු කිරීමට වාර්තාව මුද්‍රණය සඳහා කටයුතු කරමින් පවතී | |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 2021 | 2022.06.29 | |
| ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව | 2020 | 2021.10.15 | |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | 2021 | 2022.10.19 | |

**ඖ) අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යාපාර ආයතනවල වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය**

| ආයතනය | වර්ෂය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද දිනය | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දිනය | වෙනත් |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය | 2017 | 2022.02.15 | 2022.07.25 | |
| | 2018 | අමාත්‍ය මණ්ඩල සංදේශය කැබිනට් මණ්ඩලය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී | | 2019,2020 සහ 2021 වාර්තා සකස් කරමින් පවති |
| උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලය | 2020 | 2022.02.15 | 2022.03.18 | |
| | 2021 | වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | | |

| | | | | |
|---|---|---|---|---|
| නීති ආධාර කොමිෂන් සභාව | 2020 | 2022.06.21 | 2022.08.22 | |
| | 2021 | | | වාර්තාව සකස් කරමින් පවතින බව දැනුම්දී ඇත. |
| වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය | 2020 | 2021.12.21 | 2022.08.03 | |
| | 2021 | | | වාර්තාව සකස් කරමින් පවතින බව දැනුම්දී ඇත. |
| හානි පූර්ණය සඳහා වන කාර්යාලය | 2017 | 2021.08.03 | 2022.06.24 | |
| | 2018 | අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවති | | |
| | 2019 | | | |
| | 2020 | | | |
| | 2021 | | | සකස් කරමින් පවතී |
| අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | 2020 | 2022.02.15 | | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය |
| | 2021 | අමාත්‍ය මණ්ඩල සංදේශය කැබිනට් මණ්ඩලය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී | | වාර්තාව සකස් කරමින් පවතී. |

## 3.4 සංවර්ධන අංශය

### 3.4.1 <u>සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳ සංක්ෂිප්තය</u>

1. දිවයින පුරා පිහිටා ඇති අධිකරණ, අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවලට අයත් ඉඩම් හඳුනාගැනීම, නිරවුල් කිරීම, පවරා ගැනීම හා අවශ්‍යතාවය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීම.
2. ගොඩනැගිලි ඉදිකර නොමැති අධිකරණ, ආයතන හා විනිසුරු නිල නිවාස සඳහා සුදුසු ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීම.
3. අධිකරණ අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ හෝ අත්කර ගැනීමේ කටයුතු අවසන්ව ඇති ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරුකරවා ගිණුම්ගත කිරීම සඳහා යොමු කිරීම.
4. අධිකරණවල පවතින අධික නඩු තදබදය මඟහරවා ගැනීමටත් දැනට ඒකාබද්ධව පවතින අධිකරණ වෙන් කිරීම සඳහාත් ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති අවස්ථාවලදී ඒ සඳහා සුදුසු ගොඩනැගිලි හඳුනා ගැනීම හා එම ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

**3.4.2 <u>අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති අධිකරණ, දෙපාර්තමේන්තු හා ආයතන වලට අදාල ඉඩම් හඳුනා ගැනීම, නිරවුල් කිරීම, පවරා ගැනීම හා අවශ්‍යතාවය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු</u>**

| | |
|---|---|
| ඉඩම් පවරා ගැනීම සහ අත්කර ගැනීමේ කටයුතු - මුළු ඉඩම් සංඛ්‍යාව | 302 |

| | | |
|---|---|---|
| පූර්ණ වශයෙන් පවරා ගැනීමේ කටයුතු අවසන් කර ඇති ඉඩම් ප්‍රමාණය | | 76 |
| තවදුරටත් ඉඩම් පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින ඉඩම් ප්‍රමාණය | | 203 |
| • අවශ්‍යතාවය මත අලුතින් ඉඩම් හඳුනා ගනිමින් පවතින ප්‍රමාණය | 35 | |
| • ප්‍රාදේශීය ලේකම්/ මහවැලි අධිකාරිය වෙතින් ඉඩම සම්බන්ධ මූලික තොරතුරු ලබා ගැනීම | 18 | |
| • ඉඩම සම්බන්ධ තොරතුරු නොමැති අවස්ථාවක - ඉඩම මැන මායිම් නිරූපණය කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්/ මහවැලි අධිකාරිය වෙත දැන්වීම | 22 | |
| • ප්‍රාදේශීය ලේකම්/ මහවැලි අධිකාරිය විසින් මැනුම් නියෝග නිකුත්කල පසු පෙරසැරි ගාස්තු ගෙවීම (අදාල උසාවිය/අමාත්‍යාංශය මඟින්) | 05 | |
| • ඉඩම සම්බන්ධ තොරතුරු ලද පසු ඉල්ලුම් පත්‍රය යොමු කිරීම | 85 | |
| • ප්‍රාදේශීය ලේකම්/ මහවැලි අධිකාරිය විසින් අදාල පළාත් පාලන ආයතන වෙතින් පවරා දීමට අනුමැතිය ලබා ගැනීම | 09 | |
| • ප්‍රාදේශීය ලේකම් විසින් අදාල අනුමැතීන් ද සමඟ පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කිරීම | 05 | |
| • ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය ද සහිතව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අයදුම් පත්‍රය යොමු කිරීම | 16 | |
| • ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශය ලද පසු ඉඩම පවරා දීම සිදු කිරීම සඳහා දිනයක් ලබා දීම - ප්‍රාදේශීය ලේකම් | 08 | |
| අත්කර ගැනීමේ ක්‍රියාවලියේ පවතින ඉඩම් ප්‍රමාණය | | 23 |
| ඉඩම් හුවමාරු | | 04 |
| වෙනත් | | 17 |

ඉහත සඳහන් ඉඩම් හඳුනා ගැනීම, නිරවුල් කිරීම, පවරා ගැනීම හා අත්පත් කර ගැනීමේ කටයුතු වලට සමගාමීව අමාත්‍යාංශය සතු ඉඩම් පිළිබඳව තොරතුරු යාවත්කාලීන කිරීමද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව අධිකරණ කළාප 34 ට අයත් දිවයින පුරා ඇති සියළු අධිකරණ හා නිල නිවාස පිහිටි ඉඩම් පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.

02. **<u>නව අධිකරණ හා නිල නිවාස පිහිටුවීම සඳහා ඉඩම් අත්කර ගැනීම් (ඉඩම් කොටස් 23)</u>**

01. අධිකරණ පියස ව්‍යාපෘතිය සඳහා කොළඹ බී.සී.සී. (British Ceylon Corporation) ආයතනයට අයත් ඉඩමෙන් කොටසක් අත් කර ගැනීම.

“අධිකරණ පියස” ව්‍යාපෘතිය සඳහා කොළඹ උපරිමාධිකරණ සංකීර්ණ පරිශ්‍රය ආසන්නයේ පිහිටා ඇති බී.සී.සී. සමාගමට අයත් ඉඩමෙන් අක්කර 6 ක පමණ ප්‍රමාණයක් අධිකරණ අමාත්‍යාංශය වෙත අත් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව වෙල්ල වීදිය ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉඩමේ සංවර්ධන අයිතිය ලබාගෙන ඇති අතර “අධිකරණ පියස” ව්‍යාපෘතිය ආරම්භකර ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ වන විට ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව වන්දි හිමිකම් පරීක්ෂණය ද සිදු කර ඇත. ඉන් අනතුරුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 10 (1) (අ) වගන්තිය යටතේ වන්දි ගෙවීම සඳහා රජයේ තක්සේරු වාර්තාව ලබා ගැනීමට නියමිතව ඇත.

02. ගාල්ල නව අධිකරණ සංකීර්ණය පිහිටි ඉඩමට යාබදව පිහිටි ඉඩම් කොටස් තුනක් අත්කර ගැනීම.

ගාල්ල නව අධිකරණ සංකීර්ණයට යාබදව පිහිටි අක්කර 03ක පමණ ඉඩම් කොටස් තුනක් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර මේ වන විට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 04 වන වගන්තිය යටතේ නියමය ද නිකුත් කර ඇත. ඒ අනුව ඉදිරියේදී ඉඩම් කොටස් අත්කර ගැනීමට එරෙහිව පවතින විරෝධතා සඳහා පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇත.

03. කළුතර නව අධිකරණය ඉදිකිරීම සඳහා ඉඩමක් අත්කර ගැනීම

කළුතර නව අධිකරණ සංකීර්ණය ඉදිකිරීමට යෝජිත කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුකුරුන්ද ගමේ පිහිටි අක්.02 රූ.02 පර්.20.66ක් (හෙක්.1.064) වන ඉඩම් කොටසේ භුක්තිය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් භාරගෙන ඇත. මේ වන විට ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව 9 වන වගන්තිය ප්‍රකාරව වන්දි හිමිකම් පරීක්ෂණය සිදු කර ඇත. ඉඩම් අත්කර ගැනීම පනතේ 10 (1) (අ) වගන්තියේ දැන්වීම නිකුත් කර තක්සේරු වාර්තාව ලබා ගෙන ඇති අතර වන්දි ගෙවීම් කටයුතු සඳහා අධිකරණයට යොමු කර ඒ සඳහා නියෝගය ලබා ගැනීමට නියමිතව ඇත.

04. නාරම්මල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩම් කොටස අත්කර ගැනීම

නාරම්මල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය පවත්වාගෙන යනු ලබන රූ.01 පර.38.67 පමණ වන ඉඩම් කොටස අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මු.රෙ.53 යටතේ ඉඩම් අමාත්‍යාංශයට වෙන් කර ඇති සාමූහික ප්‍රතිපාදනවලින් දැරීමට අනුමැතිය ලැබී ඇති අතර අත්පත් යෝජනාව ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

05. නාරම්මල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයට යාබදව පිහිටි ඉඩමෙන් කොටසක් අත්කර ගැනීම

නාරම්මල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය ස්ථිර මහේස්ත්‍රාත් අධිකරණයක් ලෙස ස්ථාපිත කිරීමේ දී එම අධිකරණය පවත්වාගෙන යනු ලබන ඉඩමට යාබදව පිහිටා ඇති පෞද්ගලික ඉඩමෙන් පර්.80 ක පමණ කොටසක් අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගැනීමට කටයුතු කර ඇත.

06. බද්දේගම අධිකරණය පුළුල් කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම.

බද්දේගම අධිකරණය පුළුල් කිරීම සඳහා අක්.02ක පමණ ඉඩම් කොටසක් අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගෙන ඇත.

07. කල්පිටිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩම් කොටස අත්කර ගැනීම.

කල්පිටිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි අක්.01 රූ.01 පර්.22 ක් පමණ වන ඉඩම් කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බැවින් එම ඉඩම් කොටස අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගෙන ඇත.

08. මීරිගම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය පිහිටුවීම සඳහා ඉඩම් කොටස අත්කර ගැනීම.

මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුරුගම්පල ගමේ පිහිටි කහටගහකුරුඳුවත්ත නමැති ඉඩමෙන් අක්කර 03 ක පමණ ප්‍රමාණයක් අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. එබැවින් අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දීමට නියමිත ඉඩමේ ප්‍රමාණය වෙන් කොට දක්වන දළ අනුරේඛණයක් ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

09. වාලච්චේන දිසා මහේස්ත්‍රාත් අධිකරණය සඳහා ඉඩම අත්කර ගැනීම.

වාලච්චේන දිසා මහේස්ත්‍රාත් අධිකරණය සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට පුද්ගලික ඉඩම් කොටසක් මෙම අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. අත්කර ගැනීමට නියමිත රූ.01 පර්.38.28 ක ප්‍රමාණය දක්වන දළ අනුරේඛණයක් ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා ගැනීමට නියමිතය.

10. තංගල්ල අධිකරණ සංකීර්ණය පිහිටි ඉඩම අත්කර ගැනීම.

තංගල්ල අධිකරණ සංකීර්ණය ඉදිකර ඇති ඉඩම හම්බන්තොට දිස්ත්‍රික් පේෂකාර්මිකයන්ගේ සමූපකාර සමිතිය සතුව පැවති අතර, එය දකුණු පළාත් සංවර්ධන කොමසාරිස් විසින් ඈවර කිරීමේදී සී/ස හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය විසින් 2002 වර්ෂයේදී මිළ දී ගෙන ඇත. ඒ අනුව, ඉඩම අත්කර ගැනීමේ කටයුතු සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

11. උඩුගම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා ඉඩම් කොටස් දෙකක් අත්කර ගැනීම.

උඩුගම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩම දැක්වෙන GA/NGD/2016/90 අනුරේඛණයේ කැබලි අංක J සහ K යන ඉඩම් කොටස් පෞද්ගලික ඉඩම් කොටස් දෙකක් වන බැවින් එම ඉඩම් කොටස් අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට මු.රෙ.53 යටතේ ප්‍රතිපාදන ලබා ගැනීමේ අනුමැතිය සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇත.

12. වලපනේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම සඳහා ඉඩමක් අත් කර ගැනීම.

වලපනේ මහේස්ත්‍රාත් අධිකරණය පවත්වාගෙන යන රූ.02 පර්.39.8ක් පමණ වන ඉඩම් කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් බව දන්වා ඇති බැවින් එම ඉඩම් කොටස අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගෙන ඇත.

13. වරකාපොළ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම.

වරකාපොළ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි අක්.04 රූ.02 පර්.22 ක් පමණ වන ඉඩම් කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් බව දන්වා ඇති බැවින් එම ඉඩම් කොටස අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව එම ඉඩම් කොටස අත්කර ගැනීමට මු.රෙ.53 යටතේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇත.

14. පස්සර දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම.

පස්සර දිසා/මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්.02 ක පමණ ඉඩම් කොටසක් මෙම අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් උක්ත ඉඩම් කොටස මැනුම්කර අනුරේඛණය ලබා දීමට නියමිතව ඇත.

15. වැලිමඩ අධිකරණ සංකීර්ණය සඳහා ඉඩම් අත්කර ගැනීම.

වැලිමඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්.02 ක පමණ ඉඩම් කොටසක් අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. මේ වන විට ඉඩම් අත් කර ගැනීමේ පනතේ 9 වන වගන්තිය යටතේ වන්දි හිමිකම් පරීක්ෂාව සිදු කර 10 (1) (අ) වගන්තිය යටතේ ඉඩමේ තක්සේරු වටිනාකම ලබා ගෙන ඇති අතර 17 වැනි වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල කටයුතු සිදුකරමින් පවතී.

16. නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම.

නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණයට අයත් ගොඩනැගිලි පිහිටා ඇති පර්.60ක් පමණ වන ඉඩම් කොටස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ගෙන ඇත.

17. අත්තනගල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩමට යාබද ඉඩම් කොටස අත්කර ගැනීම.

අත්තනගල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය පුළුල් කිරීම සඳහා අධිකරණ භූමියට යාබදව පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු ඉඩමෙන් අක්.1 පර්. 4.8 ක පමණ ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ඇත.

18. ගම්පොල අධිකරණ සංකීර්ණය පුළුල් කිරීම සඳහා යාබද ඉඩම් කොටස් අත්කර ගැනීම.

ගම්පොල අධිකරණ සංකීර්ණය පුළුල් කිරීම සඳහා ගම්පොල නගර සභාවට අයත් ඉඩම් කොටසක් අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා ගෙන ඇත. ඒ අනුව අත්කර ගැනීමේ පනතේ 6 වන වගන්තිය යටතේ මූලික පිඹුර සංශෝධනය කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. සංශෝධිත මූලික පිඹුර ලද පසු ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පල කිරීමට නියමිතව ඇත

<u>විනිසුරු නිල නිවාස පිහිටුවීම සඳහා</u>

19. රඹබඩගල්ල මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස සඳහා ඉඩම අත්කර ගැනීම.

රඹබඩගල්ල මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස ඉදිකිරීම සඳහා කරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රිදී විහාරයට අයත් ඉඩමෙන් පර්.30.7 ක පමණ ඉඩම් කොටසක් අධිකරණ අමාත්‍යාංශය වෙත අත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව ඉඩම් අත්කර ගැනීම පනතේ 2 වන වගන්තිය යටතේ කටයුතු කර ඇති අතර ඉඩමේ මැනුම් කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

20. මාරවිල පැරණි විනිසුරු නිල නිවස පිහිටි ඉඩම් කොටස අත්කර ගැනීම.

මාරවිල පැරණි විනිසුරු නිල නිවස පිහිටි ඉඩම පෞද්ගලික ඉඩම් කොටසක් බව දන්වා ඇති බැවින් රූ.01 පර්.24.6 ක් පමණ වන එම ඉඩම් කොටස අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ඇත.

21. බලපිටිය විනිසුරු නිල නිවස පිහිටි ඉඩම් කොටස අත්කර ගැනීම.

ප්‍රමාණයෙන් අක්.02 රූ.02 පර්.10.94 ක් වන බලපිටිය මහාධිකරණ විනිසුරු නිල නිවස, දිසා විනිසුරු නිල නිවස සහ මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස පිහිටි ඉඩම් කොටස් 03 අධිකරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව මු.රෙ.53 යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට ඉඩමේ දළ තක්සේරු වටිනාකම ලබා ඇත.

22. තංගල්ල අධිකරණ විනිසුරු නිල නිවාස ඉදිකිරීම සඳහා කොටස් අත්කර ගැනීම.

තංගල්ල මහාධිකරණ විනිසුරු, සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරු, දිසා/මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු රූ.02 පර්.6.77 ක පමණ ඉඩම් කොටස් 03ක් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව, මු.රෙ.53 යටතේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇත.

23. නීති ක්ෂේත්‍රය සඳහා වන පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ගම්පහ මහාධිකරණයේ නඩු අංක HC/26/17 ට අදාල ගම්පහ, මල්වාන ප්‍රදේශයේ පිහිටි ඉඩමෙන් කොටසක් අත්කර ගැනීම

අංක අමප/17/1265/731/011-IV හා 2017.06.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අංක 111/3, ගහබඩ පාර, පහළ මාපිටිගම, මාපිටිගම, මල්වාන යන ලිපිනයේ පිහිටි අක්කර 16යි රූඩ් 01යි පර්චස් 08ක් විශාල ඉඩමෙන් අක්කර 04ක භූමි ප්‍රමාණයක් නීති ක්ෂේත්‍රය සඳහා වන පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව ඉඩමේ වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු වාර්තාවක් කැඳවා ඇත.

මීට අමතරව ජනාකීර්ණ ප්‍රදේශවල ඉදිකර ඇති අධිකරණ ජනාකීර්ණ නොවන ප්‍රදේශවල ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ඉඩම් හුවමාරු ක්‍රමය යටතේ පහත දක්වා ඇති අධිකරණ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින ඉඩම් කොටස් ලබා දීමට යෝජනා වී ඇති බැවින් ඒ පිළිබඳව මූලික කටයුතු සිදු කරමින් පවතී.

01. අගුණකොළපැළැස්ස අධිකරණය ප්‍රතිස්ථාපනය කිරීම
02. කුරුණෑගල අධිකරණය ප්‍රතිස්ථාපනය කිරීම
03. මාවනැල්ල අධිකරණය ප්‍රතිස්ථාපනය කිරීම
04. හම්බන්තොට අධිකරණය ප්‍රතිස්ථාපනය කිරීම

### 3.4.3 <u>ගොඩනැගිලි ඉදිකර නොමැති අධිකරණ, ආයතන හා විනිසුරු නිල නිවාස සඳහා සුදුසු ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීම</u>

පහත සඳහන් ආයතන සහ අධිකරණ පවත්වාගෙන යාම සඳහා සුදුසු ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගෙන ඇත.

- අධිකරණ අමාත්‍යාංශය ප්‍රතිස්ථාපනය කිරීම
- ජාත්‍යන්තර බේරුම්කරන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම
- කුරුණෑගල පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණය
- පූගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
- තෙල්දෙණිය දිසා මහේස්ත්‍රාත් අධිකරණය

- මොරවක දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
- ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය
- වත්තල කම්කරු විනිශ්චය සභාව
- මාතර කම්කරු විනිශ්චය සභාව
- ගාල්ල කම්කරු විනිශ්චය සභාව
- රත්මලාන කම්කරු විනිශ්චය සභාව
- බොරැල්ල කම්කරු විනිශ්චය සභාව
- කුරුණෑගල කම්කරු විනිශ්චය සභාව
- තලවකැලේ කම්කරු විනිශ්චය සභාව
- ගාල්ල ණය සහනදායක මණ්ඩලය
- හානි පූර්ණ කාර්යාලය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
- විනිසුරුවරුන් සඳහා නිල නිවාස බදු හෝ කුලී පදනම මත ලබා ගැනීම

විනිසුරුවරුන් සඳහා නිල නිවාස බදු හෝ කුලී පදනම මත ලබා ගැනීම (නිල නිවාස 70)

| දිස්ත්‍රික්කය | සකස් කර ඇති බදු ගිවිසුම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | මහාධිකරණ/සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරු නිල නිවස | දිසා විනිසුරු/ අතිරේක දිසා විනිසුරු නිල නිවස | මහේස්ත්‍රාත්/ අතිරේක මහේස්ත්‍රාත් නිල නිවස | එකතුව |
| කොළඹ | 0 | 2 | 6 | 8 |
| අවිස්සාවේල්ල | 0 | 0 | 1 | 1 |
| රත්නපුර | 1 | 4 | 3 | 8 |
| මහනුවර | 3 | 2 | 2 | 7 |
| නුවරඑළිය | 1 | 2 | 1 | 4 |
| ගාල්ල | 1 | 1 | 0 | 2 |
| තංගල්ල | 1 | 2 | 0 | 3 |
| කුලියාපිටිය | 0 | 0 | 2 | 2 |
| කළුතර | 0 | 2 | 1 | 3 |
| අනුරාධපුර | 0 | 0 | 3 | 3 |
| කෑගල්ල | 0 | 4 | 1 | 5 |
| ගම්පහ | 0 | 4 | 2 | 6 |
| හලාවත | 0 | 4 | 0 | 4 |
| පානදුර | 0 | 4 | 2 | 6 |
| මාතලේ | 0 | 2 | 1 | 3 |
| මාතර | 0 | 0 | 1 | 1 |
| කුරුණෑගල | 1 | 1 | 0 | 2 |
| පොළොන්නරුව | 0 | 2 | 0 | 2 |
| **එකතුව** | **8** | **36** | **26** | **70** |

**3.4.4 <u>අධිකරණ අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ හෝ අත්කර ගැනීමේ කටයුතු අවසන්ව ඇති ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරුකරවා ගිණුම්ගත කිරීම (CIGAS) සඳහා යොමු කිරීම.</u>**

1. තිස්සමහාරාම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
2. බලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
3. කිලිනොච්චි දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
4. මහියංගනය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
5. රත්නපුර මහාධිකරණ විනිසුරු නිල නිවස
6. තෙල්දෙණිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
7. ගම්පොළ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
8. නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් නිල නිවස
9. නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
10. ගම්පහ මහාධිකරණය
11. ගම්පහ සිවිල් අභියාචනාධිකරණය
12. පොතුවිල් දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
13. අක්කරෛපත්තු මහේස්ත්‍රාත් අධිකරණය
14. සමන්තුරෛ දිසා අධිකරණය
15. සමන්තුරෛ මහේස්ත්‍රාත් අධිකරණය
16. කල්මුණේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
17. කඩුවෙල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
18. ඉරක්කාමම් ක්වාසි අධිකරණය
19. මහර මහේස්ත්‍රාත් අධිකරණය
20. ගාල්ල නව අධිකරණය ඉදිකරමින් පවතින ඉඩම
21. කළුවන්චිකුඩි සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය
22. බලපිටිය විනිසුරු නිල නිවාස පිහිටි ඉඩම් කොටස් 03
23. ත්‍රිකුණාමලය අධිකරණ සංකීර්ණය
24. මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණය

## 3.5 ඉංජිනේරු අංශය

### 3.5.1 හැඳින්වීම

කාර්යක්ෂමව හා ඵලදායීව යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ පද්ධතියට අවශ්‍ය පහසුකම් සැපයීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීමකි. ඒ සඳහා නව යටිතල පහසුකම් සැපයීමත්, පවතින පහසුකම් වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාමත් ඉංජිනේරු අංශයේ මූලික කාර්යභාරය වේ.

ඒ යටතේ නව අධිකරණ සංකීර්ණ හා ගොඩනැගිලි ඉදිකිරීම, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හා නඩත්තු කටයුතු ආදී වැදගත් කාර්යභාරයන් රාශියක් මෙම අංශයේ සම්බන්ධීකරණය හා අධීක්ෂණය යටතේ ඉටු කරනු ලබයි.

අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් ආකාර කීපයකින් ක්‍රියාත්මක වේ.

එනම්,

- අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ සිදු කරන මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති
- අයවැය ඇස්තමේන්තු මගින් සුළු පරිමාණ ව්‍යාපෘති සඳහා ලබා දෙන ප්‍රතිපාදන යටතේ සිදු කරන ඉදිකිරීම් ව්‍යාපෘති
- අයවැය යෝජනා සඳහා ලබා දෙන ප්‍රතිපාදන යටතේ සිදුකරන ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති
- අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිසංස්කරණ වැය විෂය යටතේ ලබා දෙන ප්‍රතිපාදන මගින් සිදු කරන අලුත්වැඩියා ව්‍යාපෘති

මෙම වසරේ ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

| | **2022** වසර සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු. මි.) | **2022.09.30** දක්වා වියදම (රු. මි.) | **මූල්‍ය ප්‍රගතිය %** |
|---|---|---|---|
| මහා පරිමාණ ව්‍යාපෘති | 1,794.60 | 502.03 | 27.97% |
| සුළු පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති | 140 | 63.74 | 45.53% |
| ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති | 600 | 308.27 | 51.38% |
| **අයවැය ඇස්තමේන්තු යටතේ** | | | |
| වැය ශීර්ෂ 110 - අධිකරණ පියස | 1,365 | 643.29 | 47.13% |
| වැය ශීර්ෂ 228 - තුන් අවුරුදු ව්‍යාපෘතිය | 963 | 350.23 | 36.36% |
| එකතුව | **4,862.6** | **1,867.56** | **38.41%** |

### 3.5.2 **2022.01.01 සිට 2022.09.30 දක්වා ඉදිකිරීම් අවසන් කරන ලද ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල (රු.මි) වැට් රහිත | 2022 වසරේ වියදම (රු. මි.) | සටහන |
|---|---|---|---|
| රම්බඩගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය, නඩු භාණ්ඩ කාමරය, කාර්යාලය සහිත නව ගොඩනැගිල්ල සහ ජල කුළුණ ඉදිකිරීම | 14.57 | - | වැය වී ඇති මුදල රු.මි. 12,78 කි. අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත. |
| පොතුවිල් දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා නඩු භාණ්ඩ කාමරය, පරිවාස කාර්යාලය, නීති ආධාර කාර්යාලය, ප්‍රජා විශෝධන කාර්යාලය සහ පවුල් උපදේශන කාර්යාලය ඉදිකිරීම | 23.02 | 2.70 | වැය වී ඇති මුදල රු.මි. 22.68 කි. අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත. |
| අක්කරෙයිපත්තු දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා නඩු භාණ්ඩ කාමරය, පරිවාස කාර්යාලය, නීති ආධාර කාර්යාලය, ප්‍රජා විශෝධන කාර්යාලය සහ පවුල් උපදේශන කාර්යාල ඉදිකිරීම | 21.89 | 0.49 | වැය වී ඇති මුදල රු.මි. 19.59 කි. අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත. |
| නාවුල මහෙස්ත්‍රාත් නිල නිවස ඉදිකිරීම | 14.18 | - | වැය වී ඇති මුදල රු.මි. 14.29 කි. අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත. |
| නාවලපිටිය මහෙස්ත්‍රාත් නිල නිවස ඉදිකිරීම | 16.57 | - | වැය වී ඇති මුදල රු.මි. 16.47 කි. අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත. |



රම්බඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල



අක්කරෙයිපත්තුව අධිකරණ ගොඩනැගිල්ල



නාවුල විනිසුරු නිල නිවස



පොතුවිල් අධිකරණ ගොඩනැගිල්ල

### 3.5.3 2022 වර්ෂයට පෙර ආරම්භ කරන ලද මේ වන විටත් ඉදිකරමින් පවතින ව්‍යාපෘති

පවත්නා අභියෝගකාරී ආර්ථික තත්වය හමුවේ, පහත ව්‍යාපෘති මිල උච්ඡාවචනයන්ට යටත්ව ඉදිරියට කරගෙන යැමට තීරණය කර ඇත.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාලය | කොන්ත්‍රාත් මුදල (රු. මි.) | 2021.12.31 දිනට සමුච්චිත වියදම (රු. මි.) | 2022 වසර සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු. මි.) | 2022 වසරේ වියදම (රු. මි.) | 2022.09.30 මූල්‍ය ප්‍රගතිය % | 2022.09.30 දිනට භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - ඉතිරි වැඩ | 2020-2022 | 996.84 | 327.81 | 218.44 | 102.00 | 46.69% | 49% |
| රත්නපුර අධිකරණ සංකීර්ණය | 2018-2023 | 2,380.5 | 1,018.36 | 550 | 142.64 | 25.93% | 85.6% |
| වැලිමඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම | 2019-2022 | 428.72 | 242.58 | 250 | 28.65 | 11.46% | 75% |
| තෙල්දෙණිය අධිකරණ සංකීර්ණය | 2019-2022 | 307.25 | 99.53 | 75 | 34.75 | 46.33% | 52% |
| පූගොඩ අධිකරණ සංකීර්ණය | 2018-2022 | 377.8 | 113.27 | 60 | 14.37 | 23.95% | 30% |
| කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම | 2021-2024 | 263.81 | 46.05 | 90 | 64.59 | 71.76% | 10.10% |
| වාකරේ නව අධිකරණ ගොඩනැගිල්ල | 2020-2022 | 50.02 | 28.91 | 10 | 7.05 | 70.5% | 80% |
| හෙල්බොඩ නව අධිකරණ ගොඩනැගිල්ල | 2020-2022 | 51.23 | 24.52 | 8 | 3.16 | 39.5% | 80% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| නාරම්මල සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2020-2022 | 31.28 | 24.93 | 15 | 8.65 | 57.66% | 96% |
| හලාවත ද්විත්ව නිල නිවාස | 2020-2022 | 31.10 | 16.24 | 15 | - | 0% | 60% |
| පානදුර ද්විත්ව නිල නිවාස | 2021-2023 | 34.56 | 11.47 | 10 | 1.28 | 12.8% | 60% |
| මඩකලපුව ද්විත්ව නිල නිවාස | 2021-2023 | 36.78 | 12.46 | 12 | 8.84 | 73.66% | 62% |
| කුරුණෑගල ද්විත්ව නිල නිවාස | 2021-2022 | 39.90 | 5.29 | 10 | 2.07 | 20.7% | 65% |
| ඇඹිලිපිටිය ද්විත්ව නිල නිවාස | 2021-2022 | 34.77 | 10.15 | 10 | 4.14 | 41.4% | 70% |
| අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය | 2021-2022 | 113.32 | 32.67 | 25 | - | 0 | 30% |
| නිකවැරටිය පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 107.94 | 46.52 | 60 | 25.48 | 42.46% | 68% |
| පුත්තලම් පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 122.82 | 24.56 | 90 | 41.95 | 46.61% | 65% |
| සමන්තුරේ පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 44.65 | 14.35 | 30 | 8.31 | 27.7% | 66% |
| මනම්පිටිය පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 49.96 | 8.51 | 40 | 21.28 | 53.2% | 80% |
| කුච්චවේලි පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 73.08 | 24.74 | 50 | 19.56 | 39.12% | 50% |
| බණ්ඩාරවෙල දිසා අධිකරණයේ ලේඛනාගාරය සහ නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම | 2021-2022 | 32.92 | 8.84 | 25 | 5.95 | 23.8% | 50% |
| වැල්ලවාය නව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 58.81 | 9.57 | 40 | 2.52 | 6.3% | 35% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| හිඟුරක්ගොඩ දිසා මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2021-2022 | 104.40 | - | 100 | 25.31 | 25.31% | 10% |
| දඹුල්ල අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම | 2021-2022 | 60.90 | 16.48 | 60 | 6.48 | 27% | 20% |
| මාතලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම | 2021-2023 | 561.47 | 143.25 | 120 | 43.41 | 26 | 14% |

### 3.5.4 2022 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2022.09.30 දක්වා වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| වලපනේ අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම * | 320.50 | 72.10 | 4.65% |
| මහව දිසා මහෙස්ත්‍රාත් අධිකරණය | 35.07 | 14.66 | 55% |
| දෙහිඅත්තකණ්ඩිය දිසා අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 69.00 | 13.16 | 8% |
| කැකිරාව දිසා මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම | 112.59 | 25.97 | 12% |
| වාලච්චේන පෙරනිම් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 149.82 | 52.03 | 28% |
| කල්මුණේ විනිසුරු නිල නිවස ඉදිකිරීම | 37.50 | 15.23 | 10% |
| මොණරාගල අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම | 101.26 | 20.55 | 40% |
| කලවාන සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 34.66 | - | 20% |
| වරකාපොළ දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම | 80.61 | - | 1% |
| බකමූණ අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම | 33.86 | 3.84 | 10% |
| අධිකරණ පියස ව්‍යාපෘතිය ඉදිකිරීම් භූමියේ පවතින, ගලවා ඉවත් නරන ලද පෙරනිම් ගොඩනැගිලි දෙක මාතර නව අධිකරණ භූමියේ ස්ථාපිත කිරීම. | 12.20 | 6.55 | 90% |

* මෙම අධිකරණය ඉදිකිරීම සහ පවතින අධිකරණයේ අලුත්වැඩියා කටයුතු අත්‍යවශ්‍ය වන බැවින්, ආර්ථික තත්ත්වය යථාවත් වන තුරු මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදුකිරීමට තීරණය කර ඇත.

### 3.5.5 ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති

2022 මහාධිකරණ ප්‍රසම්පාදනය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

| මහාධිකරණ කලාපය | අනුමත කරන ලද ප්‍රතිපාදන මුදල රු. මිලියන | | | | | 2022.09.30 දිනට වියදම රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | එකතුව | |
| අම්පාර | - | 0.2 | - | - | 0.2 | 0.00 |
| අනුරාධපුරය | 0.6 | 10 | 5 | 2 | 17.6 | 14.8 |
| අවිස්සාවේල්ල | - | 0.007 | - | - | 0.007 | 0.007 |
| බදුල්ල | 0.022 | - | 0.08 | - | 0.1 | 0.1 |
| මඩකලපුව | - | - | 1 | - | 1 | 0 |
| කොළඹ | 13.8 | 22.2 | 35.4 | 0.2 | 71.6 | 52 |
| හලාවත | 1.6 | 0.2 | - | - | 1.8 | 0.21 |
| ගාල්ල | 0.51 | 8.3 | 22.5 | 24.6 | 55.9 | 19.6 |
| ගම්පහ | 0.6 | 0.18 | 1.77 | 2.5 | 5.05 | 0.86 |
| හෝමාගම | - | 4.3 | 2.5 | 2.2 | 9 | 0.00 |
| යාපනය | 0.03 | 0.38 | - | 1.17 | 1.58 | 0.3 |
| කල්මුණේ | - | 0.86 | - | - | 0.86 | 0.6 |
| කළුතර | 1.2 | 0.26 | 2.5 | 1.1 | 5.06 | 2.5 |
| මහනුවර | 1.3 | - | 0.96 | - | 2.2 | 2.3 |
| කෑගල්ල | 0.9 | - | 0.9 | - | 1.8 | 1.8 |
| කුරුණෑගල | 0.9 | 9.5 | 2.5 | - | 12.9 | 4.4 |
| මාතර | 0.1 | 14.9 | 1.8 | - | 16.8 | 15.9 |
| මොණරාගල | - | - | - | - | - | 0 |
| මීගමුව | 0.04 | 0.9 | 0.78 | - | 1.7 | 0.56 |
| නුවරඑළිය | - | - | 0.01 | - | 0.01 | 0.01 |
| පොළොන්නරුව | 0.039 | - | 0.027 | - | 0.066 | 0.067 |
| පුත්තලම | - | - | - | - | - | 0.00 |
| රත්නපුර | - | 0.048 | - | - | 0.048 | 0.035 |
| තංගල්ල | 0.7 | 0.3 | 0.005 | - | 0.005 | 1 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | 0.00 |
| වවුනියාව | 1.6 | - | - | - | 1.6 | 1.6 |
| **එකතුව** | **23.941** | **72.535** | **77.732** | **33.77** | **207.97** | **118.69** |

අමාත්‍යාංශ ප්‍රසම්පාදනය යටතේ ක්‍රියාත්මක ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති (2021 වර්ෂයේ සිට 2022 දක්වා ක්‍රියාත්මක වෙමින් පවතින)

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුව (රු. මිලියන) | **2021.12.31** දක්වා වියදම (රු. මිලියන) | **2022.09.30** දක්වා වියදම (රු. මිලියන) | භෞතික ප්‍රගතිය **100%** |
|---|---|---|---|---|
| අම්පාර මහාධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 8.00 | - | 4.2 | 85% |
| අනුරාධපුර අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 31.1 | 10.4 | 17 | 70% |
| අවිස්සාවේල්ල අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 6.8 | 6.5 | 1.4 | 100% |
| බදුල්ල සිවිල් අභියාචනා මහාධිකරණයේ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 4.9 | 1 | 3.8 | 100% |
| බදුල්ල මහාධිකරණ හා දිසා අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 3.4 | 2.1 | 0 | 100% |
| බණ්ඩාරවෙල දිසා අධිකරණයේ විවෘත අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 3.2 | 1.4 | 0 | 100% |
| වාලෙච්චේන දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 1.7 | 1.8 | 0 | 100% |
| මඩකලපුව මහාධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 3.5 | 1.7 | 0.17 | 100% |
| මාරවිල අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 10.6 | 10.9 | 0.74 | 100% |
| හලාවත මහාධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 3.9 | 2.6 | 1.1 | 100% |
| ගාල්ල මහාධිකරණය හා දිසා අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 6.7 | - | 0 | 0% |
| ගම්පහ සිවිල් අභියාචනා මහධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 6.2 | 1.4 | 1.9 | 90% |
| ගම්පහ සිවිල් අභියාචනා මහධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 1.8 | - | 0.69 | 20% |
| මහර අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 12.1 | - | 2.8 | 40% |
| මහර මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 15.3 | 14.1 | 1.5 | 100% |
| දිසා අධිකරණයක් බවට පරිවර්තනය කිරීම සඳහා දැනට පවතින මහර මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම | 0.6 | 0.49 | 0 | 100% |
| අත්තනගල්ල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 11.8 | - | 2.6 | 40% |
| අත්තනගල්ල දිසා අධිකරණයේ අලුත්වැඩියා ව | 2.5 | | 1.5 | 100% |
| යාපනය අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 27.1 | 15.7 | 0 | 55% |
| අක්කරෙයිපත්තුව දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 5.8 | 4.3 | 0 | 100% |
| සමන්තුරේ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 5.1 | 5.4 | 1 | 100% |
| කල්මුණේ මහාධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 8.7 | 8.9 | 2.2 | 100% |
| කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 2.6 | 1.6 | 1 | 100% |

| | | | | |
|---|---|---|---|---|
| මහනුවර අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 28.5 | 22.4 | 1.1 | 100% |
| දඹුල්ල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 14.6 | - | 0.85 | 20% |
| මාවනැල්ල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 7.1 | 2 | 3.4 | 100% |
| කෑගල්ල අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 24.3 | 6.6 | 0 | 0% |
| වරකාපොල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 21 | 16.6 | 11.7 | 100% |
| හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 10.1 | 8.4 | 3.3 | 100% |
| රඹඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 1.2 | 1 | 0.12 | 100% |
| කුලියාපිටිය අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 21.1 | 6.7 | 3.7 | 40% |
| පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 5.2 | 3.5 | 0 | 100% |
| වාරියපොල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 2.7 | - | 0.54 | 40% |
| නාරම්මල මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 2.6 | - | 1.8 | 100% |
| දෙයියන්දර මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 6.1 | 3.9 | 0 | 100% |
| මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 20.7 | 5 | 8.6 | 65% |
| මීගමුව අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 12.3 | - | 0 | 0% |
| වැලිසර දිසා අධිකරණයේ අලුත්වැඩියා කටයුතු සකස් කිරීම | 2.3 | | 0 | 70% |
| නුවරඑළිය අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 5.7 | 2.5 | 3.7 | 100% |
| හිඟුරක්ගොඩ දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 10.6 | 10.2 | 2.1 | 100% |
| පොළොන්නරුව මහාධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 17.7 | - | 16.5 | 85% |
| ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 3 | 3.1 | 0.15 | 100% |
| කල්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 2.3 | 2.5 | 0 | 100% |
| පුත්තලම අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 9.3 | 8.1 | 1.9 | 100% |
| කලවාන මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 5.7 | 6.1 | 0.75 | 100% |
| ඇඹිලිපිටිය අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු | 15.1 | - | 10.3 | 75% |
| බලංගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 11 | 5.8 | 5.2 | 85% |
| වලස්මුල්ල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ අලුත්වැඩියා කටයුතු | 5.4 | 3.5 | 9.45 | 96% |
| අලුත්කඩේ උසාවි සංකීර්ණය අලුත්වැඩියා කිරීම | 986.8 | 151.3 | 178.9 | 56% |

**3.5.6 ඉදිරි සැලසුම්**

වත්මන් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ඇති අභියෝගකාරී වාතාවරණය හමුවේ, රාජ්‍ය මුදල් පරිහරණය කිරීම ඉතා වගකීමෙන් යුතුව මහජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවයන් සඳහා මුල් තැන දෙමින් සිදු කළ යුතු අතර, විශේෂයෙන් රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව මෙම වසරේ ආරම්භ කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති සහ ඊට පෙර ආරම්භ කරන ලද ව්‍යාපෘති පවතින ආර්ථික තත්ත්වය යථාවත් වනතුරු තාවකාලිකව නැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව දැනට භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරන ඉදිකිරීම් ප්‍රයෝජනයක් ගත හැකිවන පරිදි සහ සිදුකර ඇති ඉදිකිරීම්වලට වන හානිය අවම වන පරිදි ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදුකිරීමෙන් අනතුරුව මෙසේ තාවකාලිකව නතර කිරීමට සැලසුම් කර ඇති අතර එම ව්‍යාපෘති පහත දැක්වේ.

01. අධිකරණ පියස ව්‍යාපෘතිය
    මෙය ව්‍යාපෘති අදියර 04කින් සමන්විත වේ. එනම්,

- මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම - භාවිතයට ගත හැකි ආකාරයට මහල් තුනක් දක්වා ඉදිකිරීමෙන් අනතුරුව තාවකාලිකව නතර කිරීම.
- මහාධිකරණ හා දිසා අධිකරණ සංකීර්ණය සහ අධිකරණ අමාත්‍යාංශ සංකීර්ණය ඉදිකිරීම - දැනට වැඩ අවසන් කර ඇති පයිලින්වලට සිදුවන හානිය වළක්වා ගැනිමට ආරක්ෂක ක්‍රමවේදයක් යෙදීමෙන් අනතුරුව තාවකාලිකව නතර කිරීම. (මේ සඳහා 2023 වසරේ අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සඳහන් කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරමින් පවතී.)
- නිල නිවාස සංකීර්ණය - ඉදිකිරීමේ කටයුතු තාවකාලිකව නතර කර ඇත.

02. මුතූර් නිලනිවස ඉදිකිරීම

03. කල්මුණේ විනිසුරු නිල නිවස ඉදිකිරීම

04. කින්නියා අධිකරණ ගොඩනැගිල්ල

05. නොච්චියාගම අධිකරණ ගොඩනැගිල්ල

06. කල්පිටිය අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම

07. මොණරාගල අධිකරණ ගොඩනැගිලි ඉදිකිරිම

08. .බකමූණ අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම

09. කුලියාපිටිය අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම

10. හලාවත අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම

11. දඹුල්ල අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම

12. කලවාන සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම

13. ඇඹිලිපිටිය පෙරනිම් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම

14. මාතලේ අධිකරණ සංකිර්ණය ඉදිකිරිම

15. මාරවිල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම

16. වරකාපොළ දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම

17. හැටන් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයටනව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
18. නුවරඑළිය අධිකරණයේ ඉදිකිරීම්
19. හොරණ අධිකරණයට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
20. ගල්කිස්ස අධිකරණ සංකීර්ණය ඉදිකිරීම
21. මහනුවර අධිකරණය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
22. මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ඉදිකිරීම්
23. මතුගම අධිකරණයේ ඉදිකිරීම්
24. පස්සර අධිකරණයේ ඉදිකිරීම්
25. පැල්මඩුල්ල අධිකරණයේ ඉදිකිරීම්
26. කෑගල්ල අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම
27. මඩකලපුව අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම
28. කඩුවෙල අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
29. අත්තනගල්ල අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම
30. මීනුවන්ගොඩ අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම
31. අවිස්සාවේල්ල නව අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම
32. ත්‍රිකුණාමලය අධිකරණ සංකීර්ණය ඉදිකිරීම
33. කළුතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම
34. මොරවක අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම

උපදේශන සේවා ව්‍යාපෘති

35. ගාල්ල මහාධිකරණය හා දිසා අධිකරණය පිහිටි ගොඩනැගිල්ලේ පිටුපස කොටස අලුත්වැඩියා කිරීම
36. බලපිටිය යෝජිත නව සිවිල් අභියාචනා මහාධිකරණය ඉදි කිරීම
37. බද්දේගම අධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම
38. මීගමුව පැරණි මහේස්ත්‍රාත් අධිකරණය අලුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීම
39. රක්වාන සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම
40. හම්බන්තොට මහාධිකරණයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම

ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති

## 3.6 ප්‍රතිසංස්කරණ අංශය

අධිකරණ අමාත්‍යාංශය විසින් සිදුකරන කඩිනම් ප්‍රතිසංස්කරණ වැඩසටහනට අනුකූලව, අමාත්‍යාංශය විසින් සිදුකරන ප්‍රතිසංස්කරණ සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රතිසංස්කරණ අංශය 2020 වසරේදී ස්ථාපනය කරන ලදී.

නීති ප්‍රතිසංස්කරණ, යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය කඩිනම් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ඒ වෙනුවෙන්ම කැප වන විශේෂ ඒකකයක් ප්‍රතිසංස්කරණ අංශය යටතේ ස්ථාපනය කරන ලදී. ඒ අනුව, පහත සඳහන් අංශවලට අදාළ වගකීම් ප්‍රතිසංස්කරණ අංශය වෙත පැවරී ඇත.

**විශේෂ ඒකකය**

- අපරාධ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකමිටුව
- සිවිල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකමිටුව
- වාණිජ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකමිටුව
- යටිතල පහසුකම් සංවර්ධන පිළිබඳ අනුකමිටුව
- ඩිජිටල්කරණය සහ අධිකරණ ස්වයංක්‍රීයකරණය පිළිබඳ අනුකමිටුව

**විදේශ අරමුදල් මත සිදු කෙරෙන ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය**

- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) විසින් අරමුදල් සපයන ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාකාරකම් පිළිබඳ ව්‍යාපෘතිය (EET)
- යුරෝපා සංගමය (EU) විසින් අරමුදල් සපයන නීති ප්‍රතිසංස්කරණ වැඩසටහන (JORE)
- යුරෝපා සංගමය (EU) විසින් සහාය දක්වන ඵලදායී ආරවුල් නිරාකරණ ව්‍යාපෘතිය (SEDR)
- සංහිඳියාව සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය/SCOPE
- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) විසින් අරමුදල් සපයන SCORE ව්‍යාපෘතිය (සංහිඳියාව)
- කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (KOICA) සංකාව (GAD) සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය විද්‍යාත්මක ඖෂධ විශ්ලේෂණය පිළිබඳ ශක්‍යතා වර්ධනය

**පත්වීම් ලබාදීමේ ඒකකය**

- සාමදාන විනිශ්චයකාර
- දිවුරුම් කොමසාරිස්
- හදිසි මරණ පරීක්ෂක
- නිල නොලත් මහේස්ත්‍රාත්
- දිවුරුම්දුන් භාෂා පරිවර්තක

**විශේෂ ව්‍යාපෘති/පැවරුම්**

- අධිකරණ ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය
- වීඩියෝ සම්මන්ත්‍රණ ව්‍යාපෘතිය
- අධිකරණ සංචාර ව්‍යාපෘතිය
- ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම.

**3.6.1 <u>විශේෂ ඒකකය</u>**

**සිවිල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකමිටුව,**

- * සිවිල් නඩු විධාන සංග්‍රහයේ 154 අ වගන්තිය සම්බන්ධ පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කර ඇත.
- * සිවිල් නඩු විධාන සංග්‍රහයේ 167 වගන්තිය සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රතිපත්තිමය අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යවන ලදී.
- * යෝජිත ඩිජිටල් නීති පනතේ පරිච්ඡේද ගණනාවක් ඩිජිටල් නීති කමිටුව විසින් අවසානාත්මක ලෙස සකස් කරන ලදී.

| | |
|---|---|
| සිතාසි භාරදීම සහ ඇස්කිසි ක්‍රියාත්මක කිරීමේ සේවාවේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | සිතාසි නිකුත් කිරීම සහ භාරදීම පිළිබඳ සිවිල්/අපරාධ නඩු විධාන සංග්‍රහයේ වගන්තිය සංශෝධිත පනත් කෙටුම්පත කමිටුව විසින් සිදුකරන ලද අවසානාත්මක නිරීක්ෂණ ආපසු යවන ලද අතර, එය අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. |
| පරිවාස සහ කැපකරු මාපිය නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | කමිටුව, වාර්තාව අවසානාත්මක ලෙස සකස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි. |
| විදේශනඩු තීන්දු අන්‍යෝන්‍ය වශයෙන් බලාත්මක කිරීමේ ආඥා පනත සමාලෝචනය කිරීමේ උපදේශක කමිටුව | අවසානාත්මක වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. |
| නොතාරිස් ආඥාපනත සමාලෝචනය කිරීමේ උපදේශක කමිටුව | * බලවත් අකෘතඥතාව මත අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු අවලංගු කිරීමේ පනත සහ අන්තිම කැමතිපත්‍ර ආඥාපනත ගැසට් පත්‍රයේ පළකර ඇත. |
| | * නොතාරිස් ආඥාපනතේ ඇතැම් විධිවිධාන සඳහා සුළු සංශෝධන හඳුන්වා දීමට එකඟතාවය පළ වී තිබේ. |
| | * ලේඛන ලියාපදිංචි කිරීමේ පනත ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරමින් පවතියි. |
| | * ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත 2022.04.20 දිනට අමාත්‍ය මණ්ඩලය වෙත යැවීමට සූදානම් කර තිබුණි. |
| | * වංචා වැළැක්වීමේ ආඥාපනතට නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් සකස් කළ අවසානාත්මක කෙටුම්පත ලැබී තිබේ. |
| පවුල් නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | * විදේශීය දික්කසාද පිළිගැනීමේ පනතේ අවසානාත්මක කෙටුම්පත කමිටුව වෙත ලැබී ඇති අතර, ඒ සම්බන්ධ නිරීක්ෂණ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| | * නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යවන ලද විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ, අවසානාත්මක පනත් කෙටුම්පත කමිටුව විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

| | |
|---|---|
| ණය සහනදායක ආඥාපනත සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | කමිටුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන අවසානාත්මක පනත් කෙටුම්පත අපේක්ෂාවෙන් සිටියි. |
| ගෙවල් කුලී නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | කමිටුව අවසානාත්මක කෙටුම්පත අපේක්ෂාවෙන් සිටියි. |
| සභාධිපත්‍ය දේපළ නීතිය සමාලෝචනය සඳහා වන උපදේශක කමිටුව | වාර්තාව කෙටුම්පත් කරමින් සිටියි. |
| බෙදුම් නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | කමිටුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන අවසානාත්මක පනත් කෙටුම්පත අපේක්ෂාවෙන් සිටියි. |
| හිමිකම් ලියාපදිංචි කිරීමේ නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | අවසානාත්මක වාර්තාව අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, උපදේශන කමිටුව පිළිබඳ සාකච්ඡාව කල් දමන ලදී. |
| ඉඩම් නීතිය පිළිබඳ උපදේශක කමිටුව | |
| ඉඩම් සන්තකය කඩිනමින් අත්කර ගැනීම සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | ඉඩම් සන්තකය අත්කර ගැනීම පිණිස විධිවිධාන සැලසීම සඳහා පනතට අදාළ කෙටුම්පත සම්බන්ධයෙන් කමිටු සාමාජිකයින්ගේ නිරීක්ෂණ අපේක්ෂා කරනු ලැබේ. |
| මාධ්‍ය නියාමන සහ පෞද්ගලිකත්වය පිළිබඳ නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | විසුරුවා හරින ලදී. |

**වාණිජ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ අනුකමිටුව**

| | |
|---|---|
| විද්‍යුත් වානිජ නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | කාර්යභාර ලැයිස්තුව මත කටයුතු කරනු ලැබේ. |
| සාගර නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ විශේෂඥ මඬුල්ල | කාර්යභාර ලැයිස්තුව මත කටයුතු කරනු ලැබේ. |
| කම්කරු නීතිය සමාලෝචනය කිරීම සඳහා වන උපදේශක කමිටුව | සමාරම්භක නිර්දේශ ක්‍රියාත්මක කරමින් තිබේ. |
| ශ්‍රී51 ලංකාවේ බුද්ධිමය දේපළ නීතියට අදාළ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ විශේෂඥ මඬුල්ල | අදාළ නීතියට අවශ්‍ය ප්‍රතිසංස්කරණ කෙටුම්පත් කිරීම පිණිස තවදුරටත් අවධානය යොමු කළ යුතු කරුණු සහ සහතිකවීමක් උපදේශක කමිටුව වෙත ලබා දී ඇත. |
| සමාගම් නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ විශේෂඥ මඬුල්ල<br>ශ්‍රී ලංකාවේ බේරුම්කරණයට අදාළ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ විශේෂඥ මඬුල්ල | වර්තමානයේ කෙටුම්පත් කරමින් පවතී.<br><br>කමිටුව වෙත අවසානාත්මක වශයෙන් සකස් කරන ලද යෝජනා ලැබීමට නියමිතය. |

| | |
|---|---|
| බැංකු සහ මුදල් නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ විශේෂඥ මඩුල්ල | වර්තමානයේ කෙටුම්පත් කරමින් පවතී. |

**අපරාධ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ අනුකමිටුව**

| යෝජනාව | වර්තමාන තත්ත්වය |
|---|---|
| 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට යෝජිත සංශෝධන | මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් පදනම් කරගනිමින් අධිකරණ අමාත්‍යාංශයේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවේ නිරීක්ෂණ අපේක්ෂා කරනු ලැබේ. කමිටුවේ නිරීක්ෂණ මූල්‍ය විමර්ශන ඒකකයේ (FIU)සහ මුදල් අමාත්‍යාංශයේ අවධානයට යොමු කර ඇත. |
| **PODD** සඳහා යෝජිත සංශෝධන | පනත් කෙටුම්පත සකස් කිරීමේ දී කමිටුවේ නිරීක්ෂණ පිළිබඳව ද සළකා බලන ලදී. එම පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබේ. |
| ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | පනත් කෙටුම්පත සකස් කිරීමේ දී කමිටුවේ නිරීක්ෂණ පිළිබඳව ද සළකා බලන ලදී. ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් පිළිබඳව  වර්තමානයේ දී සමාලෝචනය කරනු ලැබේ. |
| අශ්ලීල ප්‍රකාශන තහනම් කිරීමේ පනත් කෙටුම්පත | කෙටුම්පත් කිරීමේ දී කමිටුවේ නිරීක්ෂණ සළකා බලන ලද අතර, අප්‍රේල් මුල් භාගයේ දී පනත් කෙටුම්පත පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ඇතැම් පාර්ශවකරුවන් කැඳවන ලදී. |
| අපරාධ නඩු විධාන සංග්‍රහයට යෝජිත සංශෝධන - පූර්ව නඩු විභාග කිරීම | නීතිය පනවන ලද අතර, කමිටුවේ ඇතැම් නිරීක්ෂණ ද සලකා බලා ඇතුළත් කරන ලදී. |
| අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට සහය දැක්වීම සහ ආරක්ෂා කිරීම වෙනුවට නව නීති ආදේශ කිරීම | කමිටුවේ නිරීක්ෂණ ද සළකා බලන ලද අතර, නීතිපතිවරයාගෙන් ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය අපේක්ෂා කරනු ලැබේ. |
| 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයට සංශෝධන (හඳුනාගත් අවස්ථානුගත තත්ත්ව යටතේ සැකකරුවෙකු/චූදිතයෙකු අධිකරණයේ පෞද්ගලිකව පෙනීසිටීම අවශ්‍ය නොවීම.) | කමිටුවේ යෝජනා පිළිබඳව ද සළකා බලනු ලැබේ. |

| | |
|---|---|
| අන්තරායකර සත්ත්ව ආඥා පනත | පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීමට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටඅමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය අපේක්ෂා කරනු ලැබේ. |
| සත්ත්ව හිංසන ආඥාපනත | යෝජිත සත්ත්ව සුබසාධන නීතිය මඟින් සත්ත්ව හිංසන ආඥාපනත පරිච්ඡින්න වීම යන කරුණ පදනම් කර ගනිමින්, අධිකරණ අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉවත් කර ගන්නා ලදී. (සත්ත්ව සුබසාධන නීතියේ පිටපතක් අපරාධ නීති ප්‍රතිසංස්කරණය සඳහා වන අනුකමිටුව වෙත ලබා දී ඇත.) |
| හෝටල් භාරකරුවන්ගේ වගකීම් ආඥාපනත | කමිටුවේ නිරීක්ෂණ විෂය පථයට අදාළ රේඛීය අමාත්‍යාංශය වන සංචාරක අමාත්‍යාංශයේ අවධානයට යොමු කිරීම සඳහා එකී අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. සංචාරක අධිකාරියේ අවධානයට යොමු කර ඇති අදාල ආඥාපනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියේ දී එම යෝජනා පිළිබඳ සලකා බලන බව අධිකරණ අමාත්‍යාංශය වෙත දන්වා ඇත. |
| ඇප පනතට යෝජිත සංශෝධන | ඉදිරියේ දී අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට නියමිතය. |
| ආගමන හා විගමන පනත සංශෝධනය කිරීම සඳහා නිර්දේශ | අදාළ දෙපාර්තමේන්තුවේ අවධානය සඳහා යොමු කර ඇත. |
| පුරාවස්තු ආඥාපනතට යෝජිත සංශෝධන | යෝජිත සංශෝධනය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලද අතර, අදාළ ආයතනය එම සංශෝධන සිදු කිරීම සඳහා එකඟතාවය පළකර නොමැත. |
| ගෘහස්ත ප්‍රචණ්ඩත්ව පනතට යෝජිත සංශෝධන | නිරීක්ෂණ, රේඛීය අමාත්‍යාංශය වන කාන්තා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. සිවිල් නීති ප්‍රතිසංස්කරණ සඳහා වන අනුකමිටුවේ නිරීක්ෂණ ද එම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. කාන්තා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම මත නිරීක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ දී රැස්වීමක් කැඳවන ලදී. රාජ්‍ය අමාත්‍යාංශය විසින් පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබාගැනීම පිණිස නීතිපතිවරයා වෙත යොමු කර ඇත. |
| අපරාධ නඩු විධාන සංග්‍රහයට යෝජිත සංශෝධන | අපරාධ නඩු විධාන සංග්‍රහයට සහ දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන යෝජනා කිරීම සඳහා යෝජිත සංශෝධනවල 1 වන කෙටුම්පත විශේෂ කමිටුවේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. නවතම කෙටුම්පත ද යොමු කර ඇත. |

**යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අනුකමිටුව**

- අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධන කිරීම සඳහා සහාය දැක්වීම.
- මාතර නව අධිකරණ සංකීර්ණය තුළ තවත් අතිරේක අධිකරණයක් පිහිටුවීමට යෝජනා කිරීම.
- රත්නපුර අධිකරණ සංකීර්ණය තුළ නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා කිරීම.
- අධිකරණ සංකීර්ණවල යටිතල පහසුකම් සම්බන්ධ ගැටලු හඳුනා ගැනීම.
- නීතිමය කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ගැටලු නිරීක්ෂණය කිරීම.

**ඩිජිටල්කරණය සහ අධිකරණ ස්වයංක්‍රීයකරණය සඳහා අනුකම්ටුව**

- ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ හැකියාව සාකච්ඡා කිරීම.
- ඔන්ලයින් තාක්ෂනයෙන් නඩු විමසීමට කලාපීය නීතිඥයින් හුරු කරවීම සඳහා ගත හැකි පියවර පිළිබඳ සාකච්ඡා කිරීම.

### 3.6.2 විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති

ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ලබාගත හැකි අංශ ඇතුළත් සවිස්තරාත්මක ලේඛනයක් විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යාලය විසින් සකස් කර ඇති අතර "ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ හමුව" අදාල රාජතාන්ත්‍රික සේවයේ සහ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ නියෝජිතයින් වශයෙන් අධ්‍යාපන අමාත්‍ය ජී.එල්.පීරිස්, අධිකරණ අමාත්‍ය එම්.යූ.එම්.අලි සබ්රි, නීතිපතිවරයා ඇතුළු විශේෂ අමුත්තන්ගේ සහභාගීත්වයෙන් 2021.04.01 දින හිල්ටන් හෝටලයේ දී පවත්වන ලදී. පසු විපරම් රැස්වීම් නිරතුරුව පවත්වනු ලබන අතර, අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රතිසංස්කරණ අංශය විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කරනු ලබයි.

ජාතන්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ හමුවෙන් පසුව, සෑම ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් වෙන වෙනම එක් එක් තැනැත්තන් වශයෙන් ගනිමින් අඛණ්ඩ සම්බන්ධතාවය පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා සාකච්ඡා කරන ලදී. තව ද, අමාත්‍යාංශය යටතේ දියත් කරනු ලබන විශාල ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කිරීම මෙම අංශය විසින් සිදුකරනු ලැබේ.

| ව්‍යාපෘතියේ නම (කෙටියෙන්) | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වියදම | ව්‍යාපෘති කාලය | වර්තමාන තත්ත්වය | ව්‍යාපෘතියේ ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|
| USAID -EEJ | කාර්යක්ෂම හා ඵලදායී අධිකරණ ව්‍යාපෘතිය | ඇමෙරිකා නුඩොලර් මිලියන 15 | වසර 5 (2022-2021) | ක්‍රියාත්මක කිරීමේ ලිපිය අත්සන් කිරීම | අරමුණු:<br>යුක්තිය පසිඳලීම ශක්තිමත් කිරීම.<br>සුදුසුකම් සහ අධිකරණ යාන්ත්‍රණයේ ක්‍රියාකාරීන්ගේ වෘත්තීයභාවය ශක්තිමත් කිරීම. |
| USAID - SCORE | සමාජ ඒකාබද්ධතාවය සහ ප්‍රතිසන්ධාන ව්‍යාපෘතිය | ඇමෙරිකා නුඩොලර් මිලියන 19 | වසර 5 (2018-2023) | ක්‍රියාත්මක කිරීමේ ලිපිය අත්සන් කර ඇති අතර වර්තමානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. | 1. ඒකාබද්ධතාවයේ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීම.<br>2. සමාජ ආර්ථික අසමානතාවයන් අඩු කිරීම.<br>3. ප්‍රජා විශ්වසනීයභාවය වැඩි දියුණු කිරීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| EU - JURE | අධිකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන | යුරෝ මිලියන 18(EU) සහ යුරෝ මිලියන 1 (UN) UNDP:යුරෝ මිලියන 11 UNICEF යුරෝ මිලියන | වසර 4.5 (2022-2026) | ආරම්භක අදියර කැමැත්තක් දක්වන්නන් උපදේශනය සිදුවෙමින් පවතී. (ද්විපාර්ශවීය සහ තේමාගත) ප්‍රමුඛතාකරණය සහ මැදිහත් වීම සහ මැදිහත් වීමේ උපායමාර්ගික ගැටීම් සම්බන්ධිත සහයෝගය දීර්ඝ කර ඇත. | ප්‍රතිඵලය1: සැමට යුක්තියට ප්‍රවේශ වීම වැඩිදියුණු කර ඇත. සුවිශේෂී කාන්තාවන්, දරිද්‍ර තැනැත්තන් සහ අවදානම් තත්ත්වවලදී සිටින තැනැත්තන්.<br><br>ප්‍රතිඵලය 2: වගවීම, විනිවිදභාවය සහ අධිකරණ පද්ධතියේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම.<br><br>ප්‍රතිඵලය 3: අධිකරණ කාර්යක්ෂමතාවය සහ තත්ත්වය වැඩිදියුණු කර ඇත. |
| EU-SCOPE | ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාව සහ සාමය ශක්තිමත් කිරීම | යුරෝ මිලියන 11 (යුරෝ මිලියන 8, යුරෝ මිලියන 3 AA) | වසර 3 (2022-2025) | PSF නිර්දේශ කිරීම සඳහා NDPවෙත ඉදිරිපත් කර ඇත. (මේ පිළිබඳ සංශෝධන සහ සාකච්ඡා සිදුවෙමින් පවතී) | 1. ප්‍රචණ්ඩත්වය සහ වර්ජනයට පිළිතුරු දීමේ දී සමාජ සහ ආයතනික විශ්වසනීයභාවය සහ ධාරිතාවයන් ශක්තිමත් කර ඇත.<br>2. තොරතුරු පාදක රාජ්‍ය කථිකාව, අනුකූලත්වය බහුත්වය ශක්තිමත් කර ඇත.<br>3. ආර්ථික දිරිගැන්වීම් සහ අන්තර් ජනවාර්ගික සහයෝගය ජාතික සමථ මූල වැඩසටහන. |
| EU-SEDR | කාර්යක්ෂම ආරවුල් විසඳීම (SEDR) සහයෝගය දීම සමථමූල මණ්ඩල කොමිෂන් සභාව (SIRIDE ව්‍යාපෘතිය යටතේ) | යුරෝ මිලියන 7 | (2020-2024) | අමාත්‍ය මණ්ඩල සංදේශය - MBC සඳහා මූල්‍ය සහයෝගය | අධිකරණ අමාත්‍යාංශයට සහ සමථ මූල මණ්ඩල කොමිෂන් සභාවට සහයෝගය ජාතික සමථ මූල වැඩසටහන |

| | | | | | |
|---|---|---|---|---|---|
| KOICA | අධිකරණ විද්‍යා ඖෂධවල ධාරිතා ගොඩනැගීම ශක්තිමත් කිරීම.<br><br>ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතිය පිළිබඳ විශ්ලේෂණය | ඇමෙරිකානු ඩොලර් මිලියන 4 | වසර 4 (2021-2024) | ව්‍යාපෘතිය වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතී. | 01. මාදක ඖෂධ සහ අධිකරණමය විද්‍යා විෂවේදය පරීක්ෂණාගාරවල පරීක්ෂණාගාර උපකරණ වැඩිදියුණු කිරීම.<br><br>02. අන්තරායකර ඖෂධ සහ අධිකරණ වෛද්‍ය විද්‍යා විෂවේදය පිළිබඳ පුහුණු ලබා දීම.<br>03. ඩිජිටල්කරණය විශ්ලේෂණ ක්‍රියාවලිය සහ සාක්ෂි කළමනාකරණය |
| JICA | ශ්‍රී ලංකාවේ යුක්තියට ඇති සාධාරණ ප්‍රවේශය සවිබල ගැන්වීම. | JPY මිලියන 60 | | PSF විසින් NDP වෙත ඉදිරිපත් කර ඇත. | |
| PR 01 | යාපනය දිස්ත්‍රික්කය තුළ වැසි ජලය රැස් කිරීමේ ටැංකි 2889 ක් ඉදි කිරීම | ශ්‍රී ලංකා රුපියල් 299,011,991 | අවුරුදු 3 ට අත්සන් කර ඇත. 2024 දක්වා දීර්ඝ කර ඇත. | අමාත්‍ය මණ්ඩල සංදේශය - අවබෝධතා ගිවිසුම කාලය දීර්ඝ කිරීම | |
| ICRC | යටිතල පහසුකම් ව්‍යාපෘති | | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතියි. | • ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධනය<br>• පීඩන තත්ත්වය සහ නිදහස අහිමි තැනැත්තන්ට සැලකීම සමාලෝචනය<br>• අතුරුදන් වූ තැනැත්තන්ගේ ගැටලුව සඳහා තාක්ෂණික සහාය.<br>• අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට මානසික, ජීවනෝපාය සම්බන්ධයෙන් අත්වැළක් වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| UNODC | ශ්‍රී ලංකාවේ දුරස්ථ අධිකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය: ඔන්ලයින් නඩු විභාග කිරීම් සහ ජංගම දුරකථන | ඇමෙරිකානු ඩොලර් 520000 | 2020-2022 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතියි. | කෙරෙමින් පවතින ව්‍යාපෘති:<br>1. සංක්‍රාන්ති කලාප ක්‍රියාකාරීත්වය සහ සංක්‍රමණික ජාවාරමට එරෙහි ප්‍රතිචාර සවිබල ගැන්වීම (STARSOM)/Canada 2021 මාර්තු - 2022 දෙසැම්බර් ඇමෙරිකානු ඩොලර් 200,000.<br>2. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම- යුක්තියට ප්‍රවේශය ප්‍රවර්ධනය සහ කාන්තාවන්ට නීති සහය PBF/ 2020 දෙසැම්බර්- 2022 ජූනි. ඇමෙරිකානු ඩොලර් 350,000.<br>3. බන්ධනාගාරගත තැනැත්තන් අතර කොවිඩ් - 19 ආසාධනය වීම කළමනාකරණය කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ව්‍යාකූලභාවයට පත් තැනැත්තන්ට සහාය දැක්වීම. INL/ 2020 සැප්.-2022 අගෝ./ඇ.ඩො. 500,000.<br>4. ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ දුරස්ථ ක්රියාකාරීත්වය ප්‍රවර්ධනය මාර්ගගත නඩු විභාග කිරීම සහ ජංගම අධිකරණ/ INL/2021 අප්‍රේල් - 2025 ජනවාරි. ඇ.ඩො.200,000.<br>5. MLE නියෝජිතායතනවල සහ නෛතික පුහුණු පවත්වමින් සමුද්‍රීය අපරාධ පිළිබඳ සෙවීම, පරීක්ෂණ පැවැත්වීම සහ නඩු පැවරීම සම්බන්ධයෙන් අපරාධ යුක්ති බලධාරීන්ගේ ශක්‍යතා වර්ධනය. INL/2020 සැප්.-2023 අප්‍රේල් ඇ.ඩො. 45,000. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ABD | වාණිජ නීතිය ආයෝජන සහ කොන්ත්‍රාත් බලාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නීති අංශයේ කාර්යක්ෂමතාව සවිබල ගැන්වීම. | | | නවීනතම නේවාසික වැඩමුළු කිහිපයක ස්වරූපයෙන් මෙම සාකච්ඡා සහ සමාලෝචන සංවිධානය කිරීමට අධිකරණ අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව අපේක්ෂා කරයි. | |

**3.6.3 <u>පත්කිරීම් අංශය</u>**

**සාමදාන විනිශ්චයකාර**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාමදාන විනිශ්චයකරුවන් පත්කරනු ලැබේ.

**දිවුරුම් කොමසාරිස්**

දිවුරුම් දීමේ ආඥාපනතේ 12(1) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් දිවුරුම් කොමසාරිස් වශයෙන් පත්කරනු ලැබේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අමාත්‍යාංශ වෙබ් අඩවිය හරහා දිවුරුම් කොමසාරිස් ධුරයට අයදුම් කිරීමට පහසුකම් සළසන ලද අතර, පත්කරන ලද නීතිඥවරුන්ගේ නම් ලැයිස්තුව වෙබ් අඩවියේ පළ කරන ලදී.

**හදිසි මරණ පරීක්ෂක**

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 108 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් හදිසි මරණ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණ පැවැත්වීම සඳහා හදිසි මරණ පරීක්ෂකවරු පත්කරනු ලැබේ. කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට නොහැකි වූ අතර තාවකාලික පදනම යටතේ හදිසි මරණ පරීක්ෂකවරු පත් කිරීමට පියවර ගන්නා ලදී. සියලුම පරීක්ෂකවරුන්ගේ දත්ත ඇතුළත් දත්ත සංහිතාවක් අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද අතර, හදිසි මරණ පරීක්ෂකවරුන්ට එරෙහිව මහජන පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ඔන්ලයින් තාක්ෂණයෙන් පැමිණිලි කළමනාකරණ පද්ධතියක් ද හඳුන්වා දී ඇත.

**නිල නොලත් මහේස්ත්‍රාත්**

අධිකරණ අමාත්‍යවරයා විසින් මහාධිකරණ විනිශ්චයකාරවරයින්ගේ නිර්දේශ මත නිලනොලත් මහේස්ත්‍රාත්වරුන් පත් රනු ලැබේ.

**දිවුරුන් දුන් භාෂා පරිවර්තක**

ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් පත් කරනු ලැබේ.
නව පත්වීම් ප්‍රදානය 2022.01.01 සිට 2022.09.30 දක්වා සිදු කෙරේ.

| පත්වීම | ප්‍රමාණය |
|---|---|
| සාමදාන විනිශ්වයකාර | 2434 |
| දිවුරුම් කොමසාරිස් | 348 |
| හදිසි මරණ පරීක්ෂක | 16 |
| නිල නොලත් මහේස්ත්‍රාත් | 18 |
| දිවුරුම් දුන් භාෂා පරිවර්තක | 167 |

### 3.6.4 විශේෂ ව්‍යාපෘති/පැවරුම්

**අධිකරණ ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය**

අධිකරණ ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය, තාක්ෂණික අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අතර 2021 පෙබරවාරි මස අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

අධිකරණ අමාත්‍යාංශය විසින් e-8 ගොනු පද්ධතිය, නඩු කළමනාකරණ පද්ධතිය සහ නඩු පිටපත් පද්ධතිය සහිත අධිකරණ කෘත්‍යයන් සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයකරණය කිරීම ඉලක්ක කරගත් අධිකරණ ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සාර්ථකව අවසාන කර ඇත. පූර්ව යෝග්‍යතා ක්‍රියාවලියකින් පසුව, ලංසු කැඳවීමේ ලියවිලි පූර්ව යෝග්‍යතා සහිත ලංසුකරුවන් වෙත නිකුත් කරන ලදී.

ව්‍යාපෘතියේ නියමු අදියර සහ II අදියරේ දී අධිකරණ ශාලා 100 ක් ආවරණය කරනු ලැබේ. ඉතිරි අධිකරණ ව්‍යාපෘතියේ III අදියරේ දී ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය සඳහා උපදේශන දායකත්වය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ලබාදෙනු ලැබේ.

2021 වර්ෂයේ දී පාර්ශ්වකරුවන් සඳහා උපදේශන වැඩමුළු අධිකරණ සේවා කොමිෂන් සභාව, විනිශ්වයකාරවරයින්, රෙජිස්ට්‍රාර්වරුන්, පොලිස් දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය ආදී අදාල පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. නවෝත්පාදක ප්‍රවේශයකට අවතීර්ණ වෙමින් පූර්ව යෝග්‍යතා ප්‍රතිචාර මාර්ගගත ක්‍රමයට ලබාගත් අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ බොහෝමයක් රැස්වීම් ඔන්ලයින් තාක්ෂණ ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන වැඩමුළු ගණනාවක් ද මාර්ගගත වැඩමුළු වශයෙන් පවත්වන ලදී.

**වීඩියෝ සම්මන්ත්‍රණ ව්‍යාපෘතිය**

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි, අධිකරණ 23 ක් සහ බන්ධනාගාර පරිශ්‍ර 12 ක් අතර වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ස්ථාපිත කිරීම සඳහා වන ගිවිසුමක් ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත ප්‍රදානය කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් අධිකරණ සහ බන්ධනාගාර Lanka Government Network හරහා සම්බන්ධ අතර, වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම Lanka Government Cloud මඟින් සළසනු ලැබේ.

| | |
|---|---|
| අධිකරණ ස්වයංක්‍රියකරණය | • ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පිණිස 2022 පෙබරවාරි 03 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.<br>• 2022 පෙබරවාරි 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එය අනුමත කරන ලදී.<br>• පශ්චාත්-යෝග්‍යතා ඉදිරිපත් කිරීම 2022 මාර්තු 16 දින පවත්වන ලද අතර, ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් හි හවුල් ව්‍යාපාරයක් විසින් ඉදිරිපත් කරන ලදී.<br>• අංක 2022/03 දරන 2022.04.26 දිනැති අයවැය චක්‍රලේඛනයේ 3(ii) වගන්තිය යටතේ රටේ පවතින මූල්‍ය තත්ත්වය හේතු කොට ගෙන ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන් දැනුවත් කිරීමේ ප්‍රකාශය සකස් කරමින් පවතියි. |
| වීඩියෝ සම්මන්ත්‍රණ ව්‍යාපෘතිය | • අධිකරණ අමාත්‍යාංශය සහ තාක්ෂණික අමාත්‍යාංශය විසින් මූල්‍ය උද්ධමනය හේතුවෙන් පිරිවැය ඉහළ යාම වැළැක්වීම පිණිස ව්‍යාපෘතියේ පරිමාණය අඩු කිරීමට තීරණය කරන ලදී.<br>• වීඩියෝ සම්මන්ත්‍රණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන සමාලෝචිත යෝජනාව සඳහා TEC හි නිර්දේශ අපේක්ෂා කරනු ලැබේ.<br>• පරිත්‍යාගශීලියෙකුගේ සහය අපේක්ෂා කරනු ලැබේ. |

**අධිකරණ සංචාර ව්‍යාපෘතිය**

අධිකරණවල පවතින හදිසි ප්‍රතිසංස්කරණ සහ උපකරණ අවශ්‍යතා හඳුනාගැනීම පිණිස අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අධිකරණ අමාත්‍යාංශය විසින් හදිසි අවශ්‍යතා හඳුනා ගැනීමට සෑම අධිකරණයකම සංචාරය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් දියත් කර ඇත. මෙම වැඩසටහන යටතේ අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් අධිකරණවල සංචාරය කිරීම සඳහා යොදා ගනු ලැබේ. වැඩසටහනේ පළමු අදියර මේ වන විට අවසන්ව ඇති අතර, අධිකරණ කලාප 10 පවතින හදිසි දැව භාණ්ඩ සහ උපකරණ අවශ්‍යතා කඩිනමින් සපුරාලන ලදී. අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 40 ක දැව භාණ්ඩ සහ කාර්යාල උපකරණ සපයා දෙන ලදී. ඒ අතරතුර, වැඩසටහන මඟින් හඳුනාගන්නා ලද හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා සිදු කරනු ලැබේ.

**ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය**

ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය, මනා පරිචයක් සහිත හවුල්කරුවෙකුගේ කළමනාකරණ හවුල්කාරිත්වය සමඟ ස්වාධීන සහ ස්වයං පැවැත්මක් සහිත ආයතනයක් බවට ප්‍රවර්ධනය වී තිබේ. එමඟින්, අනාගතයේ දී වරාය නගරයේ උද්ගත වන බේරුම්කරණ අවශ්‍යතා සඳහා සේවය සැලසීමට අපේක්ෂා කරනු ලැබේ. උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අභිලාෂය දක්වන ප්‍රකාශ කැඳවන ලද අතර, උපයෝගී කර ගත හැකි හොඳම කළමනාකරණ ආකෘතිය පිළිබඳ තීරණය කිරීම සඳහා විශේෂ නිල කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලදී. මේ අතරතුර, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සමඟ මේ සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සැළසෙන හවුල්කාරිත්වයක් ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම සඳහා සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය තුළ ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා හවුල්කාරිත්වයක් ආරම්භ කිරීම පිණිස කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව, අධිකරණ අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමට එකඟ වන ලදී. තව ද, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අධිකරණ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 3.7 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය

### 3.7.1 හැඳින්වීම

බන්ධනාගාර කටයුතු අංශය මගින් බන්ධනාගාර පරිපාලනය පුළුල් ප්‍රතිසංස්කරණයකට ලක්කොට බන්ධනාගාර නිලධාරීන්ගේ වෘත්තීය ගැටළු විසඳමින් සිරගත වූ අය නිදහස් වන විට යහපත් පුරවැසියන් ලෙස සමාජයට අනුගත කිරීමේ අරමුණින් පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් විධිමත් ආකාරයට සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම සිදුකරයි. තවද බන්ධනාගාර තදබදයට හඳුනාගත් ප්‍රධානම විකල්පය වශයෙන් ප්‍රජා විශෝධන ක්‍රමය පුළුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම මෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී අධිකරණ මගින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙත යොමුකරනු ලැබූ පුද්ගලයින් සමාජයට වැඩදායී පුද්ගලයන් ලෙස පුනරුත්ථාපනය කිරීමත්, පුනරුත්ථාපන කාලය අවසන් වී සමාජගත වීමෙන් අනතුරුව ඔවුන්ගේ ජීවිත සාර්ථක කරගැනීමට ආර්ථික, සාමාජීය හා සුබසාධන කටයුතු ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම සිදුකරයි. ඒ අනුව පහත සඳහන් කාර්යයන් මෙම අංශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

I. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු
II. බලපත්‍ර මත සිරකරුවන් නිදහස් කිරීමේ කටයුතු
III. බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කළ සිරකරුවන් පිළිබඳ කටයුතු
IV. සිරකරුවන් නිවාස නිවාඩු යැවීමට අදාල කටයුතු
V. නිදහස් වීමට නියමිත තරුණ වරදකරුවන්ගේ ගොනු සමා අනුමැතියට ඉදිරිපත් කිරීම
VI. කොන්දේසි උල්ලංඝනය කළ තරුණ වරදකරුවන් සම්බන්ධ කටයුතු
VII. බන්ධනගාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට අදාල ඉඩම් අත්පත් කරගැනීම, පවරාගැනීම හා සන්තකය ආපසුගැනීමේ හා නිදහස් කිරීමේ කටයුතු
VIII. බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ ඉදිකිරීම්වලට අදාල කටයුතු
IX. බන්ධනාගාර නිලධාරීන්ගේ ඇප තීරණය කිරීම සම්බන්ධ කටයුතු
X. සිරකරු ඉල්ලීම්වලට අදාල කටයුතු
XI. බන්ධනාගාර ආයතනවල වීක්ෂණ කමිටු පිළිබඳ කටයුතු
XII. සිරකරුවන්ගේ සමාලෝචන වාර්තා ඉදිරිපත් කිරීමට අදාල කටයුතු
XIII. සිරකරුවන්ගේ තදබදය අවම කිරීමට සමාලෝචන ක්‍රමවේදයක් හා විශේෂ සමාව ප්‍රදානය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමේ හා ඒ යටතේ සිරකරුවන් නිදහස් කිරීම හා දඬුවම් කාලය අඩු කිරීමේ කටයුතු
XIV. සිරකරුවන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා පුළුල් ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම
XV. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කිරීම
XVI. අමාත්‍යාංශය යටතේ ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අදාල නිලධාරීන්ගේ සියළුම ආයතනික හා විනය කටයුතු

### 3.7.2 2022.01.30 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය

**3.7.2.1 නගර මධ්‍යයේ පිහිටුවා ඇති බන්ධනාගාර නගරයෙන් බැහැර ප්‍රදේශවලට විතැන් කිරීම**

ඉතා ඉහළ රැඳවි තදබදයක් සහිත වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිල්ලෑව ප්‍රදේශයට විතැන් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ වැලිකඩ බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, කාන්තා අංශය හා බන්ධනාගාර රෝහල එම භූමියේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. බන්ධනාගාර මූලස්ථානය ද බත්තරමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා මෙම අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

තංගල්ල බන්ධනාගාරය අගුණකොළපැලැස්සට විතැන් කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 4,656ක මුදලක් වැය වී ඇත.

**3.7.2.2 විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම**

සිරකරුවන්ගේ තදබදය අවම කිරීම සඳහා පොදු සමාව ලබාදීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සිදුකර ඇත. මේ යටතේ නිදහස් වීමට හෝ දඬුවම් කාලය අඩු කිරීමට සුදුසුකම් ලැබූ සිරකරුවන්ගේ තොරතුරු හා මරණ දඬුවම ජීවිතාන්තය දක්වා පරිවර්තනය කිරීමේ කමිටුව නිර්දේශ කර ඇති සිරකරුවන්ගේ වාර්තා මෙම අමාත්‍යාංශය හරහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර ඇත.

**3.7.2.3 විශේෂයෙන් හඳුනාගත් රැඳවියන් අධි ආරක්ෂිත බන්ධනාගාර වෙත යොමුකිරීම**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙන්ම මෙම අමාත්‍යාංශය ද මුහුණ දුන් ප්‍රධානතම අභියෝගයක් වූයේ බන්ධනාගාර තුළ සිටින රැඳවියන් විසින් අපරාධ මෙහෙයවීම, මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකිරීම, කප්පම් ගැනීම හා වෙනත් නීති විරෝධී කටයුතු සිදුකිරීමයි. මේ වන විට එම නීති විරෝධී කටයුතු මැනවින් පාලනය කර ඇති අතර එවැනි කටයුතු සිදුකරනු ලබන බවට හඳුනාගත් රැඳවියන් බූස්ස බන්ධනාගාරය වෙත මාරු කර අධි ආරක්ෂිත සිරමැදිරි තුළ රඳවා ඇත. විශේෂයෙන්ම නීති විරෝධී කටයුතු සිදුකරන බවට තොරතුරු ලැබෙන රැඳවියන් ආරක්ෂිතව ඉදිකර ඇති අගුණකොලපැලැස්ස වැනි බන්ධනාගාරවල රඳවා බන්ධනාගාර නිලධාරීන්ගේ හා පොලිස් විශේෂ කාර්යය බලකායේ නිලධාරීන්ගේ අධීක්ෂණය හා ආරක්ෂාව යටතේ රැඳවීමට කටයුතු කර ඇත.එමෙන්ම අගුණකොලපැලැස්ස,බූස්ස සහ අනෙකුත් බන්ධනාගාර තුළ ජංගම දුරකතන භාවිතය පාලනය කිරීමට කටයුතු කර ඇත.

**3.7.2.4 වීරවිල මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.**

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවී බන්ධනාගාර ගතකරන රැඳවියන් ප්‍රමාණය දිනෙන් දින ඉහල යාම අධික බන්ධනාගාර තදබදයට ද ප්‍රධාන හේතුවක් ලෙස මෙම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. මේ තත්ත්වය තුළ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී වරදකරුවන් වන පුද්ගලයන්ට විධිමත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉතා අපහසු වේ. මීට පිළියමක් වශයෙන් වීරවිල බන්ධනාගාරය තුළ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී වරදකරුවන් වන පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත. මේ සඳහා 2022 අගෝස්තු 31 දින වන විට රුපියල් මිලියන 11.5ක් වැය කර ඇත.

### 3.7.2.5 බලපත්‍ර මත සිරකරුවන් නිදහස් කිරීම හා යහපත් හැසිරීම මත සිරකරුවන්ගේ දඬුවම් කාලය ලිහිල් කිරීම

බන්ධනාගාර තුළ යහපත් හැසිරීමක් සහිතව තම පුනරුත්ථාපන කටයුතු ඉතා හොඳින් සිදුකළ සිරකරුවන් විශාල ප්‍රමාණයකට නිදහස ලබාදීම 2022 වර්ෂයේදී සිදුවිය. ඒ අනුව සිරකරුවන් බලපත්‍ර මත නිදහස් කිරීම, යහපත් හැසිරීම මත සිරකරුවන්ගේ දඬුවම් කාලය ලිහිල් කිරීම මෙන්ම සිරකරුවන් නිවාස නිවාඩු යැවීම ද සිදුවිය.

| අනු අංකය | දඬුවම ලිහිල් කළ ආකාරය | නිදහස් වූ සංඛ්‍යාව 2022.01.01 – 2022.09.30 |
|---|---|---|
| 1. | බලපත්‍ර මත නිදහස් කිරීම | 42 |
| 2. | නිවාස නිවාඩු යැවීම | 247 |
| 3. | යහපත් හැසිරීම මත නිදහස් කිරීම | 227 |
| 4. | විශේෂිත දිනවලදී සිරකරුවන් නිදහස් කිරීම | 1,017 |
| **එකතුව** | | 1,533 |

### 3.7.2.6 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ ඉදිකිරීම්

2022 වර්ෂය තුළ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ පහත ඉදිකිරීම් අවසන් කර ඇත.

| අනු අංකය | ඉදිකිරීම | මුළු වියදම (රු.) |
|---|---|---|
| 1. | කන්දකාඩු රෝහලෙහි ඉතිරි වැඩ නිමකිරීමේ සේවාව | 2,532,196.96 |
| 2. | කන්දකාඩු මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධති 03 ඉදිකිරීමේ සේවාව | 1,849,750.00 |
| 3. | සේනපුර මධ්‍යස්ථානයේ පොලිස් නේවාසිකාගාරය ඉදිකිරීම | 15,777,000.00 |
| 4. | සේනපුර මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනලාභීන් සඳහා ස්නානය කිරීමේ ස්ථානයක් ඉදිකිරීම | 18,735,000.00 |
| 5. | සේනපුර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය, සකාස කාර්යාලය අළුත්වැඩියා කිරීම | 3,444,000.00 |
| 6. | ඉරහඳකෙටුවැව පුනරුත්ථාපන භූමිය වටා ආරක්ෂිත වැට ඉදිකිරීම | 3,884,271.00 |

### 3.7.2.7 බන්ධනාගාර පරිපාලනයේ ප්‍රතිසංස්කරණ

බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් සිදුකරන සේවාවන් කාලීන අවශ්‍යතාවයන්ට අදාලව නැවත සකස් කිරීම හා සමස්ත දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාව මීට පෙර හඳුනාගෙන තිබූ බැවින් ඒ අනුව 2022 වර්ෂයේදී වෘත්තීය සුදුසුකම්වලින් යුතු කාර්ය මණ්ඩලයක් බඳවාගැනීමේ පියවරක් ලෙස බන්ධනාගාර කොමසාරිස් තනතුරේ පුරප්පාඩු 05ක් පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර අදාල ගොනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර සහකාර බන්ධනාගාර අධිකාරී (විනය) තනතුරේ 18 දෙනෙකු බඳවාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත.

### 3.7.3 ඉදිරි සැලසුම්

1. 2020 නොවැම්බර් මස 29 වන දින මහර බන්ධනාගාරයේ හටගත් නොසන්සුන්කාරී තත්ත්වය මත බන්ධනාගාර අධිකාරී කාර්යාලය, යාබද ගොඩනැගිල්ල, සුබසාධක ගොඩනැගිල්ල, ප්‍රධාන ගබඩාව, බන්ධනාගාර රෝහල හා මුළුතැන්ගෙයි උපකරණ විනාශ විය. මෙම නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව විමර්ශනය සඳහා පත්කළ පංච පුද්ගල කමිටුව විසින් බන්ධනාගාර තදබදය වැළැක්වීම සඳහා වූ නිර්දේශ, රැඳවියන්ගේ සුබසාධනය සඳහා වූ නිර්දේශ හා බන්ධනාගාර පරිපාලනය සඳහා වූ නිර්දේශ යන කරුණු තුන යටතේ සිය නිර්දේශ ඉදිරිපත් කර ඇත. එහිදී බන්ධනාගාර පරිපාලනය සඳහා වූ නිර්දේශ අතර නැවත මෙවැනි තත්ත්වයක් උද්ගත වුවහොත් සිදුවිය හැකි හානි අවම කරගත හැකි වන පරිදි බන්ධනාගාරය තුළ පිහිටා ඇති කාර්යාල, ගබඩා හා බෙහෙත් ශාලා බන්ධනාගාර භූමියේ සිරකරුවන් සිටින ප්‍රදේශයෙන් පිටත ස්ථාපනය කිරීම කළ යුතු බව නිර්දේශ කර ඇත. ඒ අනුව විනාශයට පත්වූ ගොඩනැගිලි බන්ධනාගාර භූමියේ පිටත ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන ඇති අතර 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2. බන්ධනාගාර ආයතනවලින් අප ජලය අවිධිමත් ආකාරයට බැහැර කිරීම නිසා එම ආයතන පිහිටි ප්‍රදේශ ආශ්‍රිත පරිසර පද්ධතිවලට බලපෑම් ඇති වී තිබෙන බව බොහෝමයක් පැමිණිලි ලැබී ඇත. මෙම තත්ත්වය සිරකරුවන්ගේ සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ද ගැටළු මතුකිරීමට හේතු වී ඇත. මෙම තත්ත්වයට විසඳුමක් ලෙස බන්ධනාගාර ආයතනවල මළ හා අපජලය ප්‍රවාහන පද්ධතීන් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් 2023 ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබේ.

3. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හිඟයට පිළියමක් වශයෙන් බන්ධනාගාර අධිකාරී හා සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමටත්, II පෙළ ජේලර්, II පෙළ පුනරුත්ථාපන නිලධාරී හා සහකාර බන්ධනාගාර අධිකාරී මෙන්ම සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) යන තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සැකසූ බඳවාගැනීමේ පටිපාටි අනුමත කරවා ගැනීමට අපේක්ෂිතය.

4. බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා විකල්ප විසඳුමක් ලෙස ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය හඳුන්වා දී ඇත. ප්‍රජා පාදක විශෝධනය සඳහා සුළු වැරදිකරුවන් යොමුකිරීමෙන් එම පුද්ගලයාගේ රැකියාව, පවුල, සමාජ තත්ත්වය ආරක්ෂා වීමක් සිදුවේ. මානසික හා ශාරීරික සෞඛ්‍යය යහපත් වනවා මෙන්ම බන්ධනාගාරගත වීමක් සිදුනොවන නිසා වරදකරුවන් වෙනත් බරපතල වරදකරුවන් සමඟ මුහුවීමක් සිදුනොවන බැවින් ඔවුන් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීම වළක්වාගත හැකිය. එහෙයින් බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වඩාත් සාධනීය ලෙස යොදවා ගැනීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරමින් පවතී. මේ යටතේ 2023 වර්ෂයේදී ප්‍රජා විශෝධන ආඥා ප්‍රමාණය 15,000ක් දක්වා වර්ධනය කරගැනීමට අපේක්ෂිතය.

## 3.8 ජාතික ඒකාබද්ධතා අංශය

### 3.8.1 හැඳින්වීම

**1. ජාතික ඒකාබද්ධතා අංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්.**

i. රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කරලීම හා ඒ සඳහා ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම.
ii. ජාතික ඒකාබද්ධතාව තහවුරු කිරීමට බලපාන බාධක හඳුනා ගැනීම හා ඒ සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සහයෝගීත්වයෙන් ක්‍රියා කරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය
iii. ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාකරනු ලබන අදාළ වැඩසටහන් හා ව්‍යාපාති අධීක්ෂණය හා ඇගයීම
iv. ජාතීන් අතර සහයෝගීතාව සහ සහජීවනය ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම
v. ප්‍රධාන ජාතික භාෂාවන් හා සන්ධාන භාෂාව උපයෝගී කරගනිමින් ජාතීන් අකර සංස්කෘතික, සමාජමය හා ආගමික පසුබිම අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම

**2. ජාතික ඒකාබද්ධතා අංශය මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**

ජාතික ඒකාබද්ධතා අංශය මඟින්, ජාතීන් අතර සහයෝගිතාවය සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීමට සහ ජාතීන් අතර සංස්කෘතික, සමාජීය හා ආගමික පසුබිම අන්‍යොන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමට අදාලව ශ්‍රී ලාංකේය සමාජයේ ජීවත්වන සියලු ජනවර්ග සහ ජන කණ්ඩායම් වල උරුමයන්, අනන්‍යතාවයන් සහ සංස්කෘතීන් ආරක්ෂා කරමින් වැඩසටහන් පැවැත්වීම සිදුකරනු ලබයි. 2022 වර්ෂය සඳහා අනුමත අයවැය අනුව ප්‍රධාන ව්‍යාපෘති හතරක් යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබේ.

### 3.8.2 ජාතික ඒකාබද්ධතා අංශය මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල ප්‍රගතිය (2022.09.30 දිනට)

**1. සහජීවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - වැය ශීර්ෂය - 110-01-05-02-2509**

විවිධ ජනවර්ගයන් අතර ඒකාබද්ධතාව, සහජීවනය හා සංහිඳියාව ඇති කිරීම සඳහා සංස්කෘතිය, කලාව, භාෂාව, ආගම හා ක්‍රීඩාව යොදා ගැනීම සහ ආන්තිකරණයට ලක් වූ පිරිස් සවිබල ගැන්වීම වැනි පුළුල් පරාසයන් ඔස්සේ විහිදී ඇති අරමුණු සහිතව සමාජයේ බිම් මට්ටමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි දී සිදුවේ.

**ආන්තිකරණයට ලක් වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම**

දැයේ සියලු දරුවන්ට අධ්‍යාපන අයිතිය ලබා දීමේ දී ආර්ථික,සමාජීය, විෂමතාව හෝ වාර්ගිකභාවය, ආගම හෝ කුලය නිසා හෝ කිසිදු අසාධාරණයක් හෝ ආන්තිකරණය වීමක් (කොන්වීමක්) සිදුවීම වැළැක්වීම සඳහා අවධානය යොමු කිරීම වැදගත්වේ.



දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ආන්තිකරණයට ලක් වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම සඳහා පාසල් උපකරණ බෙදාදීම

දරිද්‍රතාවය, අබාධිත බව හෝ වෙනත් හේතුවක් මත ආන්තීකරණයට ලක්ව සිටින දරුවන් හා දුෂ්කර පාසල් ළමුන්ට සමාන්‍ය දරුවකුට මෙන් සමාන අධ්‍යාපන අවස්ථාවන් ලබා ගැනීමේදී ඊට අදාළ පහසුකම් සලසා ගැනිමේදී විවිධ දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදුවේ. ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා අදාළ අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් යම් ප්‍රමාණයකින් හෝ ලබා දිම මෙමඟින් අපේක්ෂා කෙරේ.



ගහ ඉහළ කෝරලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ආන්තීකරණයට ලක් වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම සඳහා පාසල් උපකරණ බෙදාදීම

## 2. සංහිදියාව අරමුණු කර ගත් ආර්ථික සවිබලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය- වැය ශීර්ෂය 110-01-05-13-2509

**ආර්ථික සවිබල ගැන්වීම් වැඩසටහන (අඩු ආදායම්ලාභී පවුල් සහ කාන්තා මූලික පවුල්)**

සමාජයේ ආන්තීකරණයට ලක් වූ පිරිස් අතර වඩාත්ම අසරණ තත්ත්වයන්ට මුහුණ දෙනු ලබන පිරිසක් ලෙස කාන්තා මූලික පවුල් සැලකිය හැකිය. කාන්තා මූලික පවුල්වල කාන්තාවන් ආර්ථික මට්ටම ඉහළ නංවාලීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ස්වාමි පුරුෂයා මියගිය, දික්කසාද වූ, අතහැර ගිය, රෝගී තත්ත්වයට පත් වූ, ආබාධිත තත්ත්වයට පත්වූ, විවාහ නොවූ හෝ විවිධ හේතු මත ස්වාමි පුරුෂයාගේ රැකවරණය නොලබන කාන්තාවන් පවුලේ ආර්ථික බර දරන පවුල් සඳහා ස්වයං රැකියා ආධාර හා ස්වයං රැකියා පුහුණු ලබා දීම තුලින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම මෙමඟින් අපේක්ෂා කෙරේ. ඉහත කරුණු වලට අමතරව ස්වාමි පුරුෂයා මත්ද්‍රව්‍ය හෝ මත්පැන්වලට ඇබ්බැහි වූ පවුල් හෝ යම් නීති විරෝධී ක්‍රියාවන්හි යෙදීම නිසා බන්ධනාගාරගත කර සිටින හෝ බන්ධනාගාරගතව සිට නිදහස්ව පැමිණි පවුල් වල කාන්තාවන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දිම මෙමඟින් වැඩිදුරටත් සිදු වේ. මෙම ව්‍යාපෘති උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් සෙසු පළාත් සඳහා ක්‍රියාත්මකයි.



අඩු ආදායම්ලාභී පවුල් සහ කාන්තා මූලික පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම

| කාල සීමාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (.රු) |
|---|---|---|---|
| 2022.01.01 -2022.09.30 | 89 | 106 | 14,174,764.05 |

## 3. ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීම අරමුණු කර ගත් ආර්ථික සවි බලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය 110-01-05-19-2509

අඩු ආදායම්ලාභී සහ අවම පහසුකම් හේතුවෙන් ආන්තිකරණයට ලක්ව පීඩා විඳින පිරිසක් උතුර හා නැගෙනහිර පළාත්වල දකින්නට ලැබේ. මෙම ප්‍රදේශවල කාන්තා මූලික පවුල් වැඩි පිරිසක් ජීවත් වන අතර, ආර්ථික සවිබලගැන්වීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට පියවර ගැනීම මෙම ව්‍යාපෘතිය තුළින් සිදු කරනු ලබයි.

ඒ අනුව, කාන්තා මූලික පවුල්වල ජීවනෝපාය නඟා සිටුවීම සඳහා 2022.09.30 දින වන විට උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය පහත පරිදි වේ.

| කාල සීමාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (.රු) |
|---|---|---|---|
| 2022.01.01<br>2022.09.30 | 59 | 90 | 4,756,490.00 |



උතුරු නැගෙනහිර පළාත්වලඅඩු ආදායම්ලාභී පවුල් සහ කාන්තා මූලික පවුල් සඳහා කෘෂිකාර්මික උපකරණ ලබාදීම



උතුරු නැගෙනහිර පළාත්වලඅඩු ආදායම්ලාභී පවුල් සහ කාන්තා මූලික පවුල් සඳහා ස්වයං රැකියා

### 3.8.3 2022.01.01 දින සිට 2022.09.30 දක්වා කරන ලද ව්‍යාපෘති පිළිබඳ සාරාංශය

| අනු අංකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය(රු) |
|---|---|---|---|---|---|
| 01 | ආන්තිකරණයට ලක්වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම. | දෙමාපියන් දෙදෙනාම අහිමි හෝ තනි මාපිය දරුවන් හෝ දරිද්‍රතාවයෙන් පෙළෙන දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම | 15 | පාසල් දරුවන් 902 | 3,149,210.00 |
| 02 | පහසුකම් අවම පාසල් සඳහා උපකරණ ලබා දීම | • පොත් කබඩ් ලබා දීම<br>• සන්නිවේදන උපකරණ ලබා දීම | පාසල් 3 | පාසල් ක 3 සිසු දරුවන් 826 | 850,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • පුස්තකාල පහසුකම් සැලසීම<br>• පාසලේ භෞතික සම්පත් දියුණු කිරිම<br>• තාක්ෂණික උපකරණ ලබා දීම<br>• පොත් සහ කබඩ් ලබා දීම<br>• මේස පුටු ලබා දීම | | | |
| මුළු එකතුව | | | **18** | | **3,999,210.00** |

**3.8.4 <u>2022.09.30</u> <u>දිනට එක් එක් වැය ශීර්ෂ යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදනවල සාරාංශය</u>**

| අනු අංකය | වැය ශිර්ෂය | විස්තරය | **2022 වර්ෂයේ අනුමත ඇස්තමේන්තුව (රු.මි)** | **2022 වර්ෂය සදහා සංශෝධිත ඇස්තමේන්තුව (රු.මි)** | **2022.09.30 දිනට වැය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි)** |
|---|---|---|---|---|---|
| 1. | 110-01-05-02-2509 | සහජීවන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම | 18.00 | 7.77 | 3.99 |
| 2. | 110-01-05-13-2509 | සංහිදියාව අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්විම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | 40.00 | 28.00 | 25.93 |
| 3. | 110-01-05-14-2509 | දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිසන්ධාන කමිටු පිහිටුවිම | 15.00 | 2.33 | 4.81 |
| 4. | 110-01-05-19-2509 | ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරිම අරමුණු කරගත් ආර්ථික බලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | 24.00 | 7.61 | 4.75 |
| | | එකතුව | **97.00** | **45.71** | **39.48** |

## 3.8.5 ජාතික ඒකාබද්ධතා අංශය මඟින් ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘති

**යුක්තිය සඳහා ප්‍රවේශය- ජංගම සේවා වැඩසටහන**
(Access to Justice–Mobile Service)



උතුරු පළාත තුළnයුක්තිය සඳහා සඳහා ප්‍රවේශය- ජංගම සේවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම (යාපනය)

ශ්‍රී ලාංකිකයන් තුළ බහු වාර්ගික,බහු සංස්කෘතික,බහු ආගමික හා බහු භාෂක වශයෙන්ද කණ්ඩායම් විවිධත්වයක් පවතී. එම ජන කණ්ඩායම් අතර ජාතික ඒකාබද්ධතාවය ඇති කිරීම අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ජාතික ඒකාබද්ධතා අංශයේ ප්‍රමුඛතම කාර්යයකි. එම කාර්යය වඩාත් සාර්ථක කර ගැනිම සඳහා සියලු ශ්‍රී ලාංකිකයන් එකම ජාතියක් ලෙස නැගී සිටිය යුතුය. ඒ අනුව සියලු පුරවැසියන් විසින් වාර්ගික,ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවතින විවිධත්වය හඳුනාගෙන නීති ගරුක සමාජයක් ගොඩනැගිය යුතු අතර, සමාජ සාධාරණත්වය උදෙසා නීතිය ක්‍රියාත්මක විම, නීතිය ආරක්ෂා කිරීම හා නිතිය ක්‍රියාත්මක කරන ආයතන, නිලධාරින් මෙන්ම සිවිල් ජනයාද නීතියට යටත් වන පරිසරයක් නිර්මාණය කළ යුතුය.

එම පරිසරය නිර්මාණය කිරිම සඳහා ජාතික ඒකාබද්ධතා අංශය මගින් සියලු ජන කොටස්වලට අත්‍යාවශ්‍ය වන නීතිමය උපදෙස් හා නීතිමය ලේඛන ලබා දිම සඳහා ජංගම සේවා වැඩසටහන් හා ඊට සමගාමී වැඩසටහන් උතුරු පළාත තුළ 2022 ජනවාරි මස කිළිනොච්චිය හා යාපනය දිස්ත්‍රික්ක කේන්ද්‍රකර කරගනිමින් ක්‍රියාත්මක කෙරිණි. මෙම වැඩසටහන අධිකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන විදේශාධාර ව්‍යාපෘති වන SOCIAL COHESION AND RECONCILIATION PROGRAM (SCORE) (USAID), හා STRENGTHENING RECONCILIATION PROGRAM IN SRI LANKA (SRP )(GIZ) ව්‍යාපෘතිවලමූල්‍ය සහය සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ සහය මත මෙම වැඩසහටන ක්‍රියාත්මක විය.



උතුරු පළාත තුළයුක්තිය සඳහා සඳහා ප්‍රවේශය- ජංගම සේවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම (කිළිනොච්චිය)

මෙම ජංගම සේවා වැඩසටහන මඟින් සේවා ලාභීන් 2900 ක ප්‍රමාණයක් පැමිණ සේවා ලබා ගැනීමට කටයුතු කර ඇත. ජනතාවට සෘජුව සේවා සපයන අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, තල් සංවර්ධන මණ්ඩලය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා වෘත්තීය පුහුණු අධිකාරියජංගම සේවයට සේවා සපයමින් ක්‍රියාකාරී සහයෝගය ලබා දෙන ලදී.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ වන්දි හිමිකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ලේඛන, වන්දි හිමිකම් ලබා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම, දැනට ඉදිරිපත් වී ඇති අසම්පූර්ණ තොරතුරු ඇති අයදුම්පත් හා ලේඛණ යාවත්කාලීන කිරීම වන්දි ලබා ගැනීම සඳහා දක්නට නොමැති වූ බවට සහතික නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම මෙහිදී විශේෂයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ජනතාවට ලබා දුන් සේවාවන් අතර විය.

මීට අමතරව හානි පූර්ණය සඳහා වූ කාර්යාලය මඟින් රුපියල් මිලියන 100ක හානි පූර්ණ චෙක්පත් ප්‍රතිලාභීන් 996ක් අතරේ බෙදා හරින ලද අතර අසම්පූර්ණව තිබූ ලිපිගොනු 820ක් සම්පූර්ණ කරන ලදී. තවද රුපියල් 550,000ක ජීවනෝපාය අධාර කාන්තා ගෘහ මූලික පවුල් 11ක් අතරේ බෙදා දෙන ලදී.

මෙම ජංගම සේවාවලට සමගාමීව අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විෂය යටතේ පවතින ආයතනවලින් සපයනු ලබන සේවාවන් පිළිබඳව උතුරු පළාතේ දිස්ත්‍රික්ක 5 තුළ බිම් මට්ටමේ රාජ්‍ය නිලධාරීන් 925ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් පවත්වන ලදී.

එමෙන්ම ඊට සමගාමීව උතුරු පළාත් දිස්ත්‍රික් 05තුළ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලය මඟින් විමර්ශන වැඩසටහන් පැවැත්වූ අතර එහිදී විමර්ශන 328ක කටයුතු අවසාන කිරීමට එම ආයතනයට හැකියාව ලැබිණි. නීති ආධාර කොමිෂන් සභාව විසින් පවත්වන ලද නීතිය පිළිබඳ මූලික දැනුවත් කිරීමේ වැඩසටහන මඟින් රාජ්‍ය නිලධාරින්, පාසල් ළමුන්, පොලිස් නිලධාරින් හා මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, මේ සඳහා 900කට වැඩි පිරිසක් සහභාගි විය.

උතුරු පළාතේ දිස්ත්‍රික්ක 05 හි දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරින් අදාළ රේඛීය අමාත්‍යාංශවල කඩිනම් අවධානය යොමුවිය යුතු පහත සඳහන් ගැටලු හඳුනා ගන්නා ලදී.

- වන ජීවී අභයභූමි හා වන රක්ෂිත සීමාවන් සම්බන්ධ ගැටලු.
- උතුරු පළාතේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම.
- කන්කසන්තුරේ සහ තුත්තුකුඩි අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවාවක් ක්‍රියාත්මක කිරීම.
- යාපනය (පලාලි) ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල් කිරීම.
- නීති විරෝධී වැලි ගොඩ දැමීම නතර කිරීම (කිළිනොච්චි).
- ඉඩම් හිමිකම් සම්බන්ධ ගැටලු

ඉහත ගැටලු පිළිබඳ අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිලධාරින් සමඟ 2022 මාර්තු මාසයේදී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ හා ගරු අධිකරණ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා කරන ලද අතර 2022.08.25 දින ගරු අධිකරණ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පසුවිපරම් රැස්වීමක් පවත්වන ලදි. තවද, ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් මැයි මාසයේ දී උතුරු පළාත තුළ සිදු කරන ලදි ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවක දී ඉන්දීය සරණාගතයන් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් වැඩි අවදානයක් යොමු කරන ලදි.

ඒ සඳහා විශේෂ කමිටුවක් ස්ථාපිත කර තවදුරටත් අදාළ ගැටළු විසඳීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී

## 3.9 මූල්‍ය අංශය

**3.9.1 <u>මූල්‍ය අංශයේ කාර්යභාරය</u>**

අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, අධිකරණ පරිපාලනය, අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු සහ ආයතන වල මූල්‍ය කළමනාකරණයට අදාල කටයුතු හා ඊට අදාල ගිණුම් කටයුතු පවත්වා ගෙන යාම මූල්‍ය අංශය මඟින් සිදු කරයි.

එම කටයුතු කරගෙන යාමේදී,

1. කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාල උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම
2. ආයතනය සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම
3. මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධි විධාන වලට අනුකූලව මුදල් පරිහරණය කිරීම
4. අයවැය පාලනය
5. ගිණුම්කරණය හා වාර්තා කිරීම
6. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම හා පාර්ලිමේන්තු කාරක සභා ආදියට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම සිදු කරයි.

**3.9.2 <u>මූල්‍ය අංශයේ උප අංශ</u>**

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා මූල්‍ය අංශය පහත සඳහන් උප අංශ 04 ක් යටතේ ක්‍රියාත්මක වේ.

1. ගෙවීම්
2. අධිකරණ පරිපාලන
3. ගිණුම්
4. ප්‍රසම්පාදන

මෙම එක් එක් අංශයන්හි කාර්යයන් පහත පරිදි වේ.

**1. <u>ගෙවීම් අංශයේ කාර්යයන්</u>**

1. 110 - අධිකරණ අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පහත ව්‍යාපෘති වලට අදාල සියළු ගෙවීම් කටයුතු
   - I. අමාත්‍ය කාර්ය මණ්ඩලය
   - II. අමාත්‍යාංශ පරිපාලනය
   - III. සමථ මණ්ඩල කොමිෂන් සභාව
   - IV. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන ඒකකය
   - V. ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධනය
   - VI. බන්ධනාගාර කටයුතු අංශය
2. වැටුප් සකස් කිරීමේ කටයුතු
3. වැය ලෙජර පාලනය

4. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති සියළු ආයතන වල මූල්‍ය නොවන වත්කම් සම්බන්ධව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත අවශ්‍ය වාර්තා සැපයීම
5. මාසික ගිණුම් සාරාංශ භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම
6. අක්මුදල් කළමණාකරණය

## 2. අධිකරණ පරිපාලන අංශයේ කාර්යයන්

1. 228 - අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ පහත ව්‍යාපෘති වලට අදාල ගිණුම් කටයුතු
   i. අධිකරණ පරිපාලනය
   ii. කම්කරු විනිශ්චය සභාව
2. අධිකරණ කලාප 26ක ගිණුම් කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය
3. අධිකරණ අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් නිදහස් කිරීම
4. අධිකරණවල ආදායම් හා වියදම් මාසිකව ගිණුම් සාරාංශය මගින් භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම
5. වත්කම් වෙනස්වීම් සම්බන්ධයෙන් ගිණුම් ගත කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම
6. නිල බැංකු ගිණුම් මෙහෙයවීම සඳහා බලතල පැවරීම
7. අභ්‍යන්තර හා විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම
8. අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අධිකරණ ගොඩනැගිලි වල ඉදිකිරීම් වල ගෙවීම් කටයුතු

## 3. ගිණුම් අංශයේ කාර්යයන්

1. වැය ශීර්ෂ 110 හා 228 සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම
2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම
3. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අදාල කටයුතු කිරීම
4. වියදම් සමාලෝචනය කරමින් අයවැය පාලනය කිරීම
5. දෙපාර්තමේන්තු හා ආයතන වල මූල්‍ය හා ගිණුම් කටයුතු සම්බන්ධිකරණය කිරීම
6. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු කිරීම හා වෙන්දේසි කටයුතු සිදු කිරීමට අනුමැතීන් ලබා දීම
7. අධිකරණ මඟින් රාජසන්තක කරන ලද භාණ්ඩ නියාදනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම

## 4. ප්‍රසම්පාදන අංශයයේ කාර්යයන්

1. අමාත්‍යාංශයේ සියලු භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් කටයුතු
2. අධිකරණයන් සඳහා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම
3. අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම
4. ප්‍රසම්පාදන අස්ථිත්වයේ ලේකම් වශයෙන් අදාළ රැස්වීම් සංවිධානය, වාර්තා සකස් කිරීම සහ අනුමැතින් ලබා ගැනීම

**3.9.3 <u>2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය</u>**

**වැය ශීර්ෂ 110- අධිකරණ අමාත්‍යාංශය**

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මි.) | 2022.09.30 දිනට වියදම (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 2,686.50 | 1,324.30 | 49.29% |
| මූලධන වියදම් | 5,519.60 | 675.97 | 12.25% |
| මුළු එකතුව | 8,206.10 | 2,000.27 | 24.38% |

**වැය ශීර්ෂ 228 - අධිකරණ පරිපාලන**

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මි.) | 2022.09.30 දිනට වියදම (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 8,748.45 | 6,471.02 | 73.96% |
| මූලධන වියදම් | 2,200.15 | 1,224.14 | 55.64% |
| **මුළු එකතුව** | **10,948.60** | **7,695.16** | **70.28%** |

**ආදායම් රැස්කිරීම - ශීර්ෂ 228- අධිකරණ පරිපාලන**

| ආදායම් විස්තරය | 2022 ඇස්තමේන්තු (රු.මි.) | 2022.09.30 දිනට ආදායම් රැස් කිරීම් (රු.මි.) | ප්‍රගතිය (% |
|---|---|---|---|
| දඩ මුදල් හා රාජසන්තක කිරීම් වලට අදාල ආදායම රැස් කිරීම් | 800 | 966.74 | 120.84 |
| පොළී ආදායම් | 40 | 41.93 | 104.83 |
| විකුණුම් ගාස්තු -අනෙකුත් ලැබීම් | 70 | 107.62 | 153.74 |
| විකුණුම් ගාස්තු- පරිපාලනාත්මක ගාස්තු -විවිධ | 150 | 172.14 | 114.76 |
| ගොඩනැගිලි කුළී | 35 | 30.52 | 87.19 |
| ස්ථාවර වත්කම් විකිණීම අනෙකුත් | 12 | 14.49 | 120.77 |
| මුළු එකතුව | 1,107 | 1,333.44 | 120.46 |

**තැන්පතු ලැබීම් හා ගෙවීම් - ශීර්ෂ 228-අධිකරණ පරිපාලන**

| විස්තරය | 2022.09.30 දිනට තැන්පත් ලැබීම් (රු.මි.) | 2022.09.30 දිනට තැන්පත් ගෙවීම් (රු.මි.) |
|---|---|---|
| ඇප තැන්පතු | 619.11 | 258.41 |
| තෙවන පාර්ශයවන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු | 4,478.52 | 3,3619.77 |
| පළාත් සභා වෙත ආදායම් ප්‍රේෂණය කිරිම | 3,151.82 | 2,808.14 |
| කොන්ත්‍රාත් තැන්පතු | 104.00 | 25.82 |
| ටෙන්ඩර් තැන්පතු | 3.01 | 3.06 |
| එකතුව | **8,356.46** | **36,715.20** |

**3.9.4 <u>2022.09.30 දිනට ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රගතිය</u>**

01. 2022 වර්ෂයේදී දිවයින පුරා පිහිටි අධිකරණයන්හි ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියා හා සේවා කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රසම්පාදන කාර්යයන් සිදු කර ඇත.

02. නව අධිකරණ 11 ක් සඳහා ලී බඩු හා පරිඝණක උපාංග ලබා දීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ඉටුකර එම අවශ්‍යතා සපුරා දීම සඳහා රු මි 21 ක පිරිවැයක් දරා ඇත.

03. අධිකරණයන්හි ලී බඩු හා කාර්යාලීය අවශ්‍යතා සපුරා ගැනීම 2022.01.01 සිට 2022.09.30 දක්වා ලබා දුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය පහත පරිදි වේ.
අධිකරණ සඳහා -රු. මි 12
කම්කරු විනිශ්චය සභා සඳහා - රු .මි 1

## 3.10 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු,උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය, විනිසුරු පුහුණු ආයතනය සහ නීති ආධාර කොමිෂන් සභාව යන ව්‍යවස්ථාපිත ආයතනත්, ජාතික සමඟිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය, හානිපූර්ණය සඳහා වන කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන් පිලිබඳ කාර්යාලය, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යන ආයතනත් අමාත්‍යාංශ පරිපාලන වැය විෂයේ සහයක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන සමථ මණ්ඩල කොමිෂන් සභාවත්, අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ වන මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වල හා එම වැය ශීර්ෂයේ සහයක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාල වලත් විගණන කටයුතු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි.

අභ්‍යන්තර විගණනයේදී පද්ධති විගණනය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව ඉහත සඳහන් ආයතන වල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබන අතර 2022 වර්ෂය සඳහා අප අංශය විසින් සකස් කරන ලද අවධානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව 2022 ජනවාරි 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා පහත විගණන පරීක්ෂණයන් සිදුකර ඇත.

- මහාධිකරණ 05ක්
- දිසා/මහේස්ත්‍රාත් අධිකරණ 09ක්
- දිසා අධිකරණ 04ක්
- මහේස්ත්‍රාත් අධිකරණ 12ක්
- සිවිල් අභියාචනා මහාධිකරණ 04ක්
- දෙපාර්තමේන්තු 03ක්
- අධිකරණ අමාත්‍යාංශයේ 04ක්
- ජාතික සමඟිය හා හා සංහිඳියා කාර්යාංශය
- අතුරුදහන් වූ තැනැත්තන් පිලිබඳ කාර්යාලය
- විශේෂ පරීක්ෂණ 10ක්
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක්

2022 සැප්තැම්බර් 30 දිනට විගණන පරීක්ෂාවන් 53 ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද රටේ පැවති අර්බුදකාරී තත්වයන් හේතුවෙන් එදිනට විගණන පරීක්ෂාවන් 44 ක් සහ විගණන කලමනාකරණ කමිටු රැස්වීම් 02ක් පවත්වන ලදි.

අභ්‍යන්තර විගණනයේදී විශේෂයෙන්ම පද්ධති විගණනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබන අතර අභ්‍යන්තර පාලනය මෙන්ම අභ්‍යන්තර පරීක්ෂාව කෙරෙහිද අවධානය යොමු කරනු ලබයි.විගණන ඒකක 243 ක විගණන පරීක්ෂාවන් සිදු කිරීමට ඇති නමුත් පවතින සීමිත නිලධාරීන් සංඛ්‍යාව හමුවේ අවශ්‍යතාවය අනුව අවදානම් ප්‍රමුඛතා පදනම මත විගණනයන් සැලසුම් කරනු ලැබේ.

ඉදිරි කාර්තුවේදී සංශෝධිත විගණන සැලැස්මක් සකස් කර විගණන පරීක්ෂාවන් සිදු කිරීමට හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර සංශෝධිත විගණන සැලැස්මට අනුව ඉතිරි විගණනයන් සිදු කිරීමට ද නියමිතය.

## 04. අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

### 4.1 නීතිපති දෙපාර්තමේන්තුව

**<u>දැක්ම</u>**

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරිම සඳහා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්විමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරිම.

**<u>මෙහෙවර</u>**

- ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරිම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරිම.
- සාමාජීය සහ ආර්ථික සෞභාග්‍යය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්විමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතීන් ක්‍රියාත්මක කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දැරීම.

**<u>අරමුණ</u>**

ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලු නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දී සුවිශේෂි මෙහෙවරක් ඉටු කිරීම.

### 4.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් නීතිපතිතුමා කටයුතු කරයි. “ඒ” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයට, පළාත් සභාවලට රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනෙකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහාය ලබාදෙයි. එකී සහාය ලබාදීමේ දී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනෙකුත් අධිකරණ වල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩු වලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශ වලට

අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරන ඊ්ඊආර් ඒකකය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මකව පවතී.

## 4.1.2 නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කාරණා, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතනවලට උපදෙස් දීම.

- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩුවලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.

- නව නීති සම්මත කිරීමේදි හා පවතින නීති සංශෝධනය කිරීමේදි අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදී, දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මකවේ.
එම ඒකක වන්නේ

- මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මෙම අංශයයි)
- ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියාකිරීම පිණිස පිහිටුවා ඇත)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත.

## 4.1.3 එක් එක් අංශයන්හි 2022.01.01 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය

| ශාඛාව | නඩු වර්ගය | 2021 වර්ෂයෙන් ගෙනා නඩු ගොනු සංඛ්‍යාව | 2022.09.30 දක්වා පවරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 2022.09.30 දක්වා අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 2022.09.30 දිනට ඉතිරි නඩු ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| *සිවිල් අංශය | CE/MC | රාජ්‍ය නීතිඥ | 73 | 00 | 86 |
| | CA/LT | | 08 | 00 | |
| | CA/MC | | 06 | 01 | |
| | **එකතුව** | | **87** | **01** | |
| | CA/DC | | 351 | සිවිල් අංශයෙන් ගොනු ආරම්භ කර රාජ්‍ය නීතිඥ අංශයට යොමු කර ඇත | |
| | CA/HC | | 346 | | |
| | CA/CA | | 460 | | |
| රාජ්‍ය නීතිඥ අංශය | සිවිල් නඩු | 11,589 | 1,208 | 896 | 11,901 |
| අපරාධ | අපරාධ | 6,390 | 2,076 | 2,065 | (6,401-92) 6,309** |
| ශ්‍රේෂ්ඨාධිකරණ අංශය | SC FR, SC Writ,SC SD, SC Contempt of Court | 847 | 442 | 244 | 1,045 |
| සංස්ථා අංශය | උපදෙස් සහ ගිවිසුම් | 8,134 | 1,912 | 988 | 9,058 |
| *** ළමා ආරක්ෂණ | ළමා අපචාර | 2,448 | (1,484+1,129) 2,613 | 2,046 | 3,015 |
| මහජන පෙත්සම් අංශය | අපරාධ/සිවිල් | 1,258 | 949 | 772 | 1,435 |
| **එකතුව** | | **30,666** | **9,287** | **7,012** | **(32,941-92) 32,849** |

*** මෙහි දක්වා ඇත්තේ සිවිල් අංශයෙන් අවසන් කරන ලද නඩුගොනු සංඛ්‍යාව පමණි.CA/DC, CA/HC,CA/CA ගොනු සිවිල් අංශයෙන් ආරම්භ කර රාජ්‍ය නීතිඥ අංශය මගින් අවසන් කෙරේ.**

*** * 2022.01.01 සිට 2022.08.15 දක්වා කාර්යසාධන වාර්තාව සඳහා එක් කර තිබූ EER/AB ගොනු උපදෙස් ගොනු නොවන බැවින් මෙහිදී EER/AB ගොනු 92ක් අඩු කර ඇත.**

***** 2022.01.01 සිට 2022.09.30 දක්වා නඩු ගොනු 1,129 නැවත සක්‍රිය කර ඇත.**

## 4.1.5 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 1,593.63 | 1,165.42 | 73.13 |
| ප්‍රාග්ධන වියදම | 273.81 | 93.75 | 34.24% |
| **එකතුව** | **1,867.44** | **1,259.17** | **67.43%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.2 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**දැක්ම**

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරිම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

**මෙහෙවර**

ආණ්ඩුවේ ප්‍රතිපත්ති, නීතිය බවට පරිවර්තනය කිරිමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරිම

### 4.2.1 හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරිම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරිම, පවත්නා නීති සංශෝධනය කිරිමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරිම සහ අදාළ අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන අනු නීති ප්‍රතිශෝධනය කිරිම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරිම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගී වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදි පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරිම දෙපාර්තමේන්තුවට පැවරි ඇති රාජකාරී කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තු වලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන තවත් රාජකාරියකි.

### 4.2.2 පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරිම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරිම.

(2) උපකාරක නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) උපකාරක නීති කෙටුම්පත් කිරීම.

(3) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි කටයුතු ඉටු කිරීම.

(4) අවශ්‍ය අවස්ථා වල දී පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, පළාත් සභා ප්‍රඥප්ති සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් කිරීමේදී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීමයි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, රජයේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

## 4.2.3 2022.01.01 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය

<u>වැඩ නිම කර ඇති ගොනුවල විස්තර</u>

| 01 | 02 | 03 | 04 | 05 | 06 |
|---|---|---|---|---|---|
| රාජකාරියේ ස්වභාවය | **2022.01.01**දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නිතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරික්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය) | **2022.01.01** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය) | **2022.09.30** දිනට පාර්ශවයන් වෙතින් ලැබුණු නව ඉල්ලීම් සංඛ්‍යාව | පසුගිය වර්ෂවල හා මෙම වර්ෂයේදී භාෂාත්‍රයෙන් කෙටුම්පත් කර අවසන් කර එහෙත් නැවත වරක් සංශෝධන සිදු කිරීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව | එකතුව |
| පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 202 | 29 | 30 | 5 | 266 |
| පෞද්ගලික මන්ත්‍රී (සංස්ථා ගත කිරීමේ) පනත් කෙටුම්පත | 13 | 13 | 14 | 2 | 42 |
| උපකාරක නීති ප්‍රතිශෝධනය | 125 | 48 | 134 | 19 | 326 |
| පළාත් සභා ප්‍රඥප්ති | 9 | 1 | 1 | 0 | 11 |
| **එකතුව** | 349 | 91 | 179 | 26 | 645 |

| | 07 | 08 | 09 | | 10 |
|---|---|---|---|---|---|
| රාජකාරියේ ස්වභාවය | **2022.09.30** දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශවයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිප වරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශවයන් වෙත භාර දුන් අවසන් කෙටුම්පත් වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුලත් වේ) | දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු | **2022.09.30** ට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දි නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව | | **2022.09.30** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
| | | | නීතිපති | අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු | |
| පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 45 | 70 | 20 | 103 | 28 |
| පෞද්ගලික මන්ත්‍රී (සංස්ථා ගත කිරීමේ) පනත් කෙටුම්පත් | 3 | 0 | 31 | | 8 |
| උපකාරක නීති ප්‍රතිශෝධනය | 148 | 22 | 114 | | 42 |
| පළාත් සභා ප්‍රඥප්ති | 0 | 0 | 11 | | 0 |
| එකතුව | **196** | **92** | **279** | | **78** |

### 4.2.4 වැඩ නිම කර ඇති ගොනුවල විස්තර සාරාංශය - (2022.01.01 – 2022.09.30)

| ගොනුව | 2022.01.01 දින සිට 2022.09.30 දක්වා ලද ඉල්ලීම් | භාෂාත්‍රයෙන් යවා ඇති පනත් |
|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම ( මූලික පනත් හා සංශෝධන පනත්) | 30 | 45 (මෙයට පසුගිය වර්ෂවල ලැබුණු හා 2022 වර්ෂයේදී ලැබුණු ඉල්ලීම් ද ඇතුළත් ය) |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පනත් | 14 | 03 (මෙයට පසුගිය වර්ෂවල ලැබුණු හා 2022 වර්ෂයේදී ලැබුණු ඉල්ලීම් ද ඇතුළත් ය) |
| උපකාරක නීති (නියෝග, නීති, නියමයන්) | 134 | 148 (මෙයට පසුගිය වර්ෂවල ලැබුණු හා 2022 වර්ෂයේදී ලැබුණු ඉල්ලීම්ද ඇතුළත්ය) |
| පළාත් සභා ප්‍රඥප්ති | 1 | 0 |
| **එකතුව** | **179** | **196** |

### 4.2.5 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 135.68 | 96.55 | 71% |
| ප්‍රාග්ධන වියදම | 1.15 | 0.005 | 0.435 |
| **එකතුව** | **136.83** | **96.55** | **70.56%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.3 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

<u>දැක්ම</u>

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

<u>මෙහෙවර</u>

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

### 4.3.1 <u>අරමුණු සහ කාර්යයන්</u>

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.

II. නීතියේ විෂමතා නැති කිරීම.

III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.

IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.

V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.

VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.

VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

### 4.3.2 2022.01.01 සිට 2022.09.30 දක්වා නීති නිර්දේශිතයන්ගේ ප්‍රගතිය

| | |
|---|---|
| 1.අධිකරණයට අපහස කිරීමේ පනත පිළිබඳ යෝජිත නිර්දේශයේ නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද කොටුම්පත පිළිබඳ විමසීම | |
| **පසුබිම** | MOJ(L)497/2021 අංක දරණ 2022/06/30 දිනැති ලිපියෙන් අධිකරණ අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීම මත සාකච්ඡාවට බඳුන් විය |
| **වත්මන් තත්ත්වය** | අදාල කෙටුම්පත පිළිබඳ නීති කොමිෂන් සභාවේ නිර්දේශය 2022.07.22 අධිකරණ හා අමාත්‍යාශයේ නීති අංශය වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කොට ඇත. |
| 2. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් යෝජිත වෛවාහක නීතිය සම්බන්ධ යෝජිත නීතිය | |
| **පසුබිම** | නීති කොමිෂන් සභාවේ සභාපති තුමා විසින් නීති කොමිෂන් සභාව විසින් යෝජනා කිරීමට බලාපොරොත්තු වන වෛවාහක පනතට ගෙන එන සංශෝධනයන්ට පෙර අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දැනට යෝජිත කෙටුම්පත අධ්‍යයනය කිරීම කළ යුතු බවට යෝජනා කිරීම |
| **වත්මන් තත්ත්වය** | කෙටුම්පත සාකච්ඡාවට බඳුන් විය.<br><br>සභාපතිතුමා ඇතුළු නීති කොමිෂන් සභවේ මතය වූයේ දික්කසාදය, භාරකාරත්වය හා වන්දි සඳහා වෙතට ක්‍රියා පටිපාටියක් යෝජනා කළ යුතු බවයි.<br><br>නීති කොමිෂන් සභාව විසින් නව යෝජනාවක් යොමු කිරීමට බලාපොරොත්තු වන බවට ගරු අධිකරණ අමාත්‍යතුමා දැනුවත් කරන බවට සභාපතිතුමා නීති කොමිෂන් සභාවට දන්වන ලදී.<br><br>ඒ අනුව, 2022 සැප්තැම්බර් මස 05 වන දින මෙම කරුණ සාකච්ඡා කිරීමට නීති කොමිෂන් සභා රැස්වීමක් ZOOM තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට යොදා ගෙන ඇත. |
| 3. සමාජ මාධ්‍ය හා පෞද්ගලිකත්වයට ඇති අයිතිය පිළිබඳ නීතිය පිළිබඳ යෝජනා | |
| **පසුබිම** | සමාජ මාධ්‍ය හා පෞද්ගලිකත්වයට ඇති අයිතිය පිළිබඳ නීතියට නව නීතිමය රාමුවක් හඳුන්වා දිය යුතු බවට නීති කොමිෂන් සභාව යෝජනා කරන ලදී. |
| **වත්මන් තත්ත්වය** | 2022 සැප්තැම්බර් මස 15 වන දින මෙම කරුණ සාකච්ඡා කිරීමට නීති කොමිෂන් සභා රැස්වීමක් ZOOM තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට යොදා ගෙන ඇත. |
| 4. පෞද්ගලිකත්වයට ඇති අයිතිය | |
| **පසුබිම** | පෞද්ගලික අවස්ථාවන් වලදී ලබා ගන්නා ඡායාරූප ඒහි සිටින පුද්ගලයාගේ අනුමැතියෙන් තොරව සමාජ මාධ්‍ය වල එල කිරීම පිළිබඳ නෛතික තත්ත්වය විමසීම. |
| **වත්මන් තත්ත්වය** | • ගිවිසුම්ගත හා වාණිජමය කරුණු මත පුද්ගලයකුගේ ප්‍රතිරූපයට හානි කිරීම. දෙපාර්ශවයන් අතර ඇති වගකීමේ හා බැඳීමේ ස්වභාවය<br>• ප්‍රසිද්ධ චරිත - මාධ්‍ය නිදහස හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට බාධා නොවිය යුතුය.<br>• වාණිජමය කරුණු මත යොදා ගැනීම.<br>• පුද්ගලෙයකුගේ පෞද්ගලික ප්‍රතිරූපයට හානි කිරීමේ චේතනාව<br>• ලිංගික කරුණු පිළිබඳ ඡායාරූප මත බ්ලැක්මේල් කරීම<br>• හානියක් සිදු කිරීමෙ චේතනාව ඔප්පු කල යුතුය.<br>• සමාජ මාධ්‍ය පිළිබඳ නව පරපුරෙහි ධනාත්මක අදහස් යටපත් නොවිය යුතුය.<br>• නව තාක්ෂණික පරිගණක මෘදුකාංග වල ධනාත්මක ප්‍රයෝජන වලට අහිතකර නොවන නම්‍යශීලී නීති විය යුතුය. |

#### 4.3.3 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 17.70 | 11.20 | 63% |
| ප්‍රාග්ධන වියදම | 1.21 | 0.08 | 07% |
| **එකතුව** | **19.00** | **11.00** | **58%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.4 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**දැක්ම**

සාධාරණ සහ නීති ගරුක සමාජයක් ගොඩනැගීම.

**මෙහෙවර**

අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා කෂේත්‍රයන් සම්බන්ධ විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශක සේවාවන් සැපයීම.

### 4.4.1 හැදින්වීම

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැකකටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන අංශය සහ විවිධ නඩු අංශය යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ.

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය හා වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මඟින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශ වල තත්වය පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදු කෙරෙනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර වාර්තා කිරීම සැක කටයුතු ලේඛණ අංශය මඟින් කරනු ලබයි.

තවද දිවයිනේ සිදුවන මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩි තැබීම්, පිපිරීම්, ගිනි ගැනීම්, මාරක රිය අනතුරු ආදී දරුණු ගණයේ අපරාධ හා සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදේ. මීට අමතරව ප්‍රභූ රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.

අධිකරණයේ විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද රස පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් අප නිලධාරීන් දිවයිනේ විවිධ අධිකරණ වලදී විශේෂඥ සාක්ෂි ලබාදෙති.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදුකරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ සාදනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙයි. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ හා පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී සහ වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

### 4.4.2 2022.01.01 සිට 2022.09.30 දක්වා විශ්ලේෂණ වාර්තාවල ප්‍රගතිය

| අංශය | 2022.01.01 දිනට ඉතිරි නඩු සංඛ්‍යාව | 2022.01.01 2022.09.30 දක්වා ලැබී ඇති නඩු සංඛ්‍යාව | 2022.01.01 - 2022.09.30 දක්වා වාර්තා කල නඩු සංඛ්‍යාව | 2022.09.30 දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක | 1,390 | 13,507 | 11,199 | 3,698 |
| ගිණි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා | 221 | 322 | 350 | 193 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම් | 163 | 606 | 561 | 208 |
| අධිකරණ ධූලක විද්‍යා අංශය (වස වර්ග) | 1,383 | 1,975 | 2,310 | 1,048 |
| මස්තු විද්‍යා හා DNA | 2,567 | 1,435 | 1,079 | 2,923 |
| සැක කටයුතු ලේඛණ | 80 | 508 | 493 | 95 |
| පරිගණක ඩිජිටල් අපරාධ | 878 | 653 | 598 | 933 |
| අධිකරණ විද්‍යා විවිධ අංශය | 365 | 346 | 434 | 277 |
| මත්පැන් | 392 | 5,155 | 4,727 | 820 |
| මධ්‍යසාර හා දුම්කොළ | 192 | 2,189 | 2,246 | 135 |
| ආහාර පනත යටතේ ආහාර සාම්පල | 21 | 2,922 | 2,895 | 48 |
| විවිධ ආහාර වර්ග | 48 | 642 | 677 | 13 |
| **එකතුව** | **7,700** | **30,260** | **27,569** | **10,391** |

### 4.4.3 වෙනත් කටයුතු

| කාර්යය | සංඛ්‍යාව |
|---|---|
| අධිකරණ වලදී සාක්ෂි සැපයූ අවස්ථා | දින 214 |
| අපරාධ ස්ථාන වලට සහභාගී වූ අවස්ථා | දින 421 |
| ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගී වූ විශේෂ VIP ආහාර පරීක්ෂණ | නිලධාරී දින ගණන 05 |
| දේශණ පැවැත්වීම | දින 22 |
| දේශීය පුහුණු | නිලධාරී දින ගණන 859 |
| පශ්චාත් උපාධි සඳහා විදේශ ගත නිලධාරීන් ගණන | 01 |

- ජූනි මස 15 සිට අගෝස්තු 15 දක්වා මසකට දින 02ක සේවා මුරයක් ක්‍රියාත්මක විය. (16/2022, 16/2022(1) හා 16/2022(11) චක්‍රලේඛයට අනුව)
- 2022.01.01 සිට 2022.09.30 දක්වා කාලය තුළ 2020.09.17 දින දෙපාර්තමේන්තුව වෙත බඳවා ගත් විද්‍යාත්මක සේවයේ නවක නිලධාරීන් 28 දෙනා සේවාරම්භක පුහුණුව සඳහා සහභාගී විය.

### 4.4.4 කාර්යසාධනයට අදාළ ඉදිරි සැලසුම්

2020 වර්ෂය අවසානයේ සිට රටතුළ පවතින විදේශ විනිමය අර්බුදයත් සමඟ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝජන ද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළුකට මුහුණ පෑමට සිදුවිය. තවද ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් නිලධාරීන්ගේ පැමිණීමද සේවා මුර ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක වූ නිසා යම් පමණකට වාර්තා කිරීමට ඇති නඩු සංඛ්‍යාව වැඩි විය. 2023 වර්ෂයේදී මෙම තත්වය හැකිතාක් මඟහරවා ගෙන කටයුතු කිරීමට අපේක්ෂා කරයි.

### 4.4.5 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 416.30 | 300.25 | 72% |
| ප්‍රාග්ධන වියදම | 201.50 | 24.76 | 12% |
| **එකතුව** | **617.80** | **325.01** | **52%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.5 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**දැක්ම**

නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ ණය ගනුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙළක් සලසා දීම.

**මෙහෙවර**

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් ණය මුදලක් සඳහා ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේ දොර ඉඩකඩම් ආදි වූ නිශ්චල දේපල ණය සහනදායි අන්දමට වාරික මඟින් හා අඩු පොලී අනුපාතයට ගෙවා නිදහස් කර ගැනීමට ණය කරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම.

**අරමුණ**

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුති වලට පාර්ශවයන් පැමිණ වීම.

### 4.5.1 හැඳින්වීම

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි නිවාස වැනි නිශ්චල දේපළ පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබා ගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාව එම ණයගැති භාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම අරමුණු කරගෙන 1941අංක 39 දරණ ණය සහනදායක අඥා පනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මීට අමතරව 1999 දී පනතට කරන ලද අංක 29 දරණ සංශෝධන අනුව හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස් වීමට හැකි වීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත.

ණය සහන මණ්ඩලයේ රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය විසින් ඉදිරියේ එළැඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළැඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොළී ප්‍රමාණයන් අඩු කිරීමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණයකරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කළ නොතිසිය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒකපාර්ශවික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාම නිලධාරි තැන මඟින් අවස්ථානෝචිත පරිදි ණයහිමි වෙත දැනුම්දී ණයහිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යැයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවකදි එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතු වේ. වෙනත් අධිකරණයක් මේ පිළිබඳව විභාගයක් පැවත්වෙන අවස්ථාවකදි මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10 ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබාදීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩුකිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත යටතේ අධිකරණයට බලතල ලබාදී ඇත.

### 4.5.2 2022.01.01 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය

**අයදුම්පත් අවසන් කිරීමේ ප්‍රගතිය**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| 2022.01.01 දිනය ඉදිරියට ගෙන ආ නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව | 1,424 |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | 321 |
| සමාලෝචනය සඳහා සහ නිෂ්ප්‍රභා ඉල්ලීම් සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 10 |
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 1,755 |
| සමථයට පත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 339 |
| නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 176 |
| සමාලෝචනය කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 10 |
| සහතික නිකුත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 0 |
| ඉල්ලා අස්කරගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව | 52 |
| රෝලෙන් ඉවත් කරන ලද | 11 |
| පසෙක තබන ලද | 71 |
| එකතුව | 663 |
| 2022.09.30 දිනට අවසන් නොවී ඉතිරි ඉල්ලුම්පත් සංඛ්‍යාව | 1,092 |

**දිස්ත්‍රික් මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කිරීම**

| දිස්ත්‍රික්කය | 2022.09.30 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 51 |
| කළුතර | 33 |
| කුරුණෑගල | 33 |
| කෑගල්ල | 13 |
| රත්නපුර | 16 |
| බදුල්ල | 01 |
| අම්පාර | 01 |
| ගාල්ල | 42 |
| මාතර | 15 |
| හම්බන්තොට | 03 |
| ගම්පහ | 91 |
| මහනුවර | 14 |
| පුත්තලම | 06 |
| මාතලේ | 02 |
| එකතුව | 321 |

**ණය සහන මණ්ඩලවල කාර්යසාධනය**

| ශාඛා මණ්ඩලය | ශාඛා සතුව පවතින ඉල්ලුම්පත් සංඛ්‍යාව | 2022.09.30 දිනට අවසන් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 2022.09.30 දිනට ඉතිරි වී ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ප්‍රධාන මණ්ඩලය | 643 | 232 | 411 |
| ගාල්ල ශාඛා මණ්ඩලය | 233 | 143 | 90 |
| ගම්පහ ශාඛා මණ්ඩලය | 445 | 162 | 283 |
| කුරුණෑගල ශාඛා මණ්ඩලය | 434 | 126 | 308 |
| එකතුව | 1755 | 663 | 1092 |

**4.5.2.1 2022.01.01 සිට 2022.09.30 දින දක්වා ණය සහනදායක මණ්ඩලයේ ප්‍රධාන මණ්ඩලය ඇතුළු ශාඛා වල ඉල්ලුම්පත් ලැබීම් දිස්ත්‍රික්ක අනුව**

ප්‍රධාන මණ්ඩලය

| දිස්ත්‍රික්කය | 2022.09.30 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 51 |
| කළුතර | 53 |
| කුරුණෑගල | 01 |
| කෑගල්ල | 02 |
| රත්නපුර | 16 |
| බදුල්ල | 01 |
| අම්පාර | 01 |
| එකතුව | 105 |

ගාල්ල ශාඛා මණ්ඩලය

| දිස්ත්‍රික්කය | 2022.09.30 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| ගාල්ල | 42 |
| මාතර | 15 |
| හම්බන්තොට | 03 |
| එකතුව | 60 |

ගම්පහ ශාඛා මණ්ඩලය

| දිස්ත්‍රික්කය | 2022.09.30 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| ගම්පහ | 91 |

කුරුණෑගල ශාඛා මණ්ඩලය

| දිස්ත්‍රික්කය | 2022.09.30 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| මහනුවර | 14 |
| කුරුණෑගල | 32 |
| කෑගල්ල | 11 |
| පුත්තලම | 06 |
| මාතලේ | 02 |
| එකතුව | 65 |

### 4.5.3 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 35.85 | 26.43 | 74% |
| ප්‍රාග්ධන වියදම | 1.00 | 0.09 | 9% |
| **එකතුව** | **36.85** | **26.52** | **72%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.6 බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**දැක්ම**

නේවාසිකයින් පුනරුත්ථාපනය තුළින් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම

**මෙහෙවර**

ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය යන මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා නේවාසිකයින් හා බන්ධනාගාර නිලධාරීන් අතර මනා සම්බන්ධතාවයක් නිර්මාණය කරමින් ධනාත්මක චින්තනයක් ගොඩනගා නිලධාරීන්ගේ රැකියා තෘප්තිය වැඩි කිරීම තුළින් සහ සිරකරුවන්ගේ සුභසාධක කටයුතු විධිමත් කිරීම තුළින් ඔවුන්ගේ ශ්‍රම ඵලදායීතාවය රටට වැඩදායී ලෙස යොදාගැනීම

**අරමුණු**

බන්ධනාගාර නේවාසිකයන් විධිමත්ව පුනරුත්ථාපනය මඟින් නීති ගරුක මානව හිතවාදී පුද්ගලයන් බවට පත් කර ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරීමට දායක වීම.

බන්ධනාගාර නිලධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම

### 4.6.1 හැඳින්වීම

1832 වසරේ දී බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදී යුගයේ ලංකාව පාලනය කළ කැමරන් ආණ්ඩුකාරවරයා විසින් හඳුන්වා දෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බන්ධනාගාරය බිහි විය. ඒ අනුව 1844 අංක 18 දරණ නීති හා අධිකරණ ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය බොස්ටල් ක්‍රමයට අනුරූපව වැලිකඩ බන්ධනාගාරය ගොඩනැගුනි. මෙම සේවාව 1877 අංක 16 දරණ බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 දින සිට බන්ධනාගාර කොමසාරිස්වරයකු යටතේ පාලනය වන වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රමවත් හා විධිමත් විය. සමාජ විකාශනයත් සමඟ මෙම සේවාවේ අවශ්‍යතාව තීව්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1875 දී එංගලන්ත බීන් ෆිල්ඩ් බන්ධනාගාර ආකෘතියට අනුව බෝගම්බර බන්ධනාගාරය ඉදිවිය. මෙලෙස විකාශිත බන්ධනාගාර පද්ධතිය වර්තමාන සමාජ සංකීර්ණත්වය හමුවේ සුවිශේෂී වූත් අත්‍යාවශ්‍ය වූත් ආයතනයක් බවට පත්ව තිබේ. මේ අනුව දිවයින පුරා විසිරී ආරක්ෂිත බන්ධනාගාර 04ක්, රිමාන්ඩ් බන්ධනාගාර 18ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02ක්, වැඩ කඳවුරු 10ක්, විවෘත වැඩ කඳවුරු 02ක්, සිර මැදිරි 23ක් බන්ධනාගාර පාසල් 01ක් ද බන්ධනාගාර අධිකාරීවරුන් යටතේ පාලනය වේ.

**ආදර්ශ පාඨය - ආරක්ෂාව, රැකවරණය, හා පුනරුත්ථාපනය**

**කාර්යයන්**

1. රට තුල කවර හෝ අධිකරණයක අධිකාරී බලය යටතේ බන්ධනාගාර ගත කරන ලද හෝ රිමාන්ඩ් භාරයට පත් කරන ලද සෑම තරාතිරමකම සිරකරුවන් පිළිගැනීම සහ බන්ධනාගාර නීතිරීති වලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය, හා නඩත්තුව සැලසීම සහ අධිකරණ වලට රිමාන්ඩ් සිරකරුවන් ඉදිරිපත් කිරීම
2. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සම්බන්ධ පොදු විධානය හා මනා පරිපාලනය සැලැස්වීම

3. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර වල රැඳවියන් සඳහා කාර්මික, කෘෂිකාර්මික, සත්ව පාලනය හා වෘත්තීය පුහුණුව ලබා දීම.

4. බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සඳහා සුභසාධක සේවා සැපයීම

5. විශෝධන ක්ෂේත්‍රය සවිමත් කිරීමට අවශ්‍ය පුහුණු කිරීම් සඳහා විධිවිධාන සැලසීම

6. කාලීන අවශ්‍යතාවට ගැළපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත් වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම

7. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාලව බන්ධනාගාර තදබදය අවම කිරීම, නවීන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය.

8. සේවා අංශයන්ට අදාළ පුහුණු හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම තුළින් මනා පරිචයකින් හා සේවා තෘප්තියකින් යුත් නිලධාරීන් බිහි කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය

9. රැඳවි පරිපාලන කටයුතු වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා රැඳවියන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම.

**ප්‍රමුඛතා**

බන්ධනාගාර ගත වන්නන්ට ආරක්ෂාව සැපයීම, රැකවරණය ලබාදීම හා පුනරුත්ථාපනය කිරීම

### 4.6.2 <u>2022.01.01 – 2022.09.30 දක්වා රැඳවි පරිපාලන තොරතුරු</u>

**1. උසාවි මගින් කෙළින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව - (2022.01.01 – 2022.08.31)**

| කෙළින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව | පිරිමි | කාන්තා | එකතුව |
|---|---|---|---|
| උසාවි මගින් බන්ධනාගාර ගත කරන ලද සිර සංඛ්‍යාව | 14,734 | 207 | 14,941 |
| උසාවි මගින් බන්ධනාගාර ගත කරන ලද සැක සංඛ්‍යාව | 59,947 | 2,221 | 62,168 |
| **එකතුව** | **74,681** | **2,428** | **77,109** |

**2. 2022.09.30 වන දින අලුයම විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව**

| සමස්ථ රැඳවි සංඛ්‍යාව | පිරිමි | කාන්තා | එකතුව |
|---|---|---|---|
| සියළුම සිරකරුවන් | 8,810 | 192 | **9,002** |
| සියළුම සැකකරුවන් | 14,993 | 658 | **15.651** |
| **මුළු එකතුව** | **23,803** | **850** | **24,653** |

**3. රැඳවුම් භාරයේ සිට පැනගිය / මිදී ගිය සිර හා සැක සංඛ්‍යාව (2022.01.01 – 2022.09.30)**

- අත්අඩංගුවෙන් පැන ගිය/ මිදී ගිය සිර හා සැක කරුවන් සංඛ්‍යාව - 188
- නැවත අත්අඩංගුවට පත් සංඛ්‍යාව - 84

**4. නිදහස් කිරීම් (2022.01.01 – 2022.09.30)**

| නිදහස් කිරීම් | එකතුව |
|---|---|
| ජාතික නිදහස් දිනය වෙනුවෙන් - 2022.02.04 | 193 |
| වෙසක් පොහොය දින වෙනුවෙන් - 2022.05.16 | 224 |
| පොසොන් පොහොය දින වෙනුවෙන් - 2022.06.14 | 183 |
| සිරකරු දිනය වෙනුවෙන් - 2022.09.12 | 417 |
| ජනාධිපති විශේෂ සමාව - 2022.03.28 | 01 |
| **එකතුව** | **1,018** |

**5. 2022.01.01 – 2022.09.30 දක්වා නිවාස නිවාඩු යවන ලද හා බලපත්‍ර මත මුදා හල නේවාසිකයින්**

- නිවාස නිවාඩු යවන ලද සංඛ්‍යාව - 221
- බලපත්‍ර මත මුදාහල සංඛ්‍යාව - 50

**4.6.3 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය</u>**

| ව්‍යාපෘතිය | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.) | 2021.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි.) | 2022ට වෙන්වූ ප්‍රතිපාදන (රු.මි) | 2022.9.30 දින දක්වා වියදම ( රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| නව දුම්බර බන්ධනාගාරය ඉදිකිරීම | 4363.6 | 2022.97 | 120.00 | 80.308 | කොන්ත්‍රාත් අංක 11 -72.5%<br>සමස්ථ ව්‍යාපෘතිය -61.5% |
| මහර බන්ධනාගාරයේ ගොඩනැගිලි ඉදිකිරීම | 272.00 | - | 39.98 | - | අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය හිමි නොවීම හා රාජ්‍ය වියදම් පාලනය සඳහා තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීම. |
| තංගල්ල අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය ඉදිකිරීම -ජල ව්‍යාපෘතිය | 4996.5<br>ජල ව්‍යාපෘතිය-483.2 | 4626.18 | 40.00 | 30.00 | 100% -වැඩ අවසන් බිල්පතක් නිරවුල් කිරීමට පවතී |
| පල්ලන්සේන නිරෝධායන මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම | 135.00 | 43.10 | 29.3 | 20.078 | 90%-වැඩ අවසන් |

| ව්‍යාපෘතිය | මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි. | 2021.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි. | 2022ට වෙන්වූ ප්‍රතිපාදන රු.මි | 2022.9.30 දින දක්වා වියදම රු.මි | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| වාරියපොල බන්ධනාගාරය වැඩිදියුණු කිරීම | 1244.60 | - | - | - | රාජ්‍ය වියදම් පාලනය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීම. . |
| මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ නේවාසිකයින් කෘෂි හා වෘත්තිය පුහුණුව මගින් පුනරුත්ථාපනය කල හැකි මධ්‍යස්ථාපනයක් වීරවිල වැඩ කඳවුරේ ස්ථාපනය කිරීම. | 198.67 | 50.67 | 20.0 | 11.478 | මේ යටතේ වෘත්තිය පුහුණු ගොඩනැගිල්ල, පුස්තකාලය හා අනෙකුත් හඳුනාගත් අවශ්‍යතා මෙම වසර තුල ක්‍රියාත්මක කිරීමට නියමිතය. |

**4.6.4** <u>වෙනත් කටයුතු</u>

**2022.01.01 දින සිට 2022.09.30 දින දක්වා දෙපාර්තමේන්තු පුහුණු වැය විෂය හා UNODC, ICRC යන ආයතන සමග සම්බන්ධීකරණය යටතේ වැඩසටහන් 4ක් නිලධාරින් 86 දෙනෙකුට පවරා ඇත.**

| | වැඩමුළුව පැවැත්වූ කාල පරිච්ඡේදයන් | වැඩමුළුව | නිලධාරීන් සංඛ්‍යාව | පැවැත්වූ ස්ථානය | සම්පත් දායකයින් පිළිබඳ තොරතුරු |
|---|---|---|---|---|---|
| 1 | 2022.01.20 – 2022.01.21 | රැඩිකල්කරණය සහ රැඩිකල්හරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 21 | මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදි | UNODC |
| 2 | 2022.03.22 | නව රැඳවියන් ඇතුලත් කිරීමේ දී සිදු කරන සෞඛ්‍ය පරික්ෂාවන් සම්බන්ධව | 14 | OZO හෝටලය කොළඹ | ICRC |
| 3 | 2022.07.18 – 2022.07.19 | ශ්‍රී ලංකාවේ බන්ධනාගාර සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ හැකියාවන්, කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම (පලමු කණ්ඩායම) | 27 | Golden Crown | UNODC |
| 4 | 2022.07.25 – 2022.07.26 | ශ්‍රී ලංකාවේ බන්ධනාගාර සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ හැකියාවන්, කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම (පලමු කණ්ඩායම) | 24 | Citrus Waskaduwa | UNODC |

**රැඳවි වෘත්තීය පුහුණු වැඩසටහන් ( වැය විෂය අංකය - 2509 )**

| 2022 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | නිමාකළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ නේවාසිකයින් සංඛ්‍යාව | වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|
| 2.00 | 1.09 | 29 | 404 | 54.30% |

**බන්ධනාගාර තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය විසින් 2022.01.01 දින සිට 2022.09.30 දක්වා සිදු කර ඇති වැඩ සටහන්**

| ව්‍යාපෘතිය | 2022 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|
| මෘදුකාංග සංවර්ධනය | 3.8 | 0.81 | 21% |

**කෘෂිකාර්මික හා කාර්මික අත්තිකාරම් ගිණුම**

| 2022 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි.) | 2022.08.31 දිනට වියදම (රු.මි.) | 2022.08.31 දිනට ආදායම (රු.මි.) |
|---|---|---|
| 110.00 | 35.29 | 96.84 |

### 4.6.5 <u>බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2022.01.01 දින සිට 2022.09.30 දින දක්වා සිදුකරන ලද සුවිශේෂී කාර්යයන්</u>

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ප්‍රථම වතාවට බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ වසර 12ක සේවා කාලයක් නිම කර නිත්‍යානුකූලව සේවයෙන් ඉවත්වූ නිලධාරීන් 194 දෙනෙකු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් (SPEAT FORCE) ලෙස විසිර යාම

- බන්ධනාගාර තදබදයට විසඳුමක් ලෙස මෙන්ම සුළු වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත කිරීම වෙනුවට විකල්පයක් ලෙස දියුණු විශෝධන ක්‍රමවේදයන් ක්‍රියාත්මක වන රටවල භාවිතා කෙරෙන නිවාස අඩස්සියේ තැබීමේ ක්‍රමවේදය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමටද පස් අවුරුදු සැලැස්ම මගින් යෝජනාකර තිබෙන අතර United Nations Standard Minimum Rules for Non-custodial Measures (The Tokyo Rules) මගින්ද මෙවැනි විකල්පයන් ප්‍රවර්ධනය කෙරේ.

- පවතින කොවිඩ් - 19 තත්වය හමුවේ රැඳවියන් බැලීමට නොහැකි වූ උතුරු පලාතේ සිර/සැකකරුවන්ගේ ඥාතින් හට බන්ධනාගාර දෙපාර්තමේනන්තුව හඳුන්වා දුන් e-visit තාක්ෂණය ඔස්සේ ලංකාවේ ඕනෑම බන්ධනාගාරයක රඳවා සිටින රැඳවියෙකුට අමුත්තන් බැලීමේ පහසුකම එම අවස්ථාවේදීම සලසා තිබුණි

- බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලද 103 A කණ්ඩායමේ ආධුනික බන්ධනාගාර නියාමක (පිරිමි) නිළධාරීන් 181 ද ,ආධුනික බන්ධනාගාර (කාන්තා) නිළධාරිනීයන් 23 ද, ඇතුලු 204 දෙනෙකු සඳහා මූලික පුහුණුව අඟුණකොළපැලැස්ස බන්ධනාගාර පුහුණු පාසැලේදී ලබාදී විසිර යන ලදී.

- වර්තමානයේ රට තුල පවතින ආහාර අර්බුදයට සහනයක් ලෙස බන්ධනාගාර ගත රැඳවියනගේ ශ්‍රම දායකත්වය ඵලදායි ලෙස යොදා ගනිමින් දිවයින පුරා පිහිටි සෑම බන්ධනාගාර ආයතනයක්ම සම්බන්ධ කර ගනිමින් "සරුසාර" සිපිරි ගෙයින් ගෙවිබිමට තේමාව යටතේ වගා කටයුතු ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කර ඇත

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු සඳහා බඳවා ගන්නා ලද 103 B කණ්ඩායමේ ආධුනික නියාමක නිලධාරීන් 175 ක් හා කාන්තා නියාමක නිලධාරිනියන් 20 ක් ඇතුළුව 195 ක් මූලික පුහුණු පාඨමාලාව අවසන් කර විසිර යාමේ උත්සවය පැවැත්විණි.

### 4.6.6 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 8,705.89 | 5,248.18 | 60.20% |
| ප්‍රාග්ධන වියදම | 399.71 | 196.22 | 49.00% |
| **එකතුව** | **9,105.60** | **5,444.40** | **59.80%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.7 ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

### 4.7.1 හැඳින්වීම

1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශය යටතේ නියාමන ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාව තුළ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. 1999 අංක 46 දරණ ප්‍රජා විශෝධනආඥා පනතයටතේ අධිකරණ 3කින් ආරම්භවු නියාමන ව්‍යාපෘතිය 2008 වසරේදී දෙපාර්තමේන්තුවක් බවට පත් වූ අතර 2018 මැයි මාසයේ සිට නැවතත් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මේ වන විට දිවයින පුරා සංචාරක හා මහේස්ත්‍රාත් අධිකරණ 125ක ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. සුලු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම තුළින් අධික බන්ධනාගාර තදබදය අඩු කිරිම, වරදකරුවන් නඩත්තුව සඳහා වැයවන අධික වියදම අවම කිරීම, සුලු වරදකරුවන් බන්ධනාගාර ගතවිම තුළින් සංවිධානාත්මක අපරාධ කරුවන් බවට පත්විමේ ඉඩකඩ වැලැක්විම හා ඔවුන් වඩාත් ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු වේ. අධිකරණයේ සුළු වරදකරුවකු වු පුද්ගලයෙකුට ප්‍රජා විශෝධන ආඥාවක් ලබා දීම තුළින් අපේක්ෂා කරනුයේ ප්‍රජාව තුළ සිටියදිම ඔහු වරදකාරි චර්යා රටාවෙන් මුදවා යහපත් පුරවැසියකු බවට පත් කිරිමට අවශ්‍ය කටයුතු කිරිමයි.

මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණ වලට අනුබද්ධිතව පිහිටුවා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල වලට අනුයුක්ත දෙපාර්තමේන්තු නිලධාරින් විසින් විවිධ වු විශෝධන වැඩසටහන් සිදුකරනු ලබයි. නිලධාරින්ගේ අධික්ෂණය යටතේ කටයුතු කරන ආඥාලාභියා නිවැරදි මගට යොමුකිරිම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

වරදකරුවන් පමණක් නොව වරදට යොමුවිය හැකි පුද්ගලයන්ද යහමඟට ගැනිම කාලින අවශ්‍යතාවක් වි ඇති බැවින් ඒ පිලිබඳවද අවධානය යොමු කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භයේදිට වඩා තම කාර්ය පරාසය පුළුල් කර ඇත. එම කාර්යන් සිදුකිරීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

### 4.7.2 සේවාවන්

1. 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක වීම මගින් සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ විශෝධනය කිරීම.
2. සුළු වරදකරුවන් බන්ධනාගාර ගතවීම අඩුකර බන්ධනාගාර තදබදය හා ඒ සඳහා වැයවෙන රජයේ වියදම් අඩුකරීම.
3. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොමුකර ගැනීම.
4. ප්‍රජා විශෝධන ආඥාලාභීන් මානසික, අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම.
5. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ හා අවදානම් සහිත පුද්ගලයන්ගේ පවුල් සංවර්ධනය කිරීම.

**4.7.3** <u>ප්‍රගතියට අදාළ තොරතුරු</u>

1. ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව - පළාත් අනුව (2022.01.01 – 2022.09.30)

| පළාත | නියෝග ලැබූ ආඥාලාභීන් සංඛ්‍යාව |
|---|---:|
| බස්නාහිර | 1,704 |
| මධ්‍යම | 622 |
| ඌව | 404 |
| දකුණ | 475 |
| සබරගමුව | 366 |
| නැගෙනහිර | 404 |
| වයඹ | 442 |
| උතුරු මැද | 263 |
| උතුර | 641 |
| **එකතුව** | **5,321** |

2. විශෝධන ආඥා පිළිබඳ තොරතුරු (2022.01.01 – 2022.09.30 දක්වා)

| ලබාගත් ආඥා සංඛ්‍යාව | අවසන් කරන ලද ආඥා සංඛ්‍යාව | කඩ කිරීම් සංඛ්‍යාව |
|---|---|---|
| 5,321 | 3,332 | 1,304 |

*(අනෙකුත් නඩු ක්‍රියාත්මක වෙමින් පවතියි.)

3. පවත්වන ලද විශෝධන හා වෙනත් වැඩසටහන් (2022.01.01 – 2022.09.30 දක්වා)

| අනු අංකය | වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|---:|
| 1 | ප්‍රතිකාර / මත් නිවාරණ වැඩසටහන් | 684 |
| 2 | වෘත්තීය පුහුණු වැඩසටහන් | 148 |
| 3 | ආධ්‍යාත්මික වැඩසටහන් | 449 |
| 4 | රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 212 |
| 5 | පොදු ස්ථාන පවිත්‍රතා ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියත්මක කිරීම | 1,105 |
| 6 | ගෘහ ආර්ථික මූල්‍ය කළමනාකරණය | 223 |
| 7 | සුළු පරිමාණ ව්‍යාපාර කළමනාකරණය | 34 |
| 8 | නිෂ්පාදන අලෙවිය සඳහා සූදානම් කිරීම හා අලෙවිකරණ ක්‍රියාවලිය | 24 |

| | | |
|---|---|---|
| 9 | ආඥාලාභීන්ට සුළු ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට කුඩා ව්‍යාපාර කළමනාකරණ අංශය වෙත යොමු කිරීම | 40 |
| 10 | සුදුසු ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර ලබාදීම | 31 |
| 11 | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ප්‍රජා මූල සංවිධාන දැනුවත් කිරීම (ග්‍රාම නිලධාරි කොට්ඨාස ආවරණය වන පරිදි) | 607 |
| 12 | ප්‍රජාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් පැවැත්වීම (ජංගම සේවා / විශේෂ දින/වෙනත්) | 119 |
| 13 | රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි) | 144 |
| 14 | නීතිඥවරුන් හා අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීම | 25 |
| | **එකතුව** | **3,845** |

### 4.7.4 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 519.85 | 356.99 | 69% |
| ප්‍රාග්ධන වියදම | 9.79 | 3.90 | 40% |
| **එකතුව** | **529.64** | **360.90** | **68%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.8 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය

### 4.8.1 හැඳින්වීම

වසර තිහක යුද්ධය අවසානයේ රජයට භාර වූ හා අධිකරණ නියෝග මත යොමු කරන ලද නොමගගිය සටන්කරුවන් හා මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් පුනරුත්ථාපනය කර සමාජයට වැඩදායී පුද්ගලයින් ලෙස සමාජගත කිරීමේ ක්‍රියාවලිය මෙම කාර්යාංශය මගින් සිදු කරනු ලබයි. නොමගගිය සටන්කරුවන් 12194 ක් මේ වන විට සාර්ථකව පුනරුත්ථාපනය කර අවසන් කර ඇති අතර මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ,කන්දකාඩු , තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර හා එකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව යන පුනරුත්ථාපන මධ්‍යස්ථාන 03හි නේවාසිකව පුනරුත්ථාපනය කරනු ලබයි.

මෙම පුනරුත්ථාපනලාභීන්ගේ පුනරුත්ථාපන කාලසීමාව මූලික වශයෙන් වසරක් වන අතර මුල් මාස 06ක කාලය තුළ මූලික පුනරුත්ථාපන ක්‍රියාවලිය සිදු කර ඉන් අනතුරුව දෙවන මාස 06ක කාලය උපදේශන ක්‍රියාවලියක් සමග වෘත්තීය පුහුණුව සඳහා යොමු කරනු ලබයි. එසේ පුනරුත්ථාපනය සඳහා යොමු කරන ලද පුනරුත්ථාපනලාභීන්ට අවශ්‍ය මූලික පහසුකම් සපුරාලමින් විධිමත් කාල සටහනකට අනුව මානසික සෞඛ්‍ය වැඩසටහන්, ආධ්‍යාත්මික වැඩසටහන්, විවිධ චිකිත්සාවන්, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණය, නායකත්වය හා පෞර්ෂ වර්ධන පුහුණුව, සෞන්දර්යාත්මක වැඩසටහන්, ක්‍රීඩා වැඩසටහන්, ජීවනෝපාය ඉහල නන්වාලීම සඳහා ස්වයං රැකියා වැඩසටහන් සමගින් වෘත්තීය පුහුණුව ලබා දීමට කටයුතු කරනු ලබයි.

පුනරුත්ථාපන කාලය අවසන් වී සමාජගත වීමෙන් අනතුරුව ඔවුන්ගේ ඉදිරි ජීවිතය සාර්ථක කර ගැනීමට ආර්ථික, සමාජීය හා සුභසාධන කටයුතු ඉහල නැංවීම සඳහා පසුවිපරම් මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත පශ්චාත් පුනරුත්ථාපන ප්‍රතිශ්ඨාධාර ශාඛා කාර්යාල මගින් සිදු කරනු ලබයි.

### 4.8.2 2022.01.01 දින සිට 2022.09.30 දක්වා කාර්ය සාධනයට අදාල තොරතුරු

1. පුනරුත්ථාපන මධ්‍යස්ථානයන් හි 2022.09.30 දිනට සිටින පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව.

| පුනරුත්ථාපන මධ්‍යස්ථානය | පුනරුත්ථාපලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් | නොමඟ ගිය සටන්කරුවන් |
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු | 436 | - |
| තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | 38 | - |
| සමාජගත කිරිමේ මධ්‍යස්ථානය -වව්නියාව | 142 | 02 |
| **එකතුව** | **616** | **02** |

**2.** 2022.01.01 දින සිට 2022.09.30 දක්වා පුනරුත්ථාපනය සඳහා යොමු කළ සංඛ්‍යාව සහ සමාජගත කළ සංඛ්‍යාව.

| විස්තරය | පුනරුත්ථාපනයට යොමු කළ සංඛ්‍යාව | සමාජගත කළ සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 111 | 12 |
| පෙබරවාරි | 115 | 15 |
| මාර්තු | 180 | 43 |
| අප්‍රේල් | 160 | 29 |
| මැයි | 215 | 49 |
| ජූනි | 145 | 83 |
| ජූලි | 83 | 78 |
| අගෝස්තු | 95 | 317 |
| සැප්තැම්බර් | 141 | 62 |
| එකතුව | **1245** | **688** |

**4.8.3** **2022.01.01 දින සිට 2022.09.30 දක්වා සිදු කරනු ලබන ක්‍රියාකාරකම්.**

| | පාඨමාලාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **1** | මානසික හා කායික සංවර්ධන වැඩසටහන් (ආධ්‍යාත්මික, උපදේශනය, යෝගා හා විවිධ චිකිත්සක) | 184 | සියලුම පුනරුත්ථාපනලාභින් සඳහා |
| **2** | අධ්‍යාපනික වැඩසටහන් ( සිංහල, ඉංග්‍රිසි හා දෙමළ භාෂා භාෂා, තාක්ෂණික දැනුම හා විශේෂ දින සැමරුම් ) | 65 | සියලුම පුනරුත්ථාපනලාභින් සඳහා |
| **3** | නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩසටහන් | 09 | 550 |
| **4** | ස්වයං රැකියා පුහුණු වැඩසටහන් | 05 | 235 |

පුනරුත්ථාපනලාභීන් වෙනුවෙන් සිදුකල වෘත්තීය පුහුණු පාඨමාලා

| අ/අ | පාඨමාලාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පැස්සුම් ශිල්පි පාඨමාලාව | 1 | 14 |
| 2 | වඩු කාර්මික ( ගෘහ භාණ්ඩ) | 1 | 17 |
| 3 | ජලනල කාර්මික | 2 | 17 |
| 4 | පෙදරේරු | 1 | 15 |
| 5 | වඩු කාර්මික ( ගොඩනැගිලි) | 1 | 19 |
| 6 | මැණික් කැපීමේ හා ඔප දැමීමේ පාඨමාලාව | 1 | 13 |
| 7 | පරිගණක පාඨමාලාව | 1 | 16 |

| | | | |
|---|---|---|---|
| 8 | පරිඝණක දෘඩාංග පාඨමාලාව | 1 | 13 |
| 9 | භෝජනාගාර සහයක | 2 | 52 |
| 10 | තත්ත්ව පාලන ඇගලුම් | 1 | 21 |
| 11 | කොණ්ඩා කැපිමේ හා සැකසීමේ පාඨමාලාව | 1 | 19 |
| 12 | බේකරි ශිල්පි | 1 | 26 |
| 13 | විදුලි කාර්මික පාඨමාලාව | 2 | 47 |
| 14 | ඇලමිණියම් පිරිසැකසුම් | 1 | 19 |
| 15 | කෘෂි කාර්මික පාඨමාලාව | 1 | 14 |
| 16 | බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු පුහුණු පාඨමාලාව | 2 | 39 |
| | එකතුව | 20 | 361 |

### 4.8.4 වෙනත් වැඩසටහන්

- ජීවත ආරක්ෂක ක්‍රමවේද පිළිබද දැනුවත් කිරිම
- මූලික අපදා කලමණාකරණය පිළිබද දැනුවත් කිරිම
- හදසි ගිනිමය තත්ත්වයකදි ක්‍රියාකල යුතු ආකාරය පිළිබද දැනුවත් කිරිම
- ප්‍රථමාධාර ලබා දීම පිළිබද දැනුවත් කිරිම
- කාබනික පොහොර නිෂ්පාදනය පිළිබදව
- ජල, විදුලිය,වනාන්තර හා පරිසරය සුරකිම පිළිබද දැනුවත් කිරිම
- වෙරළ සංරක්ෂණ හා මුහුදු සම්පත සුරකිම පිළිබද දැනුවත් කිරිම
- යහපත් පවුල් ජිවිතයක් ගත කරන්නේ කෙසේද යන්න
- යහපත් ළමා පරපුරක් බිහි කරන්නේ කෙසේද දැනුවත් කිරීමේ වැඩසටහන
- යම් කිසි ස්ථානයක බෝම්බයක් ඇත්නම් සාමාන්‍ය පුරවැසියකු වශෙයන් ක්‍රියා කල යුතු ආකාරය
- සුදුසුකම් සපුරා ඇති පුනරුත්ථාපනලාභීන් හට රියදුරු බලපත්‍ර ලබා දීම
- උගුර, කණ, නාසය, අක්ෂි, දන්ත, සමාජ රෝග, සමේ රෝග බෝනොවන රෝග, වකුගඩු රෝග සම්බන්ධ වෛද්‍ය සායන හා දැනුවත් කිරීමේ වැඩසටහන්
- ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා දිමේ වැඩසටහන
- ශ්‍රි ලංකාවේ චෛතිහාසික ස්ථාන පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන
- ජංගම දුරකථන භාවිතයේ අනිසි ප්‍රතිවිපාක හා සමාජ මාධ්‍ය වගකිමෙන් යුතුව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබදව දැනුවත් කිරිම.

2022.01.01 දින සිට 2022.09.30 දක්වා පසුවිපරම් කාර්යාල මගින් පසුවිපරම් කළ සංඛ්‍යාව

| අ/අ | දිස්ත්‍රික්කය | සමාජගත කල පුනරුත්ථාපනලාභින් මුලු සංඛ්‍යාව | 2022. 01. 01 දින සිට 2022.09.30 දිනට පසු විපරම් කර ඇති සංඛ්‍යාව | පසු විපරම් කිරීමට නියමිතව ඇති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | පුආසාසුකසම්කා - කොළඹ I | 1,248 | 308 | 83 |
| 2 | පුආසාසුකසම්කා - කොළඹ II | 1,133 | 105 | 165 |
| 3 | පුආසාසුකසම්කා - ගම්පහ | 1,878 | 341 | 500 |
| 4 | පුආසාසුකසම්කා - කළුතර | 354 | 248 | 12 |
| 5 | පුආසාසුකසම්කා - පුත්තලම | 151 | 33 | 0 |
| 6 | පුආසාසුකසම්කා - කුරුණෑගල | 532 | 256 | 3 |
| 7 | පුආසාසුකසම්කා - ගාල්ල | 670 | 195 | 8 |
| 8 | පුආසාසුකසම්කා - හම්බන්තොට | 224 | 182 | 23 |
| 9 | පුආසාසුකසම්කා - මහනුවර | 206 | 204 | 12 |
| 10 | පුආසාසුකසම්කා - අනුරාධපුර | 231 | 222 | 2 |
| 11 | පුආසාසුකසම්කා - පොළොන්නරුව | 57 | 77 | 4 |
| 12 | පුආසාසුකසම්කා - මඩකලපුව | 27 | 42 | 0 |
| 13 | පුආසාසුකසම්කා - යාපනය | 30 | 35 | 8 |
| **එකතුව** | | **6,741** | **2248** | **820** |

2022.01.01 දින සිට 2022.09.30 දින දක්වා පසු විපරම් කාර්යාලයන් විසින් සිදුකරන ලද වැඩසටහන් විස්තරය

| අ/අ | වැඩසටහන | සිදුකරන ලද වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 109 |
| 2 | රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 60 |
| 3 | උපදේශන වැඩසටහන් | 105 |
| 4 | ප්‍රජාව දැනුවත් කිරිමේ වැඩසටහන් | 40 |
| 5 | වෙනත් වැඩසටහන් | 12 |
| **එකතුව** | | **326** |

**4.8.5 2022.01.01 දින සිට 2022.09.30 දිනට සංවර්ධන වැඩසටහන්හි මූල්‍ය පිරිවැය**

| වැඩසටහන් | අනුමත අයවැය | වියදම 2022.09.30 දිනට | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| පුහුණු හා සංවර්ධන වැඩසටහන් | 23.39 | 14.33 | 61.37 | 82% |
| පසුවිපරම් කටයුතු | 2.04 | 1.41 | 68.73 | 100% |
| සලාක සහ ඉන්දන බිල්පත් නිරවුල් කිරීම | 264.64 | 159.40 | 60.23 | 65.23% |
| මූලික නිකුත් කිරීම් මිලදී ගැනීම | 25.13 | 2.80 | 10.33 | 49.32% |
| මුලුනැත්ගෙයි හා වෙනත් උපකරණ මිලදී ගැනීම | 20.68 | 7.40 | 35.82 | 60.51% |
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | 10.20 | 1.89 | 18.50 | 31.55% |
| ව්‍යාපෘති සඳහා ගෙවීම් පදනම මත යොදවා ඇති වාහන | 38.61 | 25.07 | 64.93 | 73.9% |
| ගොඩනැගිලි | 258.97 | 118.87 | 45.90 | 74.14% |
| **එකතුව** | **643.62** | **330.95** | **51.42** | **66%** |

**4.8.6 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 239.47 | 151.81 | 63.39% |
| ප්‍රාග්ධන වියදම | 643.62 | 330.95 | 51.42% |
| **එකතුව** | **883.09** | **482.76** | **54.67%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය

## 4.9 සමථ මණ්ඩල කොමිෂන් සභාව

**දැක්ම**

සමථකරණය තුළින් සංහිඳියාව සහ සමාජ සහජීවනය

**මෙහෙවර**

ශ්‍රී ලාංකික ප්‍රජාව හා සබැඳි කාර්යක්ෂම ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් දිවයින පුරා ප්‍රචලිත කිරීම

### 4.9.1 සමථ මණ්ඩල කොමිෂන් සභාව පිළිබඳ හැඳින්වීම

- 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මගින් සමථ මණ්ඩල කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.
- අධිකරණ ක්‍රියාවලිය පහසු කිරීමේ අරමුණින් අධිකරණ වෙත ඉදිරිපත් වන සුළු ආරවුල් නිරවුල් කිරීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස සමථකරණ ක්‍රියාවලිය බලගැන්වීම සමථ මණ්ඩල ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වේ.
- සමථ මණ්ඩල පනතෙහි විධිවිධාන ප්‍රකාරව සමථකරණ ක්‍රියාවලිය මගින් පාර්ශවයන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස සමථකරු කටයුතු කරනු ලබයි.
- ස්වකීය ආරවුල් විසඳීමේ පහසු හා අඩු වියදම් යාන්ත්‍රණයක් ලෙස සමථ මණ්ඩල ක්‍රමවේදය කෙරෙහි ප්‍රජාව නැඹුරු වීමත් සමඟ සෑම වසරකදීම ලක්ෂ 3කට ආසන්න ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙත යොමු වේ.
- සමථ මණ්ඩල වලට යොමුවන ආරවුල් ප්‍රමාණය හා ආරවුල් නිරවුල් කිරීමේ ප්‍රතිශත මත සමථ මණ්ඩල වල ප්‍රගතිය මනිනු ලැබේ.

### 4.9.2 සමථ මණ්ඩලකොමිෂන් සභාවේ සංයුතිය බලතල හා කාර්යභාරය

- **සංයුතිය**

  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති තුමන් විසින් වසර තුනක (03) ධූර කාලයක් සඳහා සාමාජිකයින් පස්දෙනෙකුගෙන් සමන්විත සමථ මණ්ඩල කොමිෂන් සභාවක් පත් කරනු ලබයි.

- **බලතල හා කාර්යභාරය**

  සමථ මණ්ඩල පනතෙහි සඳහන් කාර්යය සඳහා සමථකාරවරු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමද, සමථකරුවන් විසින් මේ පනත යටතේ තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම අධීක්ෂණය හා පාලනය කිරීමද ඒ සමථකරුවන් වෙත අවශ්‍ය විය හැකි විධාන නිකුත් කිරීමද සමථ මණ්ඩල කොමිෂන් සභාවේ කාර්යභාරය වේ.

### 4.9.3 සමථ මණ්ඩල කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කාර්යයන්

1. සමථ මණ්ඩල පනත අනුව ශ්‍රී ලංකාව පුරා සමථ මණ්ඩල පිහිටුවීම හා අවශ්‍ය පහසුකම් සලසා දීම.

   - ❖ සමථකරුවන් බඳවා ගැනීම සඳහා නාම යෝජනා කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, පස්දින පුහුණු වැඩමුළු පවත්වා සමථකරු පුහුණු කර බඳවා ගැනීම.

   - ❖ සමථ මූල මණ්ඩල හරහා දීප ව්‍යාප්තව ආරවුල් නිරාකරණය සඳහා මැදිහත් වීම

2. 2003 අංක 21 දරණ සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ ඉඩම් ආරවුල් පිළිබඳ සමථ මණ්ඩල 05 ක් පහත සඳහන් දිස්ත්‍රික්ක පාදක කර ගනිමින් පිහිටුවීම.

   - ❖ යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මඩකළපුව, කිළිනොච්චිය

3. පාසල් සමථ ඒකක පිහිටු වීම හා පාසල් සමථකරණ වැඩමුළු පැවැත් වීම.

4. සමථකරණය පිළිබඳව ප්‍රජාව දැණුවත් කිරීම.

### 4.9.4 2022.01.01 දින සිට 2022.08.31 දින දක්වා ප්‍රගතිය

| විස්තරය | ආරවුල් සංඛ්‍යාව |
|---|---:|
| 2022 වර්ෂය ආරම්භයේ විසඳීමට ඉතිරි වූ ආරවුල් සංඛ්‍යාව | 37,257 |
| 2022.01.01 දින සිට 2022.08.31 දින දක්වා ලද ආරවුල් සංඛ්‍යාව | 104,478 |
| මුළු එකතුව | 141,735 |
| සාකච්ඡා කර නිරවුල් කල ආරවුල් සංඛ්‍යාව | 36,064 |
| සාකච්ඡා කර නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව | 17,333 |
| සාකච්ඡා කළ මුළු ආරවුල් සංඛ්‍යාව | 53,397 |
| නිරවුල් කිරීමේ ප්‍රතිශතය | 67.54% |
| නොපැමිනිම හේතුවෙන් නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව | 43,336 |
| මුළු ආරවුල් සංඛ්‍යාවෙන් සාකච්ඡාවට ගත් ප්‍රතිශතය | 37.67% |
| වර්ෂය තුළ ලැබූ ආරවුල් සංඛ්‍යාවෙන් සාකච්ඡාවට ගත් ආරවුල් වල ප්‍රතිශතය | 51.10% |
| ප්‍රතික්ෂේප කිරිම | 1,862 |
| ඉල්ලා අස්කර ගැනීම | 4,416 |
| කටයුතු අවසන් කළ මුළු ආරවුල් සංඛ්‍යාව | 103,011 |
| ඉදිරියට ගෙන ගිය ආරවුල් සංඛ්‍යාව | 38,724 |

**4.9.5 2022.01.01 දින සිට 2022.09.30 දක්වා සාකච්ඡා කළ ආරවුල් ස්වභාවය අනුව**

| ආරවුල්වල ස්වභාවය | වාර්තා වූ සංඛ්‍යාව | සාකච්ඡා කළ ආරවුල් සංඛ්‍යාව | සමථ කළ ආරවුල් සංඛ්‍යාව | මුළු ආරවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| අධිකරණයෙන් | 12,141 | 7,837 | 5,788 | 11.60% |
| පොලිසියෙන් | 31,619 | 21,457 | 13,947 | 30.00% |
| බැංකු / මූල්‍ය ආයතන වලින් | 52,028 | 18,559 | 12,781 | 49.80% |
| ආරවුල්කරුවන්ගෙන් | 7,969 | 5,163 | 3,256 | 7.60% |
| වෙනත් | 721 | 381 | 292 | 0.70% |
| එකතුව | **104,478** | **53,397** | **36,064** | |

**4.9.6 2022.01.01 දින සිට 2022.09.30 දක්වා පළාත් මට්ටමින් සමථ මණ්ඩලවල ආරවුල් නිරවුල් කිරීම**

| පළාත | වාර්තා වූ ආරවුල් සංඛ්‍යාව | සාකච්ඡා කළ ආරවුල් සංඛ්‍යාව | නිරවුල් කළ ආරවුල් සංඛ්‍යාව | ආරවුල් ලැබීම (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 19,092 | 8,954 | 5,100 | 18.00% |
| මධ්‍යම | 14,358 | 7,173 | 5,148 | 13.70% |
| දකුණ | 13,972 | 7,291 | 4,760 | 13.40% |
| වයඹ | 12,540 | 6,797 | 5,233 | 12.00% |
| උතුරු මැද | 11,509 | 5,400 | 3,964 | 11.00% |
| ඌව | 8,486 | 3,995 | 2,916 | 8.10% |
| සබරගමුව | 12,078 | 6,010 | 3,703 | 11.60% |
| නැගෙනහිර | 8,537 | 5,527 | 3,726 | 8.20% |
| උතුර | 3,906 | 2,250 | 1,514 | 3.70% |
| එකතුව | **104,478** | **53,397** | **36,064** | |

**4.9.7 විශේෂ සමථ මණ්ඩල**

**ඉඩම් සමථ මණ්ඩල**

| අනු අංක | මධ්‍යස්ථානය | වාර්තා වූ ආරවුල් සංඛ්‍යාව | සාකච්ඡා කළ ආරවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | මඩකලපුව | 162 | 353 |
| 02 | කිලිනොච්චි | 115 | 38 |
| 03 | යාපනය | 183 | 17 |
| 04 | වව්නියාව | 441 | 174 |
| 05 | ත්‍රිකුණාමලය | 162 | 65 |
| 06 | මන්නාරම | 111 | 65 |
| 07 | අනුරාධපුර | 251 | 150 |
| එකතුව | | **1,425** | **862** |

### 4.9.8 2022.01.01 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය පිළිබඳ වෙනත් තොරතුරු

**සමථ මූල මණ්ඩල කටයුතුවල ප්‍රගතිය**

| අනු අංකය | විස්තරය | ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත සංඛ්‍යාව | සිදු කිරීමට හැකි වූ සමථ මූල මණ්ඩල සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | ධූරකාලය අවසන්ව සමථ මූල මණ්ඩල ගැසට් කිරීම | 41 | 52 | 100% |
| 2 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | 73 | 40 | 54% |
| 3 | පස් දින පුහුණු | 28 | 28 | 100% |
| | එක් දින පුහුණු | - | 2 | - |
| 4 | පත්වීම් ලබා දීම | 54 | 38 | 70% |

**නවක සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම**

| අනු අංකය | විස්තරය | පැවැත්වූ පුහුණු වැඩමුළු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පාසල් සමථකරණය පිළිබඳ පස්දින පුහුණු වැඩමුළු | 7 |

### 4.9.9 2022.10.01 දින සිට 2022.12.31 දින දක්වා සැලසුම්

| අනු අංකය | කාර්යය | වැඩසටහන් ගණන | | | වගකීම දරන නිලධාරීන් |
|---|---|---|---|---|---|
| | | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | |
| 1 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිත ප්‍රජා සමථ මූල මණ්ඩල | 1 | 10 | 8 | ලේකම් (සමථ මණ්ඩල කොමිෂන් සභාව) |
| 2 | පස්දින පුහුණු වැඩමුළු පැවැත්වීමට ඇති ප්‍රජා සමථ මූල මණ්ඩල | 4 | 5 | 5 | |
| 3 | පත්වීම් ලබා දීමට ඇති ප්‍රජා සමථ මූල මණ්ඩල | 3 | 3 | 3 | |
| 4 | නවක සංවර්ධන නිලධාරීන් සඳහා පාසල් සමථකරණය පිළිබඳ පැවැත්වීමට නියමිත පස්දින පුහුණු වැඩමුළු | 4 | - | - | |

### 4.9.10 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 390.64 | 249.02 | 63.74% |
| ප්‍රාග්ධන වියදම | 1.05 | 0.03 | 2.91% |
| **එකතුව** | **391.69** | **249.05** | **63.58%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.10 කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය

දැක්ම

රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය වඩා තහවුරු කිරිම

මෙහෙවර

ශක්තිමත් හා පුහුණු කාර්යය මණ්ඩලයක් හරහා කඩිනම් වූත්, සාධාරණ වූත් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රියාවලියක් තුලින් රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරු කිරිම

### 4.10.1 හැඳින්වීම

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 31 (ආ) වගන්තිය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සම්බන්ධ ඉල්ලුම්පත් විභාග කොට විසඳීම කම්කරු විනිශ්වය සභා වෙත පැවරී ඇති මූලික වගකීම වේ. රාජ්‍ය නොවන ආයතන වල සේවක පක්ෂය රැකියා වලින් නෙරපීම් ආදී අසාධාරණකම් පිළිබඳව යුක්තිය ඉෂ්ඨ කරවා ගැනීම සඳහා ඔවුන්ට ඇති මහඟු වරප්‍රසාදයක් ලෙස කම්කරු විනිශ්වය සභාව දැක්විය හැක. කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය යටතේ කම්කරු විනිශ්වය සභා 39 ක් ක්‍රියාත්මක වේ.

කම්කරු විනිශ්වය සභා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත් ලබාදීම හා කළමනාකරණය කිරීම කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් වේ.

1. පහත සඳහන් ප්‍රදේශවල කම්කරු විනිශ්වය සභා ස්ථාපිතව ඇත.

| | කම්කරු විනිශ්වය සභාව | ස්ථිරද/සංචාර කද යන්න | නගරය |
|---|---|---|---|
| 01 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 01-කොළඹ 08 | ස්ථිර | කොළඹ 8 |
| 02 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 01 අතිරේක-බත්තරමුල්ල | ස්ථිර | බත්තරමුල්ල |
| 03 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 02/ අතිරේකය - බත්තරමුල්ල | ස්ථිර | බත්තරමුල්ල |
| 04 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 02-කොළඹ 08 | ස්ථිර | කොළඹ 8 |
| 05 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 03-මහනුවර | ස්ථිර | මහනුවර |
| 06 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 04-ගාල්ල | ස්ථිර | ගාල්ල |
| 07 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 05-බදුල්ල | ස්ථිර | බදුල්ල |
| 08 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 06-රත්තපුර | ස්ථිර | රත්තපුර |
| 09 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 08-කොළඹ | ස්ථිර | කොළඹ 8 |
| 10 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 09-නුවරඑළිය | ස්ථිර | නුවරඑළිය |
| 11 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 10-හැටන් | ස්ථිර | හැටන් |
| 12 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 13-කොළඹ 08 | ස්ථිර | කොළඹ 8 |
| 13 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 18-කළුතර | ස්ථිර | කළුතර |
| 14 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 19-අවිස්සාවේල්ල | ස්ථිර | අවිස්සාවේල්ල |
| 15 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 21- මීගමුව | ස්ථිර | මීගමුව |
| 16 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 21 අතිරේක-මීගමුව | ස්ථිර | මීගමුව |
| 17 | කම්කරු විනිශ්වයාධිකාරය අංක 22 -මඩකළපුව | ස්ථිර | මඩකළපුව |

| | | | |
|---|---|---|---|
| 18 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 23-කුරුණෑගල | ස්ථිර | කුරුණෑගල |
| 19 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 24-ගම්පහ | ස්ථිර | ගම්පහ |
| 20 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 25-පානදුර | ස්ථිර | පානදුර |
| 21 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 26- මාතර | ස්ථිර | මාතර |
| 22 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 27 - අනුරාධපුර | ස්ථිර | අනුරාධපුරය |
| 23 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 28-හලාවත | ස්ථිර | හලාවත |
| 24 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 30-කඩුවෙල | ස්ථිර | කඩුවෙල |
| 25 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 31-වත්තල | ස්ථිර | වත්තල |
| 26 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 32-ගල්කිස්ස | ස්ථිර | ගල්කිස්ස |
| 27 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 33-හෝමාගම | ස්ථිර | හොමාගම |
| 28 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 34-කොටපොළ | ස්ථිර | කොටපොල |
| 29 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 36-බණ්ඩාරවෙල | ස්ථිර | බණ්ඩාරවෙල |
| 30 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 37-තලවකැලේ | ස්ථිර | තලවකැලේ |
| 31 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 38-නාවලපිටිය | ස්ථිර | නාවලපිටිය |
| 32 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 39-මාතලේ | ස්ථිර | මාතලේ |
| 33 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 40-බලංගොඩ ((2018.08.23 බලංගොඩ කවිසය රත්නපුර කවිසයට තාවකාලිකව මාරු කර ඇත) | ස්ථිර | රත්නපුර |
| 34 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 42-කෑගල්ල | ස්ථිර | කෑගල්ල |
| 35 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 44-අම්පාර | ස්ථිර | අම්පාර |
| 36 | කම්කරු විනිශ්චයාධිකාරය අංක 46-කුළියාපිටිය | ස්ථිර | කුළියාපිටිය |
| 37 | කම්කරු විනිශ්චයාධිකාරය ත්‍රිකුණාමලය | ස්ථිර | ත්‍රිකුණාමලය |
| 38 | කම්කරු විනිශ්චයාධිකාරය යාපනය | ස්ථිර | යාපනය |
| 39 | කම්කරු විනිශ්චයාධිකාරය ඇඹිලිපිටිය | සංචාරක | ඇඹිලිපිටිය |

2. ස්ථිර කම්කරු විනිශ්චය සභා සංඛ්‍යාව 38කි.
3. සංචාරක කම්කරු විනිශ්චය සභා සංඛ්‍යාව 1කි.
4. දැනට සිටින කම්කරු විනිශ්චය සභා විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව 26කි.

### 4.10.2 <u>2022.01.01 දින සිට 2022.09.30 දින දක්වා ප්‍රගතිය</u>

| 2022.01.01 දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව | 2022.01.01 සිට 2022.09.30 දක්වා | | 2022.09.30 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පැවරූ නඩු ගණන | විසඳූ නඩු ගණන | |
| 6,008 | 916 | 1,381 | 5,543 |

### 4.10.3 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 415.05 | 317.01 | 80.92% |
| ප්‍රාග්ධන වියදම | 8.10 | 3.166 | 40.70% |
| **එකතුව** | **423.15** | **320.18** | **75.66%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 4.11 අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු ආයතනය

**මෙහෙවර**

අධිකරණවල සේවයේ නියුතු විනිසුරුවරුන් හැර අනෙකුත් උපලේඛනගත හා උපලේඛනගත නොවන නිලධාරින් පුහුණු කිරීම තුළින් අධිකරණ සේවයේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මකභාවය ඉහළ නංවා නඩු විසඳීමේ යාන්ත්‍රණයේ ඇති ප්‍රමාදයන් අවම කර ජනතාවට වඩා යහපත් සේවයක් ලබා දීම.

### 4.11.1 හැඳින්වීම

අධිකරණවල සේවය කරන අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීම අරමුණු කර ගනිමින් 2010 වර්ෂයේ මෙම ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මගින් මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකරන නිලධාරින් සහ සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් පහත අරමුණු මුල්කර ගනිමින් පවත්වා ඇත.

01. ආකල්ප හා විනය සංවර්ධනය
02. රාජකාරිය පිළිබඳ අවබෝධය
03. නව්‍යකරණය හා නිර්මානකරණය
04. අල්ලස හා දූෂණය මැඩලීම

### 4.11.2 පුහුණු වැඩසටහන් පැවැත්වීම

**පවත්වන ලද පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සේවාරම්භක පුහුණු වැඩසටහන<br>• අධිකරණ අමාත්‍යාංශයට බඳවාගත් නවක රියදුරන් සහ කා.සේ.සේ. වරුන් සඳහා | 01 | 63 |
| 02 | ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන<br>• අධිකරණ අමාත්‍යාංශයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා | 01 | 32 |
| 03 | ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාලව මිල විචලනය පිළිබඳ පුහුණු වැඩසටහන<br>• අධිකරණ අමාත්‍යාංශයේ සේවයේ නියුතු තාක්ෂණික නිලධාරීන් සඳහා | 01 | 22 |
| 04 | ආයතන සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන<br>• සමථ මණ්ඩල කොමිෂන් සභාවේ නිලධාරීන්<br>• නීතිපති දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත ලිපිකරු නිලධාරීන්<br>• කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛිකාවන් සඳහා | 03 | 46 |
| 05 | ආකල්ප සංවර්ධනය හා ඵලදායීතාව පිළිබඳ පුහුණු වැඩසටහන<br>• කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම්වරුන් සඳහා | 01 | 13 |

| | | | |
|---|---|---|---|
| 06 | තොරතුරු තාක්ෂණික යෙදවුම් පිළිබඳ පුහුණු වැඩසටහන<br>• කම්කරු විනිශ්චය සහා සහකාර ලේකම්වරුන් ස<br>• කම්කරු විනිශ්වය සහා ලඝු ලේඛිකාවන් සඳහා | 02 | 28 |
| 07 | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන්<br>• කම්කරු විනිශ්වය සහා සහකාර ලේකම්වරුන්<br>• නීතිපති දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත ලිපිකරු නිලධාරීන්<br>• කම්කරු විනිශ්වය සහා ලඝු ලේඛිකාවන් සඳහා | 05 | 87 |
| 08 | දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන්<br>• ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා (කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කවල)<br>• කම්කරු විනිශ්වය සහා හඳුන්වා දීම - කම්කරු විනිශ්වය සහා සහකාර ලේකම් වරුන් සඳහා<br>• ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා (ගම්පහ දිස්ත්‍රික්කයේ) | 03 | 78 |
| 09 | මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන<br>• කම්කරු විනිශ්වය සහා සහකාර ලේකම් වරුන් සඳහා | 01 | 13 |
| 10 | අපරාධ නීතිය හා විනය කාර්යය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන<br>• අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා | 01 | 17 |
| 11 | සිවිල් නීතිය හා මහේස්ත්‍රාත් අධිකරණවල හා දිසා අධිකරණවල භාවිතා වන ගිණුම් ක්‍රම<br>• අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා | 01 | 17 |
| 12 | අපරාධ නඩු කාර්ය පටිපාටිය සහ නඩු භාණ්ඩ අපහරණය පිළිබඳ පුහුණු වැඩසටහන<br>• අනුරාධපුර කලාපයේ අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා<br>• පොළොන්නරුව කලාපයේ අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා | 02 | 194 |
| 13 | සිවිල් නඩු කාර්ය පටිපාටිය සහ කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන<br>• අනුරාධපුර කලාපයේ අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා<br>• පොළොන්නරුව කලාපයේ අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා | 02 | 194 |
| 14 | විනය සහ ආචාරධර්ම පිළිබඳ පුහුණු වැඩසටහන<br>• නීතිපති දෙපාර්තමේන්තුවේ කා.සේ.සේ. සඳහා | 01 | 192 |
| 15 | දෙමළ භාෂා පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 205 |
| 16 | ආකල්ප හා සන්නිවේදන කුසලතා වැඩිදියුුණු කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන්<br>• අධිකරණ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා | 01 | 34 |
| 17 | විනය කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන<br>• අධිකරණ අමාත්‍යාංශයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා | 01 | 64 |
| | එකතුව | **30** | **1,299** |

**4.11.3 2022.01.01 සිට 2022.09.30 දක්වා කාර්ය සාධනයට අදාළ වෙනත් තොරතුරු**

| අනු අංකය | පැවැත්වූ දිනය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | විභාග අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 2022.02.24 | අධිකරණ අමාත්‍යාංශයේ සහකාර ලේකම් (නීති) III ශ්‍රේණියේ නිලධාරී සහ නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ සහකාර ලේකම් (නීති) III ශ්‍රේණියේ නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 2 |
| 2 | 2022.06.16 | අධිකරණ අමාත්‍යාංශයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දෙපාර්තමේන්තුගත ලිඛිත පරීක්ෂණය | 3 |
| 3 | 2022.06.21 | නීතිපති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ 02 සේවා ගණයේ දෙපාර්තමේන්තුගත ලිපිකරු III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 25 |

**4.11.4 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 3.97 | 2.45 | 62% |
| ප්‍රාග්ධන වියදම | 5.00 | 1.61 | 37% |
| **එකතුව** | **8.97** | **4.06** | **45%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 05. අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය ආයතන

### 5.1 නීති ආධාර කොමිෂන් සභාව

දැක්ම

ශ්‍රී ලාංකිකයින් සියළු දෙනාටම සාධාරණත්වය ඉටු කිරීමට හැකිවන සේ යුක්තිය කරා පහසු ප්‍රවේශයක් ලබා දීමට කටයුතු කිරීම.

මෙහෙවර

දරිද්‍රතාවය නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනීමට නොහැකි වූ ශ්‍රී ලංකාවේ දුගී ජන කොටස් සඳහා නීති ආධාර සැපයීමත්, අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය ලබා දීමත්, සමස්ථ සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීමත්, නව නීති සම්පාදනයේදී හා නෛතික නීති ප්‍රතිසංස්කරණ වලදී රජයට උපදේශණ කාර්යයයේ නිරත වීමත්, ආදී කාර්යයන් හරහා ජන සමාජය යුක්තිය කරා පහසු ප්‍රවේශයකට නිරත කරවීම.

#### 5.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් සංස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. දරිද්‍රතාවය නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට නොහැකි වූ ශ්‍රී ලාංකිකයින් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය ලබාදීම.

ඕනෑම පුද්ගලයෙකුට නීති උපදෙස් ලබා දීම, සමස්ත සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීම, නව නීති සම්පාදනයේදී හා නෛතික නීති ප්‍රතිසංස්කරණ වලදී රජයට උපදේශන කාර්යයේ නිරත වීම හා පර්යේෂණ කටයුතු සිදු කිරීම අනෙකුත් කාර්ය භාරය අතර ප්‍රධාන වේ.

**නීති අංශය**

1. යුක්තියේ පිළිසරණ ලබා ගැනීමට හැකියාවක් නොමැති තැනැත්තන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.

2. ඕනෑම කෙනෙකුට නොමිලේ නීති උපදෙස් ලබා දීම.

3. නව නීති සම්පාදනයේ දී හා නීති ප්‍රතිසංස්කරණ වල දී රජයට උපදේශන කාර්යය සිදු කිරීම

ඍජුව ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන කොළඹ නීති ආධාර මධ්‍යස්ථානය ඇතුළුව නීති ආධාර කාර්යාල 85 ක් වේ. ඒවා දිවයින පුරා පිහිටි අධිකරණ ආශ්‍රිතව පිහිටුවා ඇත. අධිකරණමය කටයුතු වල දී ග්‍රාම නිලධාරීවරයා මඟින් කැඳවූ ආදායම් වාර්තාව සලකා බලන නමුත් නඩත්තු, ගෘහස්ථ ප්‍රචන්ඩත්ව, අපරාධ වින්දිත හා ළමයින් සම්බන්ධ නඩු කටයුතු වල දී ඒ සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**<u>නීති අංශය මඟින් සිදු කරනු ලැබූ සේවාව.</u>**

නීති ආධාර කොමිෂන් සභාවේ දීප ව්‍යාප්තව පවතින මධ්‍යස්ථාන 85ක නීතිමය උපදේශන ඇතුළු නඩු කටයුතු සම්බන්ධයෙන් වන විස්තර සම්බන්ධීකරණය කරමින් Google Sheet මගින් දත්ත හා තොරතුරු එක් රැස් කිරීමේ ක්‍රියාවලියක් නීති ආධාර කොමිෂන් සභාව මගින් ක්‍රියාවට නංවා ඇති අතර එමගින් පහසුවෙන් හා කඩිනමින් නීති අංශයේ ක්‍රියාවලීන් සිදුකර ගත හැකි වනු ඇත.

### 5.1.2 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා නීති ආධාර කොමිෂන් සභාව මගින් සේවා සපයන ලද නඩු පිළිබඳ විස්තර</u>

| නඩු පිළිබඳ විස්තරය | නඩු ප්‍රමාණය |
|---|---|
| 2021 වසරෙන් 2022 වසරට ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව | 38,099 |
| 2022 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා අළුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | 8,568 |
| 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට පැවති මුළු නඩු ගණන | 46,667 |
| 2022 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 7,931 |
| 2022 වර්ෂයේ ඔක්තෝබර් 01 වන දිනට රැගෙන ගිය නඩු සංඛ්‍යාව | 38,736 |
| 2022 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා දෙනු ලැබූ මුළු උපදේශන සංඛ්‍යාව | 89,557 |
| 2022 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා සිදු කරනු ලැබූ සමස්ථ සේවය | <u>46,667+89,557 = 136,224</u> |

**ආ) නඩු සඳහා පෙනී සිටීමේ කාර්යසාධනය**

| විස්තරය | එකතුව |
|---|---|
| දික්කසාද | 1,652 |
| නඩත්තු | 4,973 |
| ඉඩම් | 110 |
| බෙදුම් | 4 |
| වන්දි | 215 |
| මහාධිකරණවල ගොනු කර ඇති නඩු | 48 |
| අභියාචනාධිකරණවල ගොනු කර ඇති නඩු | 42 |
| අනතුරු | 126 |
| ඇප | 36 |
| අනෙකුත් | 314 |
| ළමා අයිතිවාතිවාසිකම් | 110 |
| කම්කරු විනිශ්චය සභා | 282 |
| අපරාධ | 172 |
| ශ්‍රේෂ්ඨාධිකරණ | 36 |
| අපරාධ වින්දිතයින් | 248 |
| විශේෂ | 58 |
| භාරකාරත්වය හා කුලවද්දා ගැනීම | 24 |
| ගෘහස්ත හිංසනය | 118 |
| එකතුව | **8,568** |

ඇ) <u>නීති ආධාර කොමිෂන් සභාව මඟින් පළාත් මට්ටමින් සේවා සැපයීම</u>

| පළාත | උපදේශන සංඛ්‍යාව | නඩු සඳහා පෙනී සිටීම | එකතුව |
|---|---|---|---|
| බස්නාහිර | 22,194 | 11,780 | 33,974 |
| ඌව | 10,009 | 3,417 | 13,426 |
| දකුණ | 11,455 | 5,705 | 17,160 |
| උතුර | 6,416 | 4,324 | 10,740 |
| සබරගමුව | 6,995 | 3,577 | 10,572 |
| වයඹ | 11,235 | 5,051 | 16,286 |
| මධ්‍යම | 7,044 | 3,762 | 10,806 |
| නැගෙනහිර | 6,788 | 4,998 | 11,786 |
| උතුරුමැද | 7,421 | 4,053 | 11,474 |
| එකතුව | **89,557** | **46,667** | **136,224** |

**5.1.3** <u>වැඩසටහන් හා ව්‍යාපෘති අංශය</u>

- **දැනුවත් කිරීමේ සහ සමාජ සහභාගීත්වය වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාවේ සම්පත් දායකත්වය ලබා දෙන ලද වැඩසටහන් - 182**
- **මුළු මාධ්‍ය වැඩසටහන් -36**

**විද්‍යුත් මාධ්‍ය -05**

| මාධ්‍ය ආයතනය | දිනය |
|---|---|
| ජාතික රූපවාහිණිය | 2022.02.20 |
| හරිත රූපවාහිණිය | 2022.03.03 |
| සියත රූපවාහිණිය | 2022.03.19 |
| Colombo TV | 2022.09.01 |
| Jaya TV | 2022.09.13 |

**මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් - 31**

නීති ආධාර කොමිෂන් සභාව මගින් දෙවන කාර්තුව තුල මව්බිම පුවත්පතේ කලාප 27ක් සඳහා "Guide line Right එක දැනගෙන Fight කරන්න" යනුවෙන්ද Ceylon Today පුවත්පතේ කලාප 04ක් සඳහා "Law check" යනුවෙන්ද නිති ආධාර කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකයේ සංස්කරණ දායකත්වය ලබා දී ඇත.

- **නීති ආධාර කොමිෂන් සභාව මගින් සංවිධානය කරන ලද නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වූ වැඩසටහන් - 57**
- **නීති ආධාර කොමිෂන් සභාව වෙත ආරාධනා කරන ලදුව සම්පත් දායකත්වය ලබා දෙන ලද නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වූ වැඩසටහන් -89**

### 5.1.4 සංවර්ධන නීති ආධාර අංශය.

**1. විගමනික ශ්‍රමිකයින් සම්බන්ධයෙන් වූ තොරතුරු ඒකකය.**

ගැටලු වලට මුහුණ පෑ විගමනික ශ්‍රමිකයින් සඳහා වෙන් වූ මෙම අංශය ස්වකීය සේවය සිදු කරනු ලැබේ. උපදේශන සේවය ලබා දීමෙන් පසුව එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලා අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත හෝ අවශ්‍ය අවස්ථාවන්හි අධිකරණමය කටයුතු උදෙසා හෝ ස්වකීය කාර්ය භාර්යය ක්‍රියාත්මක වේ. විගමනික ශ්‍රමික පවුල් දැනුවත් කිරීමේ වැඩටසටහහන්, ඔවුන්ගේ තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් මට්ටමින් ''ගැමි සංසදය'' නමැති ප්‍රජා මූල 17 අධීක්ෂණය කිරීම හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වෙමින් මෙම ඒකකය කටයුතු කරනු ලැබේ

**2. බන්ධනාගාර රැඳවියන්ගේ ඒකකය**

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර වල තදබදය අවම කිරීම උදෙසා සියලූම ජනතාවට යුක්තිය සඳහා පහසු ප්‍රවේශයක් ලබා දීම උදෙසාත් රාජ්‍ය පිරිවැය අවම කිරීම උදෙසාත් මෙම ඒකකය ක්‍රියාත්මක වේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම ඒකකය ක්‍රියාත්මක වේ. මෙමඟින් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර වල දීර්ඝ කාලයක් රඳවා සිටින නීතිඥ සහාය ලබා ගැනීමට නොහැකි වී ඇති තැනැත්තන් උදෙසා ඇප ලබා ගැනීමටත් ඇප කොන්දේසි අවම කර ගැනීම සඳහාත් නීතිඥ සහාය ලබා දීම සිදු කෙරෙනවා ඇත. ඒ සඳහා බන්ධනාගාර රැඳවියන් උදෙසා නීති සායන පැවැත්වීම එදිනෙදා ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය නීති දැනුම රැඳවියන්ට ලබා දිමත් බන්ධනාගාර නිලධාරීන් සඳහා නීතිමය දැනුම ලබා දීමේ වැඩසටහන් පැවැත් වීමත් සිදු කෙරේ.

ජනවාරි මස සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආශ්‍රිතව නීති ආධාර සායන හා ඇප ලබා ගැනීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම කාලය තුලදී ඇප නඩු 36 ප්‍රමාණයක් නව නඩු වශයෙන් ගොනු කොට ඇත.

**3. ඒ ආධුනික නීතිඥයින් සඳහා වන පුහුණු වැඩසටහන**

ශ්‍රී ලංකා නීති විද්‍යාලය සමඟ ඒකබද්ධව ක්‍රියාත්මක වේ. වසරකට නීතිඥවරුන් වශයෙන් දිවුරුම් දෙන ආධුනික නීතිඥයින් පුහුණු කිරීම මෙහි අරමුණ වේ. මෙම වසරේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ දී කණ්ඩායමක් දෙකක් යටතේ ආධුනික නීතිඥවරුන් 1,200ක ප්‍රමාණයක් පුහුණු කොට ඇති අතර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රවීණ විද්වත් ජනාධිපති නීතිඥවරුන් ඇතුළු සම්පත් දායකයින් බාහිර සේවය කොමිෂන් සභාව විසින් ලබා ගෙන තිබේ.

**4. බී සීමාවාසික පුහුණු වැඩසටහන**

නීති ආධාර කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයන්හී තෙවන හෝ අවසන් වසර සිසුන් සඳහා සීමා වාසික පුහුණුව දීපව්‍යාප්ත මට්ටමන් ලබා දී ඇති අතර මෙම වසරේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා 12 දෙනෙකු සඳහා සීමාවාසික පුහුණුව ලබා දී ඇත.

**5. වෛද්‍යවරුන් නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.**

අධිකරණ වෛද්‍ය නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා මානසික වෛද්‍ය නිලධාරීන් නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ අධිකරණමය කටයුතු වල දී වෛද්‍ය වෘත්තිකයින්ගේ වෘත්තීය නිපුණතාවය වර්ධනය කිරීම මෙහි අපේක්ෂාවයි. Covid-19 වසංගත තත්වය හේතුවෙන් Zoom තාක්ෂණය යොදා ගනිමින් ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

**6. සමෘද්ධිලාභීන් වෙනුවෙන් කරනු ලබන වැඩසටහන**

නීති ආධාර කොමිෂන් සභාව හා සමෘද්ධි දෙපාර්තමේන්තු ඒකාබද්ධව නීති ගැටළු ඇති සමෘද්ධිලාභීන්ගේ දත්ත එක්රැස් කරමින් (Data Base) දත්ත කීරයාවලියක් නිර්මාණය කර ඇති අතර එමගින් සමෘද්ධි ලාභී අඩු ආදායම්ලාභී ජනතාවට ඇති නීතිමය ගැටළු සඳහා කඩිනම් නීති උපදේශන සේවාවක් හා නඩු කටයුතු සම්බන්ධයෙන් මූලිකත්වය ලබා දී නොමිලේ ඔවුන්ගේ නීතිමය ගැටළු විසඳාලීමට හා යුක්තිය පසඳලීමට වැඩපිළිවෙලක් සකස් කොට ඇත. වැඩසටහන් 4ක් සිදු කර ඇත.

### 5.1.5 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 235.10 | 203.85 | 86% |
| ප්‍රාග්ධන වියදම | 10.00 | 3.30 | 33% |
| **එකතුව** | **245.10** | **207.15** | **85%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය

## 5.2 ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

**දැක්ම**

කළමනාකරණ මණ්ඩලයේ දර්ශනය වනුයේ ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම කළමනාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීමය.

**මෙහෙවර**

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මෙහෙවර වනුයේ පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම මගින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චය කාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළු සියළු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායි අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජනහිතකාමී පරිසරයක් සැකසීම තුලින් දර්ශනය සාක්ෂාත් කර ගැනීම වේ.

**පරමාර්ථය**

උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම ද සංකීර්ණයේ සහ එහි ගොඩනැගිලි වල ඇති පහසුකම් වැඩි කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඊට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම ද මණ්ඩලයේ පරමාර්ථ වන්නේය.

### 5.2.1 <u>කාර්යයන්</u>

1. උසාවි ශාලා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
2. ගරු විනිසුරු නිල මැදිරි සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
3. ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නීතිඥ මහතුන් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
4. තෙවන පාර්ශවය සඳහා මහජන වගකීම් රක්ෂණය හා පුද්ගලික හදිසි අනතුරු රක්ෂණ පහසුකම් සැපයීම.

### 5.2.1 <u>2022.01.01 දින සිට 2022.09.30 දින දක්වා ප්‍රගතිය</u>

#### <u>5.2.1.1 පුනරාවර්ථන වියදම</u>

- <u>නඩත්තු වියදම</u>

අ) යන්ත්‍ර හා පිරියත නඩත්තු

- විදුලි සෝපාන නඩත්තු කටයුතු
- දුරකථන සේවා නඩත්තු කටයුතු
- උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ මධ්‍යම වායුසමීකරණ පද්ධතිය, චිලර් හා Splite වර්ගයේ වායු සමීකරණ නඩත්තු සේවා කටයුතු
- උපකරණ සේවා නඩත්තු කටයුතු
- උපරිමාධිකරණ සංකීර්ණයේ ඇති විදුලි පැනල හා විදුලි අයිතම නඩත්තු සේවා කටයුතු

ආ) උපරිමාධිකරණ සංකීර්ණයේ අළුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ කටයුතු

ඇ) ගෘහ පාලන නඩත්තු කටයුතු

- සනීපාරක්ෂක පිරිසිදු කිරීමේ සේවාව උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල
- සනීපාරක්ෂක පිරිසිදු කිරීමේ සේවාව අමාත්‍යාංශ ගොඩනැගිල්ල
- කෘමි උවදුරු සේවාව උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල
- කෘමි උවදුරු සේවාව අමාත්‍යාංශ ගොඩනැගිල්ල

ඇ) උපරිමාධිකරණ සංකීර්ණයේ උද්‍යාන නඩත්තු කටයුතු

ඉ) උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල සඳහා අමතර ආරක්ෂක සේවා සැපයීම

ඊ) ආරක්ෂක හා ඉංජිනේරු අංශ සේවකයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීම

උ) උපරිමාධිකරණ සංකීර්ණයේ මෝටර් රථ සඳහා නඩත්තු කටයුතු

- **සැපයුම් හා අවශ්‍යතා**

- ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම
- වාහන සඳහා ඉන්ධන මිලදී ගැනීම
- යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ මිලදී ගැනීම
- උපරිමාධිකරණ සංකීර්ණයේ තෝරාගත් සේවකයින් සඳහා නිල ඇඳුම් මිලදී ගැනීම
- ගෘහ පාලන අවශ්‍යතා ඇති භාණ්ඩ මිලදී ගැනීම උදා : සනීපාරක්ෂක දියර

### 5.2.1.2 මූලධන වියදම

- උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු

  - ලේඛණාගාරයේ වහල අළුත්වැඩියා කටයුතු (සිවිල් අභියාචනාධිකරණය)
  - විනිසුරු නිල නිවාස යේ වැහිපීලි කාන්දුව හා අළුත්වැඩියා කටයුතු
  - වානේ මායිම් වැට අළුත්වැඩියා කටයුතු
  - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම

අ) යන්ත්‍ර හා පිරියත මිලදී ගැනීම

- CCTV කැමරා පද්ධතිය සැපයුම් හා ස්ථාපනය කිරීම
- වායුසමීකරණ සැපයුම් හා ස්ථාපනය කිරීම

ආ) කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ මිලදී ගැනීම

- මානව සම්පත් සංවර්ධනය

  කාර්යාලයේ සේවක මහත්ම මහත්මීන්ගේ ධාරිතා සංවර්ධනය

### 5.2.2 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 215.47 | 136.40 | 63% |
| ප්‍රාග්ධන වියදම | 20.00 | 7.00 | 35% |
| **එකතුව** | **235.47** | **143.40** | **61%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 5.3 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

### 5.3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 1985 අංක 46 දරණ පනත යටතේ පිහිටුවා ඇත. මෙම ආයතනයේ පරිපාලනය කළමනාකරණ මණ්ඩලයක් මඟින් සිදුවේ. එහි කළමනාකාරිත්වය අගවිනිසුරුතුමා සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන අධිකරණ අමාත්‍යාංශය මඟින් වෙන් කරනු ලැබේ.

**ආයතනයේ විෂයයන් හා කාර්යයන්**

i. අධිකරණ නිලධාරීන් අතර අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලැස්වීම

ii. අධිකරණ නිලධරන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරිමේ අදහසින් රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සහ පැවැත්වීම.

iii. යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම

iv. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම.

### 5.3.2 2022.01.01 වන දින සිට 2022.09.30 වන දින දක්වා පවත්වන ලද වැඩමුළු, සම්මන්ත්‍රණ, වෙබ් අඩවි පාදක සම්මන්ත්‍රණ

| අනු අංක | වැඩමුළු, සම්මන්ත්‍රණ, වෙබ් අඩවි පාදක සම්මන්ත්‍රණ | සහභාගී වූ විනිසුරුවරුන් | සැසිවාර සංඛ්‍යාව | සහභාගී වූ විනිසුරුවරුන් සංඛ්‍යාව | දරන ලද වියදම |
|---|---|---|---|---|---|
| 1 | නිලය/පදවිය සිරිත් පරිදි පවරා භාරකර නිලයේ /පදවියේ ස්ථාපනය වීම 2021/2022 | අභිනවයෙන් බඳවාගන්නා ලද විනිසුරුවරුන් | 38 | 46 | නැත |
| 2 | "නූතන පරිගණක අපරාධ/විද්‍යුත් සාක්ෂි අදාළත්වය සහ ඇගයීම" පිළිබඳ වෙබ් අඩවි පාදක සම්මන්ත්‍රණය | අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන සියළුම අධිකරණ නිලධාරීන් | 01 | 175 | නැත |
| 3 | අභිනවයෙන් බඳවාගන්නා ලද මහාධිකරණ විනිසුරුවරුන් සඳහා මූලාරම්භක හැඳින්වීමේ වැඩසටහන -2022 | මහාධිකරණ විනිසුරුවරුන් | 01 | 13 | නැත |
| 4 | "1990 අංක 2 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ මූල්‍ය කල්බදු සහ පාරිභෝගික ණය පනත යටතේ කාර්ය පටිපාටිය" පිළිබඳ වෙබ් අඩවි පාදක සම්මන්ත්‍රණය | සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන සියළුම අධිකරණ නිලධාරීන් | 01 | 136 | නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | "අපරාධ නඩුවල දී සාක්ෂි ඇගයීම; ප්‍රායෝගික ප්‍රවේශයක්" පිළිබඳ වෙබ් අඩවි පාදක සම්මන්ත්‍රණය | අපරාධ අධිකරණ විනුසුරුවරුන් සහ අභිනවයෙන් බඳවාගන්නා ලද අධිකරණ නිලධාරීන් | 01 | 157 | නැත |
| 6 | "කම්කරු විනිශ්චය සභා නීතිකෘත්‍යවල දී විද්‍යුත් සාක්ෂි පිළිගැනීම" පිළිබඳ සම්මන්ත්‍රණය | කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන් | 01 | 29 | නැත |
| 7 | ලංකා සර්වාංග වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සහයෝගය ඇතිව, "විනිශ්චයකාරවරයන්ගේ මානසික සෞඛ්‍ය සහ ශුභසාධනය " පිළිබඳ සම්මන්ත්‍රණය | ජ්‍යෙෂ්ඨතම දිසා විනිසුරුවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් 80 දෙනෙකු | 01 | 80 | නැත |
| 8 | විනිශ්චයකාරවරයන් සඳහා වන ආර්ථික, සමාජ සහ සංස්කෘතික (ESC) අයිතිවාසිකම් පිළිබඳ නේවාසික වැඩමුළුව | මහාධිකරණ විනිසුරුවරුන් සහ දිසා විනිසුරුවරුන් | 01 | 30 | නැත |
| 9 | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිණිස සහාය දැක්වීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන සහ සංවාදය ඇතුළත්ව විනිශ්චයකාරවරයන් සඳහා ශාස්ත්‍රීය සම්මේලනය | මහාධිකරණ විනිසුරුවරුන් | 01 | 49 | නැත |
| 10 | "2022 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතට අනුගතව අපරාධ පූර්ව-නඩු විභාග කාර්ය පටිපාටිය" පිළිබඳ නේවාසික වැඩමුළුව | මහාධිකරණ විනිසුරුවරුන් | 01 | 38 | නැත |
| 11 | යුරෝපා කවුන්සිලයේ, ව්‍යාප්ත වන පරිගණක අපරාධ පිළිබඳ ගෝලීය ක්‍රියාමාර්ග ව්‍යාපෘතියේ (GLACY+) සහයෝගීතාය ඇතිව, විනිශ්චයකාරවරයන් සහ මහේස්ත්‍රාත්වරුන් සඳහා "බුඩාපෙස්ට් සම්මුතිය (Budapest Convention), පරිගණක අපරාධ සහ විද්‍යුත් සාක්ෂි" පිළිබඳ සංස්කරණ පුහුණු සම්මන්ත්‍රණය | බස්නාහිර පළාතේ මහේස්ත්‍රාත්වරුන් හැර සියළුම පළාත්වල මහේස්ත්‍රාත්වරුන් | 01 | 20 | නැත |
| 12 | යුරෝපා කවුන්සිලයේ, ව්‍යාප්ත වන පරිගණක අපරාධ පිළිබඳ ගෝලීය ක්‍රියාමාර්ග ව්‍යාපෘතියේ (GLACY+) සහයෝගීතාව ඇතිව, මහාධිකරණ විනිසුරුවරුන් සඳහා "බුඩාපෙස්ට් සම්මුතිය (Budapest Convention), පරිගණක අපරාධ සහ විද්‍යුත් සාක්ෂි" පිළිබඳ සංස්කරණ පුහුණු සම්මන්ත්‍රණය | මහාධිකරණ විනිසුරුවරුන් | 01 | 20 | නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහාය දැක්වීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන සහ සංවාදය ඇතුළත්ව විනිශ්චයකාරවරයන් සඳහා ශාස්ත්‍රීය සම්මේලනය | බස්නාහිර පළාතේ අධිකරණ නිලධාරීන් | 01 | 50 | නැත |
| 14 | බන්ධනාගාරවල සිරකරුවන්ගේ තදබදය අඩුකිරීම පිණිස ප්‍රතිකර්ම පියවර සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග: අධිකරණමය ප්‍රතිචාරය | මධ්‍යම පළාතේ, උතුරු මැද පළාතේ, ඌව පළාතේ සහ සබරගමුව පළාතේ මහේස්ත්‍රාත්වරුන් | 01 | 40 | නැත |
| 15 | ඇප ලබාදීම සහ දණ්ඩනය සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන් සඳහා නේවාසික වැඩමුළුව | දකුණු පළාතේ සහ වයඹ පළාතේ අධිකරණ නිලධාරීන් සහ කොළඹ සහ මහනුවර දිස්ත්‍රික්කවල අධිකරණ නිලධාරීන් කිහිප දෙනෙකු | 01 | 50 | නැත |
| 16 | ආර්ථික, සමාජ සහ සංස්කෘතික (ESC) අයිතිවාසිකම් පිළිබඳ වැඩමුළුව | බස්නාහිර පළාතේ, දකුණු පළාතේ සහ සබරගමුව පළාතේ සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන් සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන දකුණු පළාතේ සහ සබරගමුව පළාතේ අධිකරණ නිලධාරීන් | 01 | 34 | නැත |
| 17 | ආර්ථික, සමාජ සහ සංස්කෘතික (ESC) අයිතිවාසිකම් පිළිබඳ වැඩමුළුව | මධ්‍යම පළාතේ, උතුරු මැද පළාතේ, උතුරු පළාතේ, වයඹ පළාතේ, නැගෙනහිර පළතේ සහ ඌව පළාතේ සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන් සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණ නිලධාරීන් | 01 | 36 | නැත |

### 5.3.3 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 17.00 | 9.60 | 56.51% |
| ප්‍රාග්ධන වියදම 110/ 228 | 41.50 | 5.67 | 13.66% |
| එකතුව | **58.50** | **15.27** | **26.10%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 5.4 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

### 5.4.1 හැඳින්වීම

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ ,අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය කළමනාකරණ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන අතර වර්තමාන නිලධාරී මඩුල්ල 36කි. අපරාධයක වින්දිතයන්ගේ හිමිකම් සහ අයිතිවාසිකම් මෙන්ම සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සහ සහාය දීම අධිකාරියේ මූලික කාර්යය භාරය වේ.

### 5.4.2 2022.01.01 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය

#### 5.4.2.1 පැමිණිලි ලැබීම්

2022 ජනවාරි මස සිට සැප්තැම්බර් 30 වන විට අධිකාරියට ලැබුණු පැමිණිලි ගනණ පහතින් දැක්වේ.

| පැමිණිලි/ඉල්ලීම | 2022 ලැබුණු පැමිණිලි ගනණ |
|---|---|
| 1. හිමිකම් සහ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධ | 59 |
| 2. ආරක්ෂාව ලබාගැනීම සඳහා ඉල්ලීම | 71 |
| 3. 8,9 වගන්ති යටතේ වන වැරදි විමර්ශනය සඳහා | 32 |
| 4. සහාය ලබාගැනීම සඳහා ඉල්ලීම් | 08 |
| **අදාල කාලය තුල ලද සමස්ථ පැමිණිලි** | **170** |

**හිමිකම් සහ අයිතිවාසිකම් උල්ලංගනය වීම්**

| | |
|---|---|
| 2021 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගනණ | 62 |
| 2022 වර්ෂය තුල දැනට ලැබී ඇති පැමිණිලි ගනණ | 59 |
| **එකතුව** | **121** |
| විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගනණ | 45 |
| තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගනණ | 76 |

ආරක්ෂාව ලබාගැනීම සඳහා ඉල්ලීම්

| වර්ෂය | පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාවක් ලබා දෙමින් පවතින පැමිණිලි | ආරක්ෂාව ලබා දෙමින් පවතින පැමිණිලි | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | නීතිපති උපදෙස් සඳහා යොමු කරන ලද පැමිණිලි |
|---|---|---|---|---|---|
| පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි | 159 | 27 | 53 | 78 | 01 |
| 2022 සැප්තැම්බර් 30 දක්වා | 71 | 51 | 13 | 07 | - |
| **එකතුව** | **230** | **78** | **66** | **85** | **01** |

**8,9 වගන්ති යටතේ වන වැරදි විමර්ශනය**

| | |
|---|---|
| 2021 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගනණ | 44 |
| 2022 වර්ෂය තුල දැනට ලැබී ඇති පැමිණිලි ගනණ | 32 |
| **එකතුව** | **76** |
| විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගනණ | 30 |
| තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගනණ | 46 |

**2022.01.01** වන දින සිට **2022.09.30** වන දින දක්වා ලැබී ඇති නියෝග

කොමිෂන් සභා නියෝග -02 අධිකරණ නියෝග - 06

| වර්ෂය | අධිකරණ සහ කොමිෂන් සභා නියෝග ගණන | විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග | ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග | අවසන් කරන ලද නියෝග |
|---|---|---|---|---|
| පෙර වර්ෂ වලින්ඉදිරියට ගෙනා නියෝග | 63 | 02 | 20 | 41 |
| 2022 සැප්තැම්බර් 30 දක්වා | 08 | 03 | 05 | - |
| **එකතුව** | **71** | **05** | **25** | **41** |

- ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක ඔස්සේ සාක්ෂි ලබා ගැනීම් 14 ක් 2022 වර්ෂයේදී මේ දක්වා සිදු කරන ලදී.
- අධිකරණ කටයුතු සඳහා සහභාගී වීම වෙනුවෙන් අධිකාරියේ ප්‍රවාහන පහසුකම් යටතේ ආරක්ෂාව ලබා දෙන ලද වින්දිතයන් ගණන 09 වන අතර ඔවුන් හට 2022 වර්ෂයේදී අධිකරණයට යාමට සහ ඒමට ගමන් වාර 29 කදී අවශ්‍ය ආරක්ෂාව ලබා දී ඇත.

### 5.4.3 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**01. යුක්තියට ප්‍රවේශය ජංගම සේවාව - කිලිනොච්චිය සහ යාපනය** (2022 ජනවාරි 26 සිට 30 දක්වා)

**අරමුණු:** එම ප්‍රදේශයේ පුරවැසියන්ට සේවා සැපයීම සහ රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම මෙන්ම මහජනයා දැනුවත් කිරීම
**සහභාගිත්වය:** ගරු අධිකරණ අමාත්‍ය අලි සබ්රි මහතා ඇතුලු මැති ඇමතිවරුන් සහ අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන්, අධිකාරියේ නිලධාරීන්, උතුරු පළාතේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන්
**ස්ථානය:** කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය සහ යාපනය මධ්‍ය මහා විද්‍යාලය

**02. උතුරු මැද පළාතේ පොලිස් ස්ථානවල අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමේ සහ සංවේදී කිරීමේ වැඩසටහන (2022 මාර්තු මස 3 වන සහ 4)**

**අරමුණු:** අපරාධ අංශයේ පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් සහ සංවේදී කිරීම
**සහභාගිත්වය:** උතුරු මැද පළාතේ පොලිස් ස්ථානයන්හි සේවයේ නියතු අපරාධ අංශයේ පොලිස් ස්ථානාධිපතිවරුන්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු කළමණාකරන මණ්ඩලයේ විද්වතුන් සහ නිලධාරීන්
**ස්ථානය:** පොලොන්නරුව සුදු අරලිය හෝටලය

**03. Transparency International-Sri Lanka ආයතනය** සමග එක්ව මහජනයා දැනුවත් කිරීම (2022 මාර්තු 27)

**අරමුණු:** අධිකාරිය සහ එහි සේවාවන් පිලිබඳව මහජනයා දැනුවත් කිරීම
**සහභාගිත්වය:** ඒකල-ජාඇල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නියෝජිතයින් (30), අධිකාරියේ අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති සහ වැඩසටහන්
**ස්ථානය:** ඒකල නව සල්සා ආයතනය

**04. කලුතර පොලිස් විද්‍යාලය සමග ආධුනික පොලිස් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (2022 ජුලි 26 සහ 27)**

**අරමුණු:** පොලිස් නිලධාරීන් දැනුවත් සහ සංවේදී කිරීම
**සහභාගිත්වය:** ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් 218 සඳහා එක් වැඩසටහනක්ද සහ ආධුනික පොලිස් කොස්තාපල්වරු 800, අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ-නීති බලාත්මක, අධිකාරියේ අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති සහ වැඩසටහන්
**ස්ථානය:** කලුතර පොලිස් පුහුණු විද්‍යාලයේ

**05. මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වැඩසටහනක් පැවැත්වීම (**2022 අගෝස්තු මස 6 සහ 7)

**අරමුණු:** අධිකරණ නිලධාරීන් දැනුවත් සහ සංවේදී කිරීම
**සහභාගිත්වය:** බස්නාහිර පලාතේ මහාධිකරණ විනිසුරුවරුන් 40 දෙනකු, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, අධිකාරියේ සභාපතිතුමා සහ කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති සහ වැඩසටහන්
**ස්ථානය:** වාද්දුව බ්ලුවෝටෙර් හොටලයේදී

**06.** **මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් සඳහා වැඩසටහනක් පැවැත්වීම** (2022 අගෝස්තු මස 20 සහ 21)

**අරමුණු:** අධිකරණ නිලධාරීන් දැනුවත් සහ සංවේදී කිරීම
**සහභාගිත්වය:** බස්නාහිර පලාතේ මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ විනිසුරුවරුන් 40 දෙනකු, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, අධිකාරියේ සභාපතිතුමා සහ කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති සහ වැඩසටහන්
**ස්ථානය:** වස්කඩුව සිට්‍රස් හොටලයේදී

**07.** **පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ නවක නිලධාරීන් සඳහා තාක්ෂණික වැඩමුලුවක් පැවැත්වීම** (2022 අගෝස්තු මස 26)

**අරමුණු:** පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ නවක නිලධාරීන් දැනුවත් සහ සංවේදී කිරීම මෙන්ම ඔවුන් දැනට මුහුන දෙන ගැටලු සම්බන්ධව සාකච්ඡා කිරීම
**සහභාගිත්වය:** අධිකාරියට අනුයුක්ත පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ නවක පොලිස් නිලධාරීන් 25 දෙනෙකු, අධිකාරියේ සභාපතිතුමා සහ කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති හා වැඩසටහන් සහ අධ්‍යක්ෂ-නීති බලාත්මක
**ස්ථානය:** බත්තරමුල්ල වෝටර්ස් ඒජ් (Water's Edge) හෝටලයේදී

### 5.4.4 <u>වෙනත් ක්‍රියාකාරකම්</u>

- Zoom තාක්ෂණය භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහනක් අධිකාරියේ නිලධාරීන් 10 උදෙසා 2022 මැයි 26 දින තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත) දී පවත්වන ලදී.
- අධිකාරියේ 2020 වාර්ෂික වාර්තා පිලියෙළ කර අධිකරණ අමාත්‍යාංශය හරහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර එහි පිටපත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
- වින්දිතයන්හට සහය සපයන අන්තර්ජාතික (Victim Support Asia) ආයතනය හා එක්වී ඔවුන්ගේ තරගකාරී වැඩසටහන සමග සම්බන්ධ වී අධිකාරියෙන් සහය අපේක්ශා කරන ලද වින්දිතයන් දෙදෙනකු හට US$1000 (Rs 330,000.00 පමණ) බැගින් එම වින්දිතයන්ගේ වින්දිතභාවය නිසා වූ හානිය අවම කරගැනීමට ආධාර ලබා දෙන ලදී.
- රැකවරණ නිවස සඳහා අවශ්‍ය ගෘහ උපකරණ මිළ දී ගැනීම සිදු කරන ලදී.
- දරන 4 අංක 2015අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 29 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇති අතර 2022.09.30 දින වන විට එය රු. මිලියන 16.09 ක් දක්වා වර්ධනය වී ඇත.

### 5.4.5 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>

| විස්තරය | **2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | **2022.09.30 දිනට වියදම (රු.මි.)** | **2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය** |
|---|---|---|---|
| පුනරාවර්තන වියදමම | 49.47 | 31.24 | 63% |
| ප්‍රාග්ධන වියදම | 7.75 | 1.62 | 21% |
| එකතුව | **57.22** | **32.86** | **57%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 5.5 ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය

### 5.5.1 හැඳින්වීම

**1. ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය (ONUR) ස්ථාපිත කිරීම පිළිබඳ නෛතික ප්‍රතිපාදන**

ජාතික සමගි කාර්යාලය (ONU) අතිගරු ජනාධිපතිතුමන් යටතේ ස්ථාපිත කොට ඇත්තේ 2015 අප්‍රේල් මස 08 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව, ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2015ක් වූ මාර්තු මස 25 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය පදනම් කර ගනිමිනි.

ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය (ONUR) සැලසුම් කොට ඇත්තේ 2015.12.18 වන දින අංක 1945 /41 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යාංශය යටතේ ය.

මේ වන විට මෙම කාර්යාලය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනු ලබයි.

**සංවිධානාත්මක දැක්ම**

සෑම පුරවැසියෙකුට ම ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ දේශපාලනික ස්ථරයන්හි සමාන අවස්ථා උදාකිරීම සහතික කෙරෙන්නා වූ ද විවිධත්වය සහ ජාතික අනන්‍යතාව ගරු කරන්නා වූ ද සියලු ශ්‍රී ලාංකිකයන් සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වන්නා වූ ද ශක්තිමත්, ස්ථාවර, ප්‍රගතිශීලී මෙන්ම සාමය අගයන්නාවූත් ජාතියක් උදෙසා.

**සංවිධානාත්මක මෙහෙවර**

මූලික හිමිකම්, නිදහස, නීතියේ ආධිපත්‍යය, සාමානාත්මතාව හා විවිධත්වය ගරු කරන්නා වූ ද, වාර්ගිකත්වය, භාෂාව, කුලය, වයස, පුමිතිරිබව, ලිංගික දිශානතිය, උපන් ස්ථානය, දේශපාලනික මතිමතාන්තර පිළිබඳ නොසලකා හරිමින් සියලු පුරවැසියන්ට අභිමානයෙන් සහ (වෙනස් කොට සැලකීමකින් තොරව) ගරු කරන සමාජයක් ප්‍රවර්ධනය කිරීම සහ සාක්ෂාත් කිරීම.

**සංවිධානාත්මක පරමාර්ථ**

විවිධ ප්‍රජාවන් තුළ හා ඒවා අතර පවත්නා පීඩනකාරී ස්වභාවයන් සහ ගැටුම් ඇතිකරන ගැටළු විසඳීමට පියවර ගැනීම ට රජයට නිර්දේශ කිරීම හා මෙහෙයවීම.

අවබෝධය, සමගිය සහ එකමුතුබව සියලු ප්‍රජාවන් අතර ගොඩනංවන සංහිඳියාව සඳහා අවැසි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයට අවශ්‍ය සම්පාදනය ලබාදීම සහ නිර්දේශ කිරීම සහ අනතුරුව මෙහෙයවීම.

### 5.5.2 වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**1. ව්‍යාපෘති නාමය:** සමාජ ඒකාබද්ධතාව සඳහා වන අධ්‍යාපනය

අපේක්ෂිත ප්‍රතිඵලය: සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය හරහා සංහිඳියාව සහ සමාජ ඒකාබද්ධතාව ඒකාත්මක කිරීම සඳහා වන ජාතික හා පළාත් මට්ටමේ ඒකාබද්ධ ප්‍රතිපත්තිය

කාර්යසාධන දර්ශක:

(අ) සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන
(ආ) සම්බන්ධ වූ ශිෂ්‍යයන් ගණන

**භෞතික ප්‍රගතිය: 2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා**

| වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රදේශය | ඉලක්ක කණ්ඩායම | සංඛ්‍යාව | අරමුදල් (දේශීය / විදේශීය) | පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන | සිංහල/ දෙමළ භාෂා පාඨමාලාව | දිස්ත්‍රික් 25ම | තරුණ තරුණියන්, පෙරපාසල් ගුරුවරුන් | පාඨමාලා 73 | දේශීය | 11.68 |

**2. ව්‍යාපෘති නාමය:** ගැටුම් පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (අන්තර් විශ්වාසී සංවාදය)

**අපේක්ෂිත ප්‍රතිඵලය:** ගැටුම් පරිවර්තනය කිරීම හරහා ජාතික එකමුතුව සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර් විශ්වාසී සංවාද, අන්තර් - වාර්ගික සහ බුද්ධිමය සංවාද ප්‍රවර්ධනය කිරීම.

**කාර්යසාධන දර්ශක:**

(අ) පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව

(ආ) පුහුණු කරන ලද පුහුණුකරුවන් සංඛ්‍යාව

(ඇ) පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව

(ඈ) පවත්වන ලද අන්තර් සංස්කෘතික සංවාද සංඛ්‍යාව

(ඉ) බිම් මට්ටමෙන් පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව

**භෞතික ප්‍රගතිය: 2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා**

| වැඩසටහන/ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රදේශය | ඉලක්ක කණ්ඩායම | සංඛ්‍යාව | අරමුදල් (දේශීය / විදේශීය) | පිරිවැය (රු.) |
|---|---|---|---|---|---|---|
| ගැටුම් විපරිවර්තන | සංහිදියාව සම්බන්දව නිලධාරීන් පුහුණු කිරිම | අම්පාර, රත්නපුර, මාතර, ගාල්ල, ත්‍රිකුණාමලය, පුත්තලම, කුරුණෑගල, නුවරඑළිය, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වවුනියාව, මුලතිවු, මඩකලපුව දිස්ත්‍රික්ක | රාජ්‍ය නිලධාරීන් | 14 | දේශීය | 143,750.00 |
| | සංහිදියාව සම්බන්දව ප්‍රජාව දැනුවත්කිරීමේ එක්දින වැඩසටහන් | අම්පාර, රත්නපුර, මාතර, ගාල්ල, ත්‍රිකුණාමලය, පුත්තලම, කුරුණෑගල, නුවරඑළිය, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වවුනියාව, මුලතිවු, දිස්ත්‍රික්ක | තරුණ තරුණියන්, ආගමික නායකයන්, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ නායකයන්, කාන්තාවන් | 390 | දේශීය | 8,850,000.00 |
| | ජාතික ඒකාබද්ධතා නිලධාරී ධාරිතා සංවර්ධන වැඩසටහන | යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වවුනියාව, මුලතිවු, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුර, පුත්තලම, මාතලේ, මහනුවර, කෑගල්ල, මොනරාගල, හම්බන්තොට, ගාල්ල, මාතර | ජාතික ඒකාබද්ධතා නිලධාරීන්, ප්‍රජා විශෝධන නිලධාරීන් | 07 | දේශීය/ විදේශීය (USAID SCOR) | 346,767.00 / 6,397,460.00 |
| | ග්‍රාමීය මට්ටමෙන් පෙර දැනුම්දීමේ පද්ධතියක් නිර්මාණය කිරීමේ වැඩසටහනේ පවතින සහජීවන සංගම් ප්‍රජා සංවිධාන පිළිබඳ සමීක්ෂණය | දිස්ත්‍රික් 25 සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රජාව | | | |

**3. ව්‍යාපෘති නාමය:** සංහිඳියාව සඳහා කලාව හා සංස්කෘතිය

අපේක්ෂිත ප්‍රතිඵලය: පවත්නා සංහිඳියා ක්‍රියාවලිය සඳහා මෙවලමක් ලෙස කලාව හා සංස්කෘතිය භාවිතා කිරීම.

කාර්යසාධන දර්ශක: සිදුකරන ලද නිෂ්පාදන සංඛ්‍යාව (චිත්‍රපට, නාට්‍ය, රංග කලාව, චිත්‍ර, සහ කලාව හා සම්බන්ධ නිර්මාණකරණය)

**භෞතික ප්‍රගතිය: 2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා**

**වැඩසටහන-** කලා හා සංස්කෘතික (දේශීය අරමුදල් මගින්)

| ක්‍රියාකාරකම් | ප්‍රදේශය | ඉලක්ක කණ්ඩායම | සංඛ්‍යාව | පිරිවැය (රු) |
|---|---|---|---|---|
| අන්තර් ආගමික සහ සංස්කෘතික උත්සව සහජීවනයෙන් සැමරීම - තෛයිපොංගල් 2022 | සබරගමුව, බස්නාහිර, දකුණ, ඌව, උතුරු මැද පළාත් | පොදු | 10 | 845,588.35 |
| නිදහස් දින සැමරුම් උත්සවය - ශ්‍රී ලංකා ගුවන් විදුලි ඒකාබද්ධ වැඩසටහන | දිවයිනම | පොදු | 1 | 270,000.00 |
| Art for Peace වැඩසටහන | දකුණු පළාත | පාසල් සිසුන් | 1 | 75,100.00 |
| උතුරු දකුණු හුවමාරු වැඩසටහන | උතුරු හා දකුණු පළාත් | පොදු | 1 | 171,400.00 |
| සංහිඳ ගී රස ව්‍යාපෘතිය | දිවයිනම | පොදු | 1 | 1,320,000.00 |
| වසන්තය ඔබයි රූපවාහිණී වැඩසටහන | දිවයිනම | පොදු | 1 | 1,620,000.00 |
| ගුවන්විදුලි වැඩසටහන් | දිවයිනම | පොදු | 1 | 540,000.00 |
| නුවර කලාවිය හා වන්නි සංස්කෘතික හුවමාරු වැඩසටහන | උතුරමැද හා උතුරු පළාත | කලාකරුවන් | 1 | 52,000.00 |
| දොරමඩලාව සංවාදමය වැඩසටහන | දිවයිනම | පොදු | 1 | 540,000.00 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කරනු ලබන කලා හා සංස්කෘතික ව්‍යාපෘති - 3 වන කාර්තුව | හම්බන්තොට, මාතර,බදුල්ල,ගම්පහ,කලුතර දිස්ත්‍රික්ක | පොදු | 5 | 969,030.00 |
| අතැති බිල්පත් ගෙවීම | | | 3 | 465,672.50 |
| | | | **26** | **6,868,790.85** |

**4. ව්‍යාපෘති නාමය:** මාධ්‍ය සහ සන්නිවේදනය

**අපේක්ෂිත ප්‍රතිඵලය:** විවිධ අමාත්‍යාංශ හා ආයතන සමඟ එක්ව ජාතික සමගිය හා සංහිඳියාව සඳහා භාවිතා කරන ලද සන්නිවේදන උපාය මාර්ග සහ මහජන යොමුවීම්.

**කාර්යසාධන දර්ශක;**

(අ) අවබෝධාත්මක උපායමාර්ගික සන්නිවේදන සැලැස්ම ප්‍රවර්ධනය කිරීම
(ආ)අන්තර් ක්‍රියාකාරී වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වේදිකා ස්ථාපිත කිරීම
(ඇ)ජාතික සමගිය සහ සංහිඳයාව ප්‍රවර්ධනය කිරීමට සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ගණන

**භෞතික ප්‍රගතිය: 2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා**

**වැඩසටහන -** මාධ්‍ය සහ සන්නිවේදනය (දේශීය අරමුදල් මගින්)

**ඉලක්ක කණ්ඩායම -** මුලු දිවයිනම ආවරණය වන පරිදි

| ක්‍රියාකාරකම් | ප්‍රදේශය | සංඛ්‍යාව | පිරිවැය (රු) |
|---|---|---|---|
| සංහිඳියාවේ පණිවුඩ සමග දැන්වීම් පුවරු සවිකිරීම | කිලිනොච්චිය, රඹෑව, වවුනියා | 3 | 1,166,666.00 |
| ONUR ආයතනයේ කාර්‍යභාරය විස්තර කරමින් වීඩියෝ පට නිෂ්පාදන සහා එම වීඩියෝ පට වලට සිංහල සහ දෙමළ උපසිරැසි යෙදීම. | යාපනය<br>කිලිනොච්චිය<br>වවුනියාව<br>මුලතිවු<br>මන්නාරම | 1 | 9,900.00 |
| ජාත්‍යන්තර මව් භාෂා දිනය සදහා වාර්ථාමය වැඩසටහන නිෂ්පාදනය හා විකාශන | මුලු දිවයිනටම | 1 | 312,000.00 |
| නිදහස් දිනය සැමරීමට ඒකාන්ගික ටෙලිනාට්‍ය සහ විකාශන වියදම | මුලු දිවයිනටම | 1 | 650,000.00 |
| ප්‍රදර්ශන කුටි සැකසීම. | යාපනය | 1 | 489,000.00 |
| ප්‍රදර්ශන කුටි සැකසීම. | කිලිනොච්චිය | 1 | 489,000.00 |
| ජාතික සමගිය හා ප්‍රතිසංධාන කාර්යාලයේ කාර්‍යභාර්ය ඇතුලත් සිංහල දෙමළ භාෂාවෙන් අත්පත්‍රිකා මුද්‍රණය කිරීම. | මුලු දිවයිනටම | 1000 | 180,000.00 |
| | | | **3,296,566.00** |

**5. ව්‍යාපෘති නාමය**: ආර්ථිකයට යොමුකරවීමේ වැඩසටහන

**අපේක්ෂිත ප්‍රතිඵල:**

(අ) උතුරු, නැගෙනහිර සහ අනෙකුත් පලාත්වල අඩුපහසුකම් යටතේ සහ ගැටුම් වලට යොමුවීමේ ප්‍රවණතාවයක් ඇති ප්‍රදේශ වල ජීවත් වන ජනතාවගේ ජීවනෝපාය සහ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හරහා එම ප්‍රදේශ වල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම තුලින් කල්පවත්නා සාමයක් ගොඩනැංවීම.

**කාර්යසාධන දර්ශක:**

(අ) ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ගණන
(ආ) ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ගණන
(ඇ) ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව

**භෞතික ප්‍රගතිය: 2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා**
**වැඩසටහන-** උතුරු, නැගෙනහිර සහ අනෙකුත් පළාත්වල ආර්ථිකයට යොමුවීමේ වැඩසටහන
ඉලක්ක කණ්ඩායම - සමාජ ගත කල තරුණ තරුණියන් (දේශීය අරමුදල් මගින්)

| ක්‍රියාකාරකම | ප්‍රදේශය | සංඛ්‍යාව | පිරිවැය රුපියල් |
|---|---|---|---|
| උතුර සහ නැගෙනහිර ප්‍රදේශවල සිටින සමාජ ගත කල තරුණ තරුණියන්ගේ සමාජ ආර්ථික සංගණනය | මුලතිව් දිස්ත්‍රික්කය | 2,500 | - |

**6. ව්‍යාපෘති නාමය:** වැසි ජලය එක්රැස් කිරීමේ ව්‍යාපෘතිය (Rain Water Harvesting)

උතුරු ප්‍රදේශයෙහි පවත්නා උග්‍ර පානීය ජල හිඟය සඳහා අන්තර්කාලීන විසඳුමක් ලෙස යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලය එක්රැස් කිරීමේ ඒකක 3000ක් ඉදිකිරීම සඳහා ඉන්දියානු රජය විසින් ලබාදෙන ලද ශ්‍රී ලංකා රුපියල් මිලියන 300ක මූල්‍ය ආධාර මත මෙම ව්‍යාපෘතිය සිදුකරනු ලබයි.එහි පලමු අදියර යටතේ ඉදිකරන ලද වැසි ජලය එක්රැස් කිරීමේ ඒකක 531 මේ වන විට ඉදිකර ජනතාවට ලබාදී ඇත. එහි දෙවැනි අදියරේ මූලික වැඩකටයුතු මේ වන විට ක්‍රියාත්මක සිදුකෙරෙමින් පවතී.

### 5.5.3 <u>වෙනත් ක්‍රියාකාරකම්. (2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා)</u>

- මෙම කාර්යාලය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත සම්පාදනය කිරීම
- ප්‍රතිසන්ධාන පිලිබඳ ප්‍රතිපත්තිය නැවත සලකා බැලීම
- මෙම කාර්යාලයේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීම
- ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයෙන් පැවැත්වූ වාර්ෂික සම්මන්ත්‍රණයේ සංක්ෂිප්ත ග්‍රන්ථ ඇසුරින් තෝරාගත් මාතෘකා කිහිපයක් යටතේ වාර්තාවක්, කැළණිය විශ්ව විද්‍යාලයෙන් සීමාවාසික පුහුණුව සඳහා මෙම කාර්යාලයට අනුයුක්ත කරන ලද විශ්ව විද්‍යාල සිසුන් උපයෝගී කරගෙන සැකසීම
- විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සම්පාදනය කරන ලද එක්සත් ජාතීන්ගේ වාර්ෂික සමාලෝචන වාර්තාව වාර්තාව (UN UPR) සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සම්පාදනය කරන ලද ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.
- අන්තර් මාසික ඒකාබද්ධ රැස්වීම්වලට සහභාගී වීම සහ අඛණ්ඩව අවශ්‍ය තොරතුරු ලබාදීම.
- USAID, SCORE ව්‍යාපෘති සඳහා අවශ්‍ය සිවිල් සමාජ සහයෝගීතාවය සඳහා වන සැලසුම් වැඩමුළු පැවැත්වීම
- බ්‍රිතාන්‍ය කවුන්සිලය සමග භාෂා වැඩසටහන් පැවැත්වීම පිලිබඳව සාකච්ඡා සිදුකිරීම
- යුනෙස්කෝ - අන්තවාදී ක්‍රියා පිටුදැකීමේ (PVE) ජාතික ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය සඳහා දායක වීම.
- ජපන් තානාපති කාර්යාලය සමග ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා සිදුවෙමින් පවතී

### 5.5.4 <u>මූල්‍ය ප්‍රගතිය (රු.මි)</u>

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන | පිරිවැය | ප්‍රගතිය |
|---|---|---|---|
| සමාජ ඒකාබද්ධතාව සඳහා වන අධ්‍යාපනය | 28.40 | 11.68 | 41% |
| ගැටුම් පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය | 59.27 | 13.86 | 23% |
| සංහිඳියාව සඳහා කලාව හා සංස්කෘතිය | 15.5 | 6.86 | 44% |
| මහජන දැනුම්වත් භාවය සහ බලපෑම | 9.50 | 3.40 | 36% |
| ආර්ථිකයට යොමුකරවීමේ වැඩසටහන | 3.00 | - | - |

### 5.5.5 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2022.09.30 දිනට වියදම (රු.මි.) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 29.52 | 18.33 | 62% |
| ප්‍රාග්ධන වියදම | 132.00 | 35.80 | 27% |
| එකතුව | **161.52** | **54.13** | **33%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 5.6 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

### 5.6.1 හැඳින්වීම

2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ පිහිටුවා ඇති අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, ශ්‍රී ලංකා රජය විසින් අතුරුදහන් වීම් සම්බන්ධ වින්දිතයන්ගේ සහ පොදු ජනයාගේ අයිතිවාසිකමක් වන සත්‍ය තොරතුරු දැනගැනීම සහ වගකීම් ආරක්ෂා කිරීම පිණිස ස්ථිර පදනමින් පිහිටුවන ලද, සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව යාන්ත්‍රණයක් වේ. අතුරුදහන් වූවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා විධිවිධාන සැලසීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම කාර්යාලය මෙකී අරමුණ ඉටුකර ගැනීම සඳහා අතුරුදහන් වූවන් පිළිබඳව විමර්ශන පැවැත්වීමට හා එම විමර්ශන අනුව සිදුවන නිර්දේශ අනුව, අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට ආධාර සැපයීමට; අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත ගබඩාවක් පිහිටුවීම සඳහා; පවරා ඇති බලතල සහ කාර්යයන් සඳහා අදාළ වන ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශ සැකසීම සඳහා; පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලසීම සිදු කෙරේ. යම් කිසි පුද්ගලයෙකු අතුරුදහන් වූ කාලසීමාව නොතකා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙයි. ඒ අනුව පනතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව පහත සඳහන් ක්‍රියාමාර්ග මෙම කාර්යාලය මගින් පසුගිය වකවානුව තුළ ගෙන ඇත.

- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ශ්‍රී ලංකාව පුරා මෙතෙක් වාර්තා වූ අතුරුදහන්වීම් සම්බන්ධයෙන් සහ කාලීනව වාර්තා වන අතුරුදහන්වීම් සම්බන්ධයෙන් සක්‍රියව අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම අතුරුදහන්වීම් පිළිබඳ තොරතුරු රැස්කිරීම සහ ඒ අනුව එම සිද්ධි පිළිබඳව සුපරීක්ෂණය හා අතුරුදහන් වූ සිද්ධි නැවත ඇති නොවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග දියත් කිරීම සිදුකරනු ලබයි.
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට ක්‍රියාකරනු ලබයි. ඒ අනුව දැනට සිදුකරමින් පවතින විමර්ශන වලට අදාලවන අතුරුදහන්වීම් තුලින් වින්දිතයන් වූ පවුල් ජීවත් වන ප්‍රදේශ තුලදී මෙම විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.මෙම වසරේ එවැනි විමර්ශන 1,207 සිදුකර ඇති අතර එම විමර්ශන ක්‍රියාවලිය තුලදී එම පවුල් වල අවශ්‍යතාවයන්ද අනුව පහත සඳහන් නිර්දේශ ලබා දී ඇත. එමෙන්ම මෙම වර්ෂයේ ඉදිරි මාස 03 තුල විමර්ශන 2000ක් පමණ පැවැත්වීමටත් 2023 වර්ෂයේ විමර්ශන 5000ක් පැවැත්වීමටත් සැලසුම් කර ඇත. මෙම විමර්ශන ක්‍රියාවලියක් තුළ සහාය අනාවරණය කර ගැනීමේ ක්‍රියාමාර්ගයට අමතරව පහත සඳහන් ආකාරයේ නිර්දේශ ලබාදීමට ක්‍රියාත්මකව ඇත.

  I. අතුරුදහන් වූ පුද්ගලයින්ගේ වින්දිත පවුල් සඳහා පවුල් පුනර්ජීවන ආධාරයන් ලබාදීමට නිර්දේශ කිරීම.
  II. අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධව දක්නට නොමැති සහතිකය, මරණ සහතිකය ලබාදීමට නිර්දේශ කිරීම.
  III. අතුරුදහන් වූ පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා අවශ්‍යතාවයන් අනුව අධ්‍යාපන,වෘත්තීය අධ්‍යාපන,සෞඛ්‍ය පහසුකම්,නිවාස පහසුකම් හා රැකියා සඳහා අවශ්‍යවන මගපෙන්වීම හා සහයෝගය ලබාදීම.
  IV. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් වල සාමාජිකයන් සඳහා මනෝ සාමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- එසේම අතුරුදහන්වීම් සම්බන්ධයෙන් වන විමර්ශන වලදී පාර්ශවකරුවන් වන වින්දිතයින්, සාක්ෂිකරුවන්, සමාජ ක්‍රියාකරුවන්, මාධ්‍යය හසුරුවන්නන් සහ සම්බන්ධිත අනෙකුත් සියලු පාර්ශවයන්ගේ ආරක්ෂාව සහතික කිරීම ඇතුළු ඒ වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.
- තවද අතුරුදහන්වීම් සම්බන්ධයෙන් වන නීතිමය ක්රියාවලීන් වලදී ස්වාධීන පාර්ශවකරුවකු ලෙස හෝ නිරීක්ෂකයෙකු ලෙස අධිකරණයේ පෙනිසිටීම.

### 5.6.2 ප්‍රාදේශීය කාර්යාල තොරතුරු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් වින්දිතයන්ගේ පවුල් වල සාමාජිකයන්ට සිය සේවා ලබාදීමේ ක්‍රියාවලිය පහසුකිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 05ක් දැනට පිහිටුවා ඇත.එම කාර්යාල පහත සඳහන් ස්ථානවල පිහිටා ඇත.

1. යාපනය ප්‍රාදේශීය කාර්යාලය - අංක 123, අඩියපත්නම් පාර, යාපනය.
2. කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය - කරන්චි පාර, කිලිනොච්චිය.
3. මඩකලපු ප්‍රාදේශීය කාර්යාලය - අංක 124, ප්‍රධාන පාර, මඩකලපුව.
4. මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය - අංක 05, දුම්රියපොළ පාර, මන්නාරම.
5. මාතර ප්‍රාදේශීය කාර්යාලය - අංක 54, ධර්මරාම මාවත, මාතර කොටුව, මාතර.

<u>සාමාජික මණ්ඩල රැස්වීම් තොරතුරු</u>

2022 වර්ෂයේ සැප්තැම්බර් 30 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීම් වාර දහ අටක් (18) පවත්වා, අතුරුදහන් වූවන් සොයා ගැනීමේ විමර්ශන ක්‍රියාවලිය වේගවත් කිරීමට සහ වින්දිත පවුල්වල සාමාජිකයින්ට සහන සැලසීම හා සම්බන්ධ තීරණ රැසකට එළඹ ඇත.

<u>පැමිණිලි සංඛ්‍යාව ,ගත් ක්‍රියාමාර්ග හා වර්ෂයේ ප්‍රගතිය</u>

| ලැබුණු මුළු පැමිණිලි ගණන | ගත් ක්‍රියාමාර්ග |
|---|---|
| 21,374 | ලැබුණු මුලු පැමිණිලි අතරින් 3,742ක් ක්‍රියාත්විතයේ දී සිදුව ඇති අතර 2,404ක් විවිධ අවස්ථාවන් වලදී කරන ලද පැමිණිලි සහ 240ක් OMP විෂය පථයට අදාල නොවන බව දත්ත පරිශීලනයේ දී හඳුනාගෙන ඇත. ඒ අනුව 14,988ක් සාමාන්‍ය ජනතාවට අදාල අතුරුදහන්වීම් බව හඳුනාගෙන ඇති අතර එම පැමිණිලි පහත ලෙස වර්ගීකරණය කර, දැනට පැමිණිලි 1,207ක් විමර්ශන කටයුතු අවසන් කර ඇත. |

| සිදුවීම් සිදු වී ඇති කාලය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| වර්ෂ 1980ට පෙර සිදු වී ඇති පැමිණිලි. | 23 |
| වර්ෂ 1981 සහ 1990 අතර සිදු වී ඇති පැමිණිලි. | 5,255 |
| වර්ෂ 1991 සහ 2000 අතර සිදු වී ඇති පැමිණිලි. | 3,440 |
| වර්ෂ 2001ට පසුව සිදු වී ඇති පැමිණිලි. | 6,270 |
| ලැබී ඇති මුලු පැමිණිලි. (සිවිල් අතුරුදහන් වීම්) | 14,988 |

### 5.6.3 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2022.09.30 දිනට වියදම (රු.මි.) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 75.00 | 48.11 | 64.15% |
| ප්‍රාග්ධන වියදම | 0.02 | 0.02 | 79.00% |
| එකතුව | **75.02** | **48.13** | **64.00%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 5.7 හානිපූර්ණ කාර්යාලය

**දැක්ම**

ආර්ථික හා සාමාජීය සෞභාග්‍යවය තුළින් ජාතීන් අතර සංහිඳියා ඇති කිරීම සහ මානව අයිතීන් සුරක්ෂිත කිරීම

**මෙහෙවර**

හානිපූර්ණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම තුළින් පීඩාවට පීඩාවට පත් පාර්ශව බලගන්වමින් සියළු ශ්‍රී ලාංකිකයන්ගේ සුභ සිද්ධිය සහ ආරක්ෂාව උදෙසා ප්‍රතිසන්ධාන ප්‍රවර්ධනය කිරීම

### 5.7.1 හැඳින්වීම

2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත ප්‍රකාරව පිහිටුවා ඇති හානිපූරණය සඳහා වන කාර්යාලයේ මූලික අරමුණ වනුයේ සන්නද්ධ ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස, දේශපාලන නොසන්සුන්තා, සිවිල් කැළඹීම්සහ/ හෝ පවුලේ සාමාජිකයකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්හට ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනංවාලීමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය පිළියම් සහ සහන සැලසීමයි.

ඉහත පනතට අනුව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සම්පාදනය කරන ලද නව ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන් සඳහා 2021 අගෝස්තු මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

(i) ජීවනෝපාය සහාය
(ii) වන්දි සහ මූල්‍යමය සහාය
(iii) ඉඩම් අයිතිය නැවත ලබා දීම
(iv) නිවාසපහසුකම් සැපයීම
(v) ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
(vi) පරිපාලන සහාය
(vii) මනෝසාමාජීය සහාය
(viii) ඒකීය බව, සංහිඳියාව සහ ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා පියවර ඇතුළුව ප්‍රධාන ප්‍රතිපත්ති මැදිහත්වීම් අටක් මෙම නව ප්‍රතිපත්තීන්හි ඇතුළත් වේ.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ සියලුම වැඩසටහන් වින්දිත කේන්ද්‍රය බව මුල් කර ගනිමින් සිදු කරනු ලබන අතර, හානිපූර්ණ ප්‍රතිපත්ති හඳුන්වා දී ඇති ප්‍රධාන මැදිහත්වීම් සිදු කිරීම සඳහා ඒවා ක්‍රියාත්මක කරනු ලබ යි.

### 5.7.2 <u>හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්යයන්</u>

හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්යයන් තේමා ක්ෂේත්‍රයන් 05 ක් යටතේ සිදු කරනු ලබයි

(අ) ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාවට නැංවීම
(ආ) හානිපූරණයන් ප්‍රදානය කිරීම
(ඇ) සංහිඳියාව අරමුණු කරගත් අනෙකුත් යාන්ත්‍රණයන් සමඟ අනුකූලබව තහවුරු කිරීම සඳහා සබඳතා ස්ථාපිත කිරීම
(ඈ) තොරතුරු කලමනාකරණය
(එ) අධීක්ෂණය හා ඇගයීම

### 5.7.3. <u>2022.01.01 සිට 2022.09.30 දක්වා ප්‍රගතිය</u>

**1. ජීවනෝපාය සහාය**

- යාපනය, මුලතිව් සහ පුත්තලම යන ප්‍රදේශවල දැනුම හා තාක්ෂණ හුවමාරු පුහුණු වැඩසටහන් 05 ක් පවත්වන ලදී.
- ඉලක්කගත කණ්ඩායම- කාන්තා ගෘහමූලික පවුල්, සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් (හිටපු සොල්දාදුවන්), අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින්, අවතැන් වූ ප්‍රජාව සහ ගැටුම් හේතුවෙන් ඍජුවම පීඩාවට පත් ගම්වල වෙසෙන තැනැත්තන්
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 300කට වඩා වැඩි
- පසු විපරම් වැඩසටහනක් වශයෙන් යාපනය දිස්ත්‍රික්කයේ නව උත්පාදන අවස්ථා ආරම්භ කිරීමට කාන්තා ව්‍යවසායකයින් 05 දෙනෙකු සඳහා උපකරණ සහාය ලබා දීම.

**2. වන්දි සහ මූල්‍යමය සහාය**

- 2022 වසර තුළ වන්දි සඳහා වෙන් කරනු ලැබූ මුළුමුදල රු. මිලියන 759 ක් වේ.
- සැප්තැම්බර් මස අවසානය දක්වා ගෙවා අවසන් කරනු ලැබූ වන්දි හිමිකම් ගණන - 3088 (ගෙවූ මුදල රු. මිලියන 225.2)
- 2022 සැප්තැම්බර් 30 වන විට ගෙවීම් සඳහා සකසන ලද ලිපි ගොනුවලට අවශ්‍ය මුදල රු. මිලියන 396 (ගෙවීමට ඇති වන්දි හිමිකම් ගණන - 2846)
- ගෙවීමට ඇති ලිපිගොනු ගණන - 6620 (සැකසීමට ඇති -2020 සහ, සකසා අවසන් කරන ලද සහ වැඩිදුර ලේඛන අවශ්‍ය වන්දි හිමිකම් ගණන - 4600)

**3. නිවාස පහසුකම් සැපයීම**

උතුරු පළාතේ අවතැන් වූ ප්‍රජාවට ඇති නිවාස අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් විශේෂ ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී. මෙහිදී යාපනය දිස්ත්‍රික්කයේ විවෘත සුභසාධන කඳවුරුවල වෙසෙන පවුල් නැවත ස්ථානගත කිරීමට අදාල පවතින ගැටළු සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. නැවත පදිංචි කිරීමේ තිරසාර සැලැස්මක් සංවර්ධනය කිරීමට අදාල සාකච්ඡාවන් මේ වන විට පවත්වමින් සිටී.

**4. පරිපාලන සහාය**

2022වසරේ දී හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එක්ව "නීතියට ප්‍රවේශයක්"නම් ජංගම සේවාවක් පවත්වන ලද අතර, මෙහිදී පවුල් 950කට වැඩි ප්‍රමාණයක් මුහුණ පානු ලබන ලේඛන හා සම්බන්ධ ගැටළු සඳහා සහාය ලබා දීමට හැකි විය. තවද, ඉන්දියාවෙන් මෙරටට පැමිණි සරණාගතයින් සඳහා අවශ්‍ය ලේඛන සහාය ලබා දීමට හානිපූරණය සඳහා වන කාර්යාලය, දේශීය සිවිල් සමාජ සංවිධානයක් හා එක්ව කටයුතු කරමින් සිටී.

**5. මනෝ සාමාජීය සහාය**

- 2021 වසර අවසානයේ දී නියමු වැඩසටහන ආරම්භ කරන ලද අතර, 2022 ජුනි වන විට එය අවසන් කරන ලදී
- සිද්ධි කළමනාකරුවන් විසින් මඩකලපුව, කිලිනොච්චිය, අම්පාර, කුරුණෑගල සහ මාතර යන දිස්ත්‍රික්ක පහකින් සිද්ධි 131 ක් කළමනාකරණය කරන ලදී
- අවශ්‍යතා ඇගයීම මත පදනම්ව යොමු කිරීම් සිදු කරනු ලබයි
- මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය මැන බැලීම සහ මෙය නොකඩවා සිදු කරගෙන යෑම සහතික කිරීම සඳහා කාර්යාලය විසින් බාහිර ඇගයීමක් සිදු කරන ලදී
- වැඩසටහන දිගටම ක්‍රියාත්මක කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පුහුණු අත්පොතක් සම්පාදනය කරන ලදී
- මේ වන විට දිස්ත්‍රික්ක 21 ක් නියෝජනය කරමින් සිද්ධි කළමනාකරුවන් 50ක් පුහුණු කර ඇත (සිංහල මාධ්‍ය 24 ක් සහ දමිළ මාධ්‍ය 26 ක්)
- මෙම වැඩසටහන ආයතනගත කිරීම සඳහා ඒ වෙනුවෙන්ම කැප වූ මනෝසාමාජීය ඒකකයක් ස්ථාපිත කිරීමට මේ වන විටත් සැලසුම් කර ඇත.

**6. අතුරුදහන් වූ තැනැත්තන් සඳහා ගෙවනු ලබන විශේෂ දීමනාව**

අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂිත රැස්වීමක් ගරු අමාත්‍යතුමා සමඟ පවත්වන ලදී. ඒ අනුව, හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් තීරණය කරනු ලදුව පහත සඳහන් වෙනස්කම් ඒ සඳහා යෝජනා කරන ලදී.

- දැනට යෝජනා කර ඇති රු. 100,000 ක මුදල රු. 200,000 දක්වා (උතුරු නැගෙනහිර ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන් වෙත ලබා දෙන වන්දි මුදලට සමාන මුදලක්) වැඩි කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම.
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වීම තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් ගැඹුරු විමර්ශනයක් සිදු කරන නිසා, අතුරුදහන් වීමේ සහතිකයෙහි අවශ්‍යතාවය ඉවත් කිරිම

ඉහත යෝජනා සඳහා එකඟතාවය පළ කර සිටි අතර, අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනු ඇත.

**5.7.3.1 මූල්‍යමය ආධාර**

| අනු අංක | වන්දි ක්‍රමය | සංඛ්‍යාව | මුදල (රු.මි) |
|---|---|---|---|
| 1 | ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් හානියට පත් සාමාන්‍ය ජනතාවගේ දේපළ වන්දි ගෙවීම | 2,876 | 194.83 |
| 2 | ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් හානියට පත් රාජ්‍ය සේවකයින්ගේ දේපළ වෙනුවෙන් වන්දි ගෙවීම | 91 | 12.91 |
| 3 | බලවත්සේ විපතට පත්වූවන්ගේ වන්දි ක්‍රමය (ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් තුවාලපත් රාජ්‍ය සේවක සහ සාමාන්‍ය ජනතාව) | 10 | 0.38 |

| | | | |
|---|---|---|---|
| 4 | බලවත්සේ විපතට පත්වූවන්ගේ වන්දි ක්‍රමය (ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියාහේතුවෙන් මරණයට පත් රාජ්‍ය සේවක සහ සාමාන්‍ය ජනතාව) | 36 | 4.50 |
| 5 | පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ඇතිවූ නොසන්සුන්තාවයන් හේතුවෙන් හානියට පත් දේපළ වෙනුවෙන් වන්දි ගෙවීම | 1 | 0.32 |
| 6 | පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ඇතිවූ නොසන්සුන්තාවයන් හේතුවෙන් තුවාල ලැබවන් වෙනුවෙන් වන්දි ගෙවීම | 1 | 0.13 |
| 7 | ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් හානියට පත් පූජනීය ස්ථාන නැවත පිළිසකර කිරීම | 72 | 11.50 |
| 8 | මහනුවර ප්‍රදේශයේ සිදුවූ නොසන්සුන්තාවය හේතුවෙන් හානියට පත් දේපළ සඳහා වන්දි ගෙවීම. | 1 | 0.60 |
| | **එකතුව** | **3088** | **225.26** |

### 5.7.3.2 ණය ලබාදීම

| ණය වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල (රු.මි) |
|---|---|---|
| ස්වයං රැකියා ණය | 27 | 5.95 |
| සමාජගත අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා ණය | 1 | 0.25 |
| නිවාස ණය | 5 | 1.15 |
| **එකතුව** | **33** | **7.35** |

### 5.7.4. <u>2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>

| විස්තරය | **2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | **2022.09.30 දිනට වියදම (රු.මි.)** | **2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය** |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 863.60 | 295.17 | 34.18% |
| ප්‍රාග්ධන වියදම | 2.00 | 0.00 | 0% |
| **එකතුව** | **865.60** | **295.17** | **34%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 06. උපරිමාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාල

## 6.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 6.1.1 <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 17 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබෙන සියළුම ඉල්ලුම් පත්‍ර එම අධිකරණය විසින් විභාග කරනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබාදෙයි.

- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය
- උපදේශක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය
- පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබඳ අධිකරණ බලය

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සඳහා සහාය දක්වන අතර ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ 234 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන සපයයි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රැස්වීම් පිළියෙල කිරීම සහ ඉල්ලීම් දින ගත කිරීම.
- අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට අනුකූලව ප්‍රකාශ වාර්තා ගත කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවා ගැනීම.
- අභියාචනා අධිකරණයෙන් ලැබෙන අභියාචනා නඩුවල පිටපත් සකස් කිරීම නඩු ගාස්තු තක්සේරු කිරීම.

### 6.1.2 2022.01.01 සිට 2022.09.30දක්වා නඩු විසඳීමේ ප්‍රගතිය

| නඩු වර්ගය | 2022.01.01 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | 2022.01.01සිට 2022.09.30දක්වා ගොනුකල නඩු සංඛ්‍යාව | 2022.01.01 සිට 2022.09.30 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2022.01.01 සිට 2022.09.30 දක්වා අවසන් කළ නඩු සංඛ්‍යාව | 2022.09.30 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 1,390 | 318 | 1,708 | 267 | 1,441 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 600 | 276 | 876 | 152 | 724 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | 0 | 57 | 57 | 52 | 5 |
| අභියාචනා නඩු | 1,210 | 118 | 1,328 | 71 | 1,257 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු | 460 | 52 | 512 | 36 | 476 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 190 | 103 | 293 | 59 | 234 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 15 | 4 | 19 | 4 | 15 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1,108 | 265 | 1,373 | 199 | 1,174 |
| ප්‍රතිශෝධන නඩු | 4 | 3 | 7 | 2 | 5 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 0 | 0 | 0 | 0 | 0 |
| විවිධ / විශේෂ නඩු | 15 | 3 | 18 | 2 | 16 |
| SC/Contempt | 3 | 0 | 3 | 0 | 3 |
| RULE | 16 | 7 | 23 | 4 | 19 |
| SC/Contempt | 7 | 0 | 7 | 0 | 7 |
| නෙරපීම් නඩු | 2 | 3 | 5 | 0 | 5 |
| කඩිනම් කරගැනීම් නඩු | 1 | 0 | 1 | 0 | 1 |
| **එකතුව** | **5,021** | **1,209** | **6,230** | **848** | **5,382** |

### 6.1.3 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 180.09 | 132.12 | 73.36% |
| ප්‍රාග්ධන වියදම | 0.81 | 0.12 | 14.44% |
| **එකතුව** | **180.90** | **132.24** | **73.10%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

## 6.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 6.2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණ වල, කම්කරු විනිශ්චය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරණ සාපරාධී කරුණුවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය යෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.

### 6.2.2. 2022.01.01 සිට 2022.09.30 දක්වා නඩු විමසීමේ ප්‍රගතිය

| නඩු වර්ගය | 2022.01.01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2022.01.01-2022.09.30 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2022.09.30 දිනට විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2022.01.01-2022.09.30 දක්වා තීරණය වූ නඩු සංඛ්‍යාව | 2022.09.30 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1,362 | 358 | 1,720 | 342 | 1,378 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 1.047 | 128 | 1,175 | 319 | 856 |
| අද්මිරාල්ති නඩු | 05 | - | 05 | 04 | 01 |
| EXTRADITION (EXT) | 1 | - | 1 | 1 | - |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අභියාචනා | 883 | 142 | 1,025 | 379 | 646 |
| සිවිල් අභියාචනා | 43 | - | 43 | 18 | 25 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 222 | 115 | 337 | 152 | 185 |
| ප්‍රතිශෝධන නඩු අයදුම්පත් | 15 | - | 15 | 10 | 05 |
| අභියාචනයට අවසර ඉල්ලීමේ නඩු | 32 | 06 | 38 | 09 | 29 |
| බදු අභියාචනා (TAX) | 193 | 41 | 234 | 51 | 183 |
| වෙනත් | | | | | |
| මහාධිකරණ ඇප අභියාචනා | 0 | 07 | 07 | - | 07 |
| ඇප අයදුම්පත් | 46 | 71 | 117 | 62 | 55 |
| වක්ෆ් විනිශ්චය සභා අභියාචනා | 05 | 01 | 06 | 03 | 03 |
| ඉඩම් සමාලෝචන මණ්ඩල අභියාචනා | 07 | - | 07 | 02 | 05 |

| | | | | | |
|---|---|---|---|---|---|
| RESTITUTION IN INTERGRUM (RII) | 52 | 19 | 71 | 18 | 53 |
| අධිකරණය අපහාස කිරීමේ නඩු | 37 | 11 | 48 | 07 | 41 |
| නඩු ඇසීමේ අධිකරණය මාරු කිරීමේ ඉල්ලීම් | 09 | 04 | 13 | 13 | - |
| හබයාස් කෝපුස් | 02 | 03 | 05 | 02 | 03 |
| තොරතුරු දැන ගැනීමේ අයිතීන් පිළිබඳ නඩු | 07 | 09 | 16 | 01 | 15 |
| ඉන්ජන්ෂන් නියෝග සහ ඉල්ලීම් | 01 | 05 | 06 | 06 | - |
| මහේස්ත්‍රාත් අධිකරණ ප්‍රතිශෝධන | 09 | 06 | 15 | 02 | 13 |
| විවිධ | 05 | 02 | 07 | 04 | 03 |
| EXPULSION CASES(MIS) | 01 | - | 01 | 01 | - |
| **එකතුව** | **3,984** | **928** | **4,912** | **1,406** | **3,506** |

**6.2.3 <u>2022.01.01 සිට 2022.09.30 දක්වා අනෙකුත් කටයුතුවල ප්‍රගතිය</u>**

අභියාචනාධිකරණයේ නඩු පිළිබඳ දත්ත කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම මඟින් කාර්ය මණ්ඩලයට මෙන්ම නීතිඥ මහත්ම/මහත්මීන්ට ද වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා ගැනීමට හැකිවී ඇත. නඩු වාර්තාව භෞතිකව පරීක්ෂා කිරීමකින් තොරව නඩුවේ ඉදිරි දිනය/පෙර කැඳවන ලද දින හා නඩු වාර්තාවේ කාර්ය සටහන් පරීක්ෂා කිරීමේ පහසුකම් ඒ මඟින් සලස්වා ඇත.

අභියාචනාධිකරණයේ නිල වෙබ් අඩවිය හරහා නඩු කැඳවන දිනය, වේලාව, නඩුවේ පියවර, ඉදිරියට කැඳවීමට නියමිත නඩු පිළිබඳ විස්තර මාර්ගගතව (online) බලා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති අතර නව වෙබ් අඩවිය නුදුරේම දියත් කිරීමට අපේක්ෂිතය.

**6.2.4 <u>කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම අරමුණු කොට අභියාචනාධිකරණ විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉදිරි සැලසුම්</u>**

1. චීන රජයේ මැදිහත්වීම අනුව වර්තමාන උපරිමාධිකරණ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා නියමිත බැවින්, අභියාචනාධිකරණ කාර්යාලය නුදුරේදීම තාවකාලිකව වෙනත් ස්ථානයක (කළුතොට ගොඩනැගිල්ල) ස්ථාපිත කිරීමට යෝජිත බැවින් වර්තමාන ගොඩනැගිල්ලෙ සිට නව ගොඩනැගිල්ල වෙත දත්ත කළමනාකරන පද්ධතියේ සබඳතාවය පවත්වා ගැනීම සඳහා Radio link සබඳතාවයක් ලබා ගැනීම.
2. නඩු වාර්තාවල දත්ත, නඩු දත්ත කළමනාකරණ පද්ධතියට ඇතුළත් කිරීමේ දී වඩා පහසු නිවැරදි හා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම සඳහා තීරු කේත කියවන (Bar Code Readers) අධිකරණයේ සෑම අංශයක් වෙතම ලබාදීම.
3. දත්ත කළමනාකරණ පද්ධිතය වෙත කාර්ය මණ්ඩලයේ සෑම අංශයකම නිලධාරීන් වෙත පහසු ප්‍රවේශයක් ලබාදීම සඳහා නව පරිගණක උපාංග ලබා ගැනීම.

4. සහතික පිටපත් ලබාදීමේ කාර්ය හා නඩු වාර්තාවල පිටපත් සැකසීම අප්‍රමාදීම කරගෙන යාම සඳහා නව තාක්ෂණයෙන් යුතු ජායා පිටපත් යන්ත්‍ර ලබා ගැනීම මෙන්ම අළුත්වැඩියා කිරීම් සම්බන්ධව කටයුතු කිරීම සඳහා ඒ පිළිබඳ දැනුම සහිත තාක්ෂණික නිලධාරී සේව ලබා ගැනීම.

5. අභියාචනාධිකරණයේ ඇතැම් නඩු වර්ග විභාග කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය වී නොමැති බැවින් වෙනත් අධිකරණවල ප්‍රතිපත්ති සම්පාදනය වී ඇතත් ජාතික ලේඛනාගාරක්ෂක දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මහපෙන්වීම මත කැබිනට් අනුමැතියට යටත්ව නඩු වාර්තා විනාශ කිරීම හා සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම මඟින් අධිකරණ පරිශ්‍රයේ ඉඩ පහසුකම් ඉතිරි කර ගැනීමට කටයුතු කිරීම.

6. කාලීන අවශ්‍යතාවය මත කඩදාසි භාවිතය අවම කිරීම විද්‍යුත් මාධ්‍ය හරහා නඩු පැරවීම (E-Filing) මඟින් පරිසර හිතකාමී හා කාර්යක්ෂම සේවයක් ලාබදීම මඟින් යුක්තිය ඉටුකිරීමේ කාර්ය වේගවත් කිරීමට කටයුතු කිරීම.

### 6.2.5 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2022.09.30 දිනට වියදම (රු.මි) | 2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 112.76 | 79.58 | 70.58% |
| ප්‍රාග්ධන වියදම | 1.22 | 0.08 | 6.64% |
| **එකතුව** | **113.98** | **79.66** | **69.89%** |

මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.

# 7. අනෙකුත් ආයතන

## 7.1 නීති විද්‍යාලය

### 7.1.1 හැඳින්වීම

නීති අධ්‍යාපනය පාලනය කිරීම සඳහා 1900 අංක 02 දරණ සංස්ථාගත නීති අධ්‍යාපන සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා නීති විද්‍යාලය ක්‍රියා කරනු ලබයි. සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ සභාපතිත්වය ගරු අගවිනිසුරුතුමා විසින් හොබවන අතර ගරු නීතිපතිතුමා, ගරු සොලිසිටර් ජනරාල්තුමා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අගවිනිසුරුතුමා විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන්ද, ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙකුගෙන් හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සභාව සමන්විත වේ.

ශ්‍රී ලංකා නීති විද්‍යාලය වසර 3 ½ ක පාඨමාලාවක් පවත්වන අතර එක් එක් වසර අවසානයේ හා අප්‍රේල් මාසයේදී පරීක්ෂණ තුනක්, එනම් ප්‍රථම, මධ්‍යම සහ අවසාන වසර සඳහා පවත්වනු ලබයි. එම විභාග සමත්වන අපේක්ෂකයින් නීතිඥයන් ලෙස දිවුරුම්දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලුම් කිරීමට පෙර අවුරුදු 08 ක අවම පළපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු යටතේ මාස 06 ක ආධුනික කාලයක් ගත කිරීම අවශ්‍ය වේ.

මෙම ආයතනය ස්වයං මූල්‍ය සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වේ. එසේම බාහිර කථිකාචාර්යවරුන් ලෙස නීතිඥ වෘත්තියේ යෙදෙන හා වෙනත් ආයතන වල සේවයේ නියුතු අය බඳවා ගැනේ. ඔවුන් ජනාධිපති නීතිඥවරුන් හෝ පළපුරුදු නීතිඥවරුන් වේ.

### 7.1.2 2022.01.01 දින සිට 2022.08.15 දින දක්වා ප්‍රගතිය

- 2021 අප්‍රේල්/ ඔක්තෝබර් විභාගය සඳහා සිසුන් එක්දහස් හාරසිය විසිතුන් (1,423) දෙනෙකු විභාගය සඳහා පෙනී සිටින ලදී. එහිදී සිසුන් අටසිය හතළිස් එක (841) ක් විභාගය සමත්ව ඇත.

- දේශීය හා විදේශීය එල්.එල්.බී. උපාධිධාරීන් එක්දහස් දෙසිය තිස් නව (1239) දෙනෙකු පාඨමාලාව සඳහා බඳවා ගෙන ඇත.

- සිසුන් අටසියය (800) ක් ආධුනික වසර ප්‍රායෝගික පුහුණු වැඩසටහන සම්පූර්ණ කර ඇත.